

# SOGIESC පිළිබඳ හැඳින්වීම

## මොඩියුලය 01

ලිංගික දිශානතිය, සමාජභාවීය අනන්‍යතාව හා ප්‍රකාශනය සහ ලිංගික ලක්ෂණ පිළිබඳ හැඳින්වීම (SOGIESC)

## හැඳින්වීම

මාර්ගෝපදේශන මාලාවේ පළමු වැනි මොඩියුලය මෙය වේ. මේ මඟින් සහභාගීවන්නන් හට ලිංගික දිශානතිය, සමාජභාවය හා සමාජභාවී ප්‍රකාශනය සහ ලිංගික ලක්ෂණ පිළිබඳ (SOGIESC) සංකල්ප හැඳින්වීමක් සිදු කරයි. එමෙන්ම මෙමඟින් සහභාගීවන්නන් තුල විවිධ SOGIESC සහිත පුද්ගලයන් පිළිබඳව ඇති ආකල්ප සහ හරයන් කෙරෙහි බලපෑමක් ඇති කරවයි. මෙම මොඩියුලය කුවියර කාන්තා ව්‍යාපාරයේ යම් සිද්ධීන් සාකච්ඡා කරමින්, ශ්‍රී ලංකාවේ LGBTQ පුද්ගලයන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳව මාධ්‍ය සහ අනෙක් පාර්ශවකරුවන් තුළ ඇති ආකල්ප පිරික්සීමක් සිදු කරයි. තව ද, දවස අවසානයට පෙර මෙම මොඩියුලය මඟින් LGBTQ පුද්ගලයන් විසින් මුහුණපාන වෙනස්කොට සැලකීම් සහ හිංසනයන් පිළිබඳව ජාත්‍යන්තර  සංවර්ධනයන් ඇසුරෙන් සාකච්ඡා කරයි.

මෙම මොඩියුලය තුල දී සන්නිවේදන මාධ්‍යයන් ලෙස Slides, ක්‍රියාකාරකම් හා සාකච්ඡාවන් වැනි ක්‍රම භාවිතයට ගනු ලැබේ. සහභාගිවන්නන් 30 දෙනෙකු පුහුණු කිරිම සඳහා මෙම සැසිය භාවිතා කල හැකිවේ. මෙම මොඩියුලය ක්‍රියාවට නැංවීමට සම්පත් දායකයින් දෙදෙනෙකුගේ සහාය අවශ්‍ය වන අතර, ඒ සඳහා LGBTQ ප්‍රජාවේ සාමාජිකයින් සම්බන්ධ කර ගත හැකි නම් සැසිය වඩා අර්ථවත් හා සාර්ථක කර ගත හැකි වේ.

මෙම මොඩියුලය පුරාවට ශ්‍රී ලංකාව තුල සිටින විවිධ SOGIESC සහිත පුද්ගලයින් සම්බන්ධයෙන් සමාජ, දේශපාලන හා නීතිමය පරිසරය පිළිබඳ සාකච්ඡා කෙරේ. මෙම මොඩියුලය සමරිසි සහකරුවන් අතර ලිංගික ක්‍රියාකාරකම් ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයේ 365 හා 365 අ වගන්ති මඟින් සාපරාධි කිරිමේ බලපෑම ඉස්මතු කරනු ඇත. මෙම මොඩියුලය මඟින් ශ්‍රී ලංකාවේ LGBTQ පුද්ගලයින්ගේ ජීවන අත්දැකිම් කෙරෙහි අවධානය යොමු කරමින් ඉන් සැලකිය යුතු කොටස් උපුටා දක්වන අතර ශ්‍රී ලංකා සිවිල් සමාජ සංවිධාන විසින් ජාත්‍යන්තර මානව හිමිකම් යාන්ත්‍රණ සමඟ සම්බන්ධ වීමට සම්පාදනය කරන ලද ලේඛන පිළිබඳව ද අවධානය යොමු කරයි.



## අන්තර්ජාලය ඔස්සේ පරිශීලනය කරන්න:

මොඩියුල 01 සහ අනෙකුත් ලියකියවිලි සඳහා අන්තර්ජාල ගත මාර්ග ඔස්සේ ප්‍රවේශ වීමට, පහත QR කේතය ස්කෑන් කරන්න:

නැතහොත් ඔබගේ වෙබ් බ්‍රවුසරයේ පහත URL එක ටයිප් කර පිවිසෙන්න:

# www.shorturl.at/ensST

## සැසියේ සැලසුම්

කාලය : පෙ.ව. 09. සිට ප.ව. 5. 00 00 (පැය 6)

| ආරම්භක වේලාව | වෙන් කර ඇති කාලය | සැසිය |
|---|---|---|
| පෙව 09.00 | මිනිත්තු 15 | පිළිගැනීම හා හැඳින්විම |
| පෙව 09.30 | මිනිත්තු 40 | පළමු සැසිය - සමාජභාවීය අනන්‍යතාව හා සමාජභාවී ප්‍රකාශනය පිළිබඳ හැඳින්වීම<br>ක්‍රියාකාරකම් හා සාකච්ඡාව |
| පෙව 10.15 | මිනිත්තු 40 | දෙවන සැසිය : ලිංගික දිශානතියේ විවිධත්වය පිළිබඳ හැඳින්වීම<br>ක්‍රියාකාරකම් හා සාකච්ඡාව |
| | මිනිත්තු 20 | තෙවන සැසිය : ආසියාවේ සමරිසි නීති<br>සිතියමක් ආධාරයෙන් සාකච්ඡාව |
| | මිනිත්තු 20 | සිව්වන සැසිය : පොදු බිය සහ පොදු මිථ්‍යාවන්<br>ප්‍රශ්න මගින් සාකච්ඡාවට පෙළඹවීම |
| පෙව 11.15 | මිනිත්තු 15 | විවේකය |
| පෙව 11.30 | පැය 1 | සැසිය 03 ශ්‍රී ලංකාවේ කුවියර අයිතීන් - කාලරාමුව<br>ක්‍රියාකාරකම් හා සාකච්ඡාව |
| පෙව12.30 | පැය 1 | දහවල් විවේකය |
| පව 1.30 | පැය 1 | සැසිය 04 වැදගත් වන වචන |
| පව 02.00 | මිනිත්තු 30 | සැසිය 05 SOGIESC හි විවිධත්වය සහ ශ්‍රී ලංකාවේ මාධ්‍ය<br>සාකච්ඡාව |
| පව 02.30 | මිනිත්තු 45 | ශ්‍රී ලංකාව තුල විවිධ SOGIES පුද්ගලයින්ට එරෙහිව වෙනස්කම් කිරීම හා ප්‍රචණ්ඩත්වය අවබෝධ කර ගැනීම<br>ඉදිරිපත් කිරීම සහ ප්‍රශ්න හා පිළිතුරු |
| පව 03.45 | මිනිත්තු 15 | විවේකය |
| පව 04.00 | මිනිත්තු 45 | සැසිය 07 විවිධ SOGIESC ඇති පුද්ගලයින්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් ජාත්‍යන්තර වර්ධනයන් |
| පව 04.45 | මිනිත්තු 15 | අවසන් කිරීම හා අදහස් ප්‍රකාශ කිරීම |

# පළමු සැසිය - සමාජභාවීය අනන්‍යතාවයේ විවිධත්වය හා සමාජභාවී ප්‍රකාශනය පිළිබඳ හැඳින්වීම

*ක්‍රියාකාරකම් දෙකකි : තනි පුද්ගල ඉදිරිපත් කිරීම හා තනි පුද්ගල අදහස් බෙදා ගැනීම (ස්ලයිඩ්ස් ආධාරයෙන් සිදු කරන සාකච්ඡාවක් සමගින්)*

## කාලය

මිනිත්තු 40

## ඉලක්ක කණ්ඩායම

සියලුම කණ්ඩායම්

එක් කණ්ඩායමක සාමාජිකයින් 30

## අරමුණ

මෙම සැසිය අවසානයේදී සහභාගිවන්නන් හට;

- උපතේදි පවරා ඇති ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ භාවය අතර වෙනස හඳුනා ගැනීමට
- සමාජභාවීය අනන්‍යතාව හා ප්‍රකාශනයේ විවිධත්වය ප්‍රකාශ කිරීමට
- ලිංගික ලක්ෂණ සහ අන්තර් ලිංගික පුද්ගලයා යන්නෙහි තේරුම නිර්වචනය කිරීමට හැකි වනු ඇත.

## අවශ්‍ය උපාංග

සටහන් පත්‍රිකා හා පෑන්

## සැකසීම

PPT Slides

## පියවර

- මෙම සැසියේදී අප සමාජභාවය සහ ලිංගිකත්වයේ විවිධත්වය ගැන ඉගෙන ගන්නා බව පැහැදිලි කරන්න. මුලින්ම අපි සමාජභාවය ගැන තේරුම් ගැනීමට උත්සාහ කරන බව පැහැදිලි කරන්න.

- ක්‍රියාකාරකම (මිනිත්තු 10): ස්ත්‍රී පුරුෂ මිශ්‍ර වන පරිදි සහභාගිවන්නන් කණ්ඩායම් 4කට බෙදන්න. අර්ධ වෘත්තයක් ආකාරයට රැස්වන ලෙස ඔවුන්ට දන්වන්න.

- පළමු කණ්ඩායමේ පුද්ගලයින් හට පුරුෂයෙකු හා දෙවන කණ්ඩායමේ පුද්ගලයින් හට කාන්තාවක් මෙන් හැසිරෙන ලෙස ආරාධනා කරන්න. තුන්වන කණ්ඩායමට සාමාන්‍යයෙන් පුරුෂයෙක් ප්‍රකාශ කරන දෙයක් පවසන ලෙසත්, සිව්වන කණ්ඩායමට සාමාන්‍යයෙන් කාන්තාවක් ප්‍රකාශ කරන දෙයක් පවසන ලෙසත් ආරාධනා කරන්න. කණ්ඩායමේ සිටින සියලුම දෙනාට එසේ කිරීමට අවස්ථාවක් සලසා දෙන්න.

- ඔවුන් එසේ කල පසු සියලු දෙනා එක්ව ඔවුන් හට අත්පොලොසන් නාදයක් ලබා දීමට කටයුතු කරන්න. ඔවුන් කල කී දෑ මතක තබාගන්න.

- කාන්තාවන් හා පුරුෂයින් සම්බන්ධයෙන් කිසියම් ඒකාකෘති සංකල්පයක් තිබේ නම් ඒ පිළිබඳ සටහන් කරන්න. වචනාර්ථය හෝ ක්‍රියාවන්හි හරය කුමක් වුවත් ඇතැම් පුරුදු කාන්තා හා පිරිමි එක හා සමානව සිදු කරන බව පැහැදිලි කරන්න.

- අප අඳින පළඳින ආකාරය සහ අපගේ හැසිරීම් රටාව, විලාසය, ඇවිදින ආකාරය සහ කතා කරන ආකාරය අපගේ සමාජභාවී ප්‍රකාශනය වන බව පැහැදිලි කරන්න. සමාජභාවය පිළිබඳ අපගේ හැඟීම මත පදනම්ව, අපි ස්ත්‍රී ආකාරයෙන් හෝ පුරුෂ ආකාරයෙන් පෙනී සිටින බව පෙන්වා දෙන්න.

- සමහර විට පුද්ගලයෙකු ස්ත්‍රී හා පුරුෂ යන දෙආකාරයෙන්ම පෙනී සිටියි. මෙයින් අදහස් කරන්නේ ඔවුන්ට පුරුෂ සහ ස්ත්‍රී යන ප්‍රකාශන දෙකේම එකතුවක් ඇති බවයි. සමහර විට ඔවුන්ට ස්ත්‍රී හෝ පුරුෂ ලෙස වර්ගීකරණය කළ නොහැකි හැසිරීම් තිබිය හැක, මෙයින් අදහස් කරන්නේ ඔවුන්ට පිළිබඳ අපැහැදිලි සමාජභාවී ප්‍රකාශනයක් ඇති බවයි.

- ස්ත්‍රී, පුරුෂ, ස්ත්‍රී පුරුෂ යන දෙකෙහිම සම්මිශ්‍රණය සහ අපැහැදිලි යන සියල්ල සමාජභාවය පිළිබඳ ප්‍රකාශන වේ.

- ඉන්පසු සමාජභාවය පිළිබඳ සාකච්ඡා කිරීමට ඉදිරියට යන්න. ඔබට මෙසේ පැවසිය හැකිය: අපි සමාජය ඉදිරියේ අපව ඉදිරිපත් කරන්නේ අප තුළ සමාජභාවය පිළිබඳ ඇති හැඟීම මත පදනම්ව ය. එසේ නම්, අපට මෙම හැඟීම ඇති වන්නේ කෙසේද?


- ක්‍රියාකාරකම (විනාඩි 10) සහභාගීවන්නන් හට මිනිත්තු කිහිපයක් ගත කර ඔවුන් ගැහැණු ළමයෙකු හෝ පිරිමි ළමයෙකු බව ඔවුන් තේරුම් ගත්තේ කවදාද සහ කෙසේද යන්න ලියන්නැයි ඉල්ලා සිටින්න. ඔවුන්ගේ අත්දැකීම් බෙදා ගැනීමට ඉදිරිපත් වන ලෙස සහභාගිවන්නන් කිහිප දෙනෙකුගෙන් ඉල්ලා සිටින්න.

- PPT Slides ආධාරයෙන්, දරුවෙකු ඉපදුණු විට, ලිංගික අවයව මත පදනම්ව සමාජභාවය පිරිමි හෝ ගැහැණු ලෙස පවරන බව පැහැදිලි කරන්න. එවිට සමාජය දරුවාගෙන් බලාපොරොත්තු වන්නේ/ කියන්නේ යම් ආකාරයකට හැසිරෙන ලෙසයි. නිදසුනක් වශයෙන්, ගැහැණු ළමයෙකුට රෝස පැහැති ඇඳුම්, බෝනික්කන්, ඉවුම් පිහුම් කට්ටල, වේශ නිරූපණ කට්ටල සහ කුමාරිකාවන් පිළිබඳ පොත් යනාදිය ලබා දෙයි. පිරිමි ළමයෙකුට නිල් කමිසයක්, ක්‍රිකට් බෝලයක් සහ පිත්තක්, සෙල්ලම් කාර් එකක්, සෙල්ලම් තුවක්කුවක්, සුපිරි වීරයන් පිළිබඳ පොත් ලබා දෙයි. මේ ආකාරයට සමාජය දරුවන්ට සමාජභාවය උගන්වන්නේ ඔවුන් සමාජයේ හැසිරිය යුතු ආකාරයක් ලෙසයි. ස්ත්‍රී පුරුෂ සමාජභාවී භූමිකාවන් යනු මිනිසා විසින් සාදන ලද එසේත් නැත්නම් සමාජමය වශයෙන් ගොඩනගන ලද්දක් ය.

- ඒ සමගම දරුවා ක්‍රමයෙන් වැඩෙද්දී සමාජභාවය සමග තමන්ව හඳුනා ගැනීමට පටන් ගනී. එය තමා පිළිබඳව ඇතිවන ගැඹුරු අභ්‍යන්තර හැඟීමකි. අපි මෙය ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාවය ලෙස හඳුන්වයි. සමහර අවස්ථාවලදී මිනිසුන් තමන්ට උපතේ දී පවරන ලද සමාජභාවය මත පදනම්ව තමන්ගේ ස්ත්‍රී පුරුෂ බව හඳුන්වා දෙයි. එයින් අදහස් කරන්නේ උපතේදී ම පිරිමි දරුවෙකු බවට හඳුන්වා දුන් දරුවෙකු තුළ තමන් පිරිමියෙකු බවට ගැඹුරු හැඟීමක් ඇති බවත්, එබැවින් පිරිමි දරුවෙකු ලෙස හඳුනා ගන්නා බවත් ය. එසේත් නැතිනම් උපතේදී ගැහැණු දරුවෙකු ලෙස හඳුන්වා දුන් දරුවකු තුළ තමන් ගැහැනියක් බවට ගැඹුරු හැඟීමක් ඇති බවත් එනයින් තමන් ගැහැණියක් ලෙස හඳුනා ගන්නා බවත් ය. එවන් පුද්ගලයන් සිස් සමාජභාවී පුද්ගලයන් ලෙස හඳුන්වයි.

- සමහර විට, උපතේදී පිරිමියෙකු ලෙස හඳුන්වා දුන්, පිරිමි ළමයෙකු බව පවසන ලද සහ පිරිමි ළමයෙකු ලෙස හැසිරීමට අපේක්ෂා කරන දරුවෙකුට තමන් ගැහැණු ළමයෙකු බවට ගැඹුරු අභ්‍යන්තර හැඟීමක් ඇති විය හැකිය. ඔවුන් හට ගැහැණු ඇඳුම් ඇඳීමට, වෙනත් ගැහැණු ළමයින් සමඟ සෙල්ලම් කිරීමට සහ සමාජය තුළ ගැහැණු ළමයෙකු ලෙස හැසිරීමට අවශ්‍ය වනු ඇත. ඒ හා සමානව, උපතේදී ගැහැණු ළමයෙකු ලෙස හඳුන්වා දුන් සහ ගැහැණු ළමයෙකු ලෙස සමාජය තුළ හැසිරීමට අපේක්ෂා කරන ගැහැණු ළමයෙකුට ඔවුන් සැබවින්ම පිරිමි ළමයෙකු බවට ගැඹුරු අභ්‍යන්තර හැඟීමක් ඇති විය හැකිය. මෙය මානසික රෝගයක් හෝ විෂමතාවයක් නොවේ. මෙය ස්වභාවිකයි. එවැනි පුද්ගලයෙකුට තම, සමාජභාවය හා සමාජභාවී ප්‍රකාශනය මෙන්ම ලිංගික අවයව පවා වෙනස් කිරීමට 'සංක්‍රාන්තික' ක්‍රියාවලියක් හරහා යා හැකිය. එවැනි සංක්‍රාන්තික ක්‍රියාවලියක් හරහා යාමට කැමති පුද්ගලයෙකු TRANSGENDER පුද්ගලයෙකු ලෙස හඳුනා ගනී.

- උපතේදී පිරිමියෙකු ලෙස නියම කර ඇති, නමුත් තමන් කාන්තාවක් ලෙස හඳුනා ගන්නා සහ කාන්තාවක් බවට පවත්වීමට කැමති පුද්ගලයෙක් සංක්‍රාන්ති සමාජභාවීය කාන්තාවක් හෝ සංක්‍රාන්ති කාන්තාවක් ලෙස හැඳින්වේ. උපතේදීම ගැහැණියක් ලෙස නියම කර ඇති නමුත් අභ්‍යන්තරයෙන් තමන් පිරිමියෙකු බව හැඟෙන සහ පිරිමියෙකු වීමට කැමති



පුද්ගලයෙකු සංක්‍රාන්ති සමාජභාවී පුරුෂයෙකු හෝ සංක්‍රාන්ති පුරුෂයෙක් ලෙස හඳුන්වයි.

- සමාජභාවීය අනන්‍යතාව යනු ගැඹුරු අභ්‍යන්තර හැඟීමකි. ඔවුන්ගේ පෙනුම සහ ඔවුන්ගේ ලිංගික අවයව මගින් මෙය නිවැරදිව නිරූපණය කළ නොහැකි ය.

- අපේ මුල්ම ක්‍රියාකාරකමේදී අපි පිරිමියෙක් සහ ගැහැනියක් ලෙස හැසිරුන ද, ඒවා පමණක් සමාජභාවය වන්නේ නැත. සමාජභාවය පිළිබඳ අර්ථකථනය ස්ත්‍රී හා පුරුෂ යන දෙකොටසට පමණක් සීමා වී ඇති අතර එය නිවැරදි නොවේ. පුද්ගලයෙක් හට තමන්ව ස්ත්‍රී, පුරුෂ, සංක්‍රාන්ති සමාජභාවී පුරුෂ, සංක්‍රාන්ති සමාජභාවී ස්ත්‍රී, සමාජභාවයේ ද්‍රවිත තත්තව, සමාජභාවය ද්විමය නොවන, සමාජභාවය තහවුරු නොවන හෝ කුවියර සමාජභාවී යන ඕනෑම ආකාරයේ පුද්ගලයෙක් ලෙස හඳුන්වා දිය හැක. අවසානයේ සඳහන් කරන ලද සිව් ආකාරයේ අනන්‍යතා ද්විමය නොවන අනන්‍යතා නිසාවෙන් ඒවායේ අදහස සමාන වන අතර පුද්ගලයෙක් තමාගේ අනන්‍යතාවය ප්‍රකාශ කරන ආකාරය මත එහි තේරුම් වෙනස් වේ. සමාජභාවයේ ද්‍රවිත තත්ත්වයක් ඇති පුද්ගලයෙක් යනු සිය සමාජභාවය අස්ථිර හෝ ගලායන, ද්‍රවීය තත්ත්වයේ ඇති පුද්ගලයෙකි. ඔවුන් ඔවුන්ගේ සමාජභාවී අනන්‍යතාවය හා ප්‍රකාශනය වෙනස් ආකාරයෙන් විවිධ කාලවල දී ඉදිරිපත් කරයි. ද්විත්ව සමාජභාවී පුද්ගලයෙක් යනු සිය සමාජභාවය ස්ත්‍රී හෝ පුරුෂ ලෙස හඳුනා නොගන්නා පුද්ගලයන් වේ. සමාජභාවය තහවුරු නොවන පුද්ගලයන් යනු සමාජභාවී භූමිකා හෝ ප්‍රකාශන සමග අනුරූපී නොවන පුද්ගලයන් වේ. කුවියර සමාජභාවී පුද්ගලයෙක් යනු පුරුෂ හෝ ස්ත්‍රී හෝ පුරුෂ හා ස්ත්‍රී යන දෙකෙහිම එකතුවක් හෝ පුරුෂ හා ස්ත්‍රී යන දෙකොටසටම අයත් නොවන පුද්ගලයෙක් වේ. කුවියර සමාජභාවී හෝ ද්විත්ව සමාජභාවී නොවන යන වචන දෙකම, ද්විත්ව සමාජභාවී යන රාමුවෙන් පිටතට වැටෙන යන්න ඇඟවීම සඳහා යොදා ගන්නා පොදු පදයන් වේ.

- ස්ත්‍රී ලක්ෂණ සහ පුරුෂ ලක්ෂණ යනු සන්තතියක පැති දෙක ලෙස තේරුම් ගත හැකිය. පුද්ගලයෙකුට මෙම සන්තතියේ දෙකෙලවරෙහි මෙන්ම ඉන් පිටතද ඕනෑම තැනක සිටගෙන සිටිය හැකිය.

**සටහන**

ඓතිහාසික වශයෙන් සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් දකුණු ආසියානු සංස්කෘතියේ කොටසක් වී ඇති බව පෙන්වා දෙන්න.

රිග්වේදය, මහා භාරතය සහ රාමායනය වැනි වසර 2000-3000කට පමණ පෙර ලියවුනු ඉන්දියානු සංස්කෘතික ග්‍රන්ථ තුන්වන ලිංගයක් පිළිබඳ ලේඛනගත කරයිඃ මහා භාරතය සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයෙකු වන ශිඛණ්ඩි ගැන කියයි. රාමායණයේ, රාම "පිරිමි සහ ගැහැණුට" තමන්ව අනුගමනය නොකරන ලෙස ඉල්ලා සිටින විට, හිජ්රා එලෙසම රැඳී සිට ඔවුන්ට ආශීර්වාද කළේය. හිජ්රා යනු දකුණු ආසියාවේ සමහර සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවන් විසින් ගොඩනගාගන්නා ලද සංස්කෘතික අනන්‍යතාවයකි.

තායිලන්තයේ සහ ශ්‍රී ලංකාව තුළ අනුගමනය කරන ලද බුද්ධාගමේ කෘතියක් වන පාලි ත්‍රිපිටකය, "විවිධ සංක්‍රාන්ති සමාජභාවී රාජ්‍යයන් සහ පුද්ගලයන් - පුරුෂයන් වැනි ස්ත්‍රිය (වේපුරිසිකා), ලිංගික අපැහැදිලි බව (සම්භින්න) - ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයේම ලක්ෂණ සහිත විවිධ වර්ග කිහිපයක් සඳහන් කරයි. (උභතෝයඤ්ඤක)යනාදිය."

සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් වීම ගැන ප්‍රශ්න තිබේදැයි සහභාගිවන්නනන්ගෙන් අසන්න. එසේ ඇසීමට ඉඩ ඇති ප්‍රශ්න කිහිපයක් පහත දක්වා ඇතඃ

- ලංකාවේ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් වීම නීත්‍යානුකූලද?

ඔව්, 2016 දී ශ්‍රී ලංකා රජය විසින් සමාජභාවය වෙනස් කිරීමේ ක්‍රියාවලියක් ස්ථාපිත කරමින් චක්‍රලේඛයක් නිකුත් කළේය. දැන්, ශ්‍රී ලංකාවේ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන්ට තම සැබෑ සමාජභාවය ප්‍රකාශ කිරීම සඳහා ඔවුන්ගේ උප්පැන්න සහතිකය සහ හැඳුනුම්පත වෙනස් කළ හැකිය.

- සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන්ට ලංකාවේදී විවාහ විය හැකිද?

සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් හට තම නිවැරදි සමාජභාවය පෙන්වන හැඳුනුම්පතක් ලැබුණු පසු, ඔවුන්ට විරුද්ධ සමාජභාවී පුද්ගලයෙකු සමග විවාහ විය හැකිය.

- පුද්ගලයෙකු සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් වීමට හේතුව කුමක්ද?

පුද්ගලයෙකු සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් වීමට හේතුවක් සඳහන් නොවේ.

- පුද්ගලයෙකුගේ සමාජභාවය කුමක්දැයි ඔබ දැන ගන්නේ කෙසේද?

පුද්ගලයෙකුගේ සමාජභාවය කුමක්දැයි සොයා ගැනීමට ඇති හොඳම ක්‍රමය වන්නේ ඔවුන්ගෙන් විමසීමයි. ඔවුන්ව හඳුන්වනවාට කැමති සර්වනාමය කුමක්දැයි ඔබටද ඇසිය හැක. ඇය/ඇයට, ඔහු/ඔහුට, සහ ඔවුන්/ඔවුන්ට යනාදිය පුද්ගලයින් තමන්ව ආමන්ත්‍රණය කරනවාට කැමති සර්වනාමය විය හැක.

සමාජභාවය ද්විමය නොවන පුද්ගලයින් සාමාන්‍යයෙන් ඔවුන්/ඔවුන්ට වැනි සර්වනාම තමන්ව හැඳින්වීමට වඩාත් ප්‍රිය සර්වනාම ලෙස භාවිතා කරයි.

<u>ඇතැම් විට, සංක්‍රාන්ති සමාජභාවී වීම, අන්තර්ලිංගික වීම සමඟ ව්‍යාකූල වේ. එබැවින්, ස්ලයිඩ්ස් භාවිතයෙන් සංක්‍රාන්ති සමාජභාවය සහ අන්තර් ලිංගිකත්වය අතර වෙනස පැහැදිලි කරන්න.</u>

- සමහර විට සංක්‍රාන්ති සමාජභාවීය වීම අන්තර් ලිංගික වීම සමඟ පටලවා ගන්නා බව පැහැදිලි කරන්න. මෙම ව්‍යාකූලත්වය සමහර විට අපගේ නීති රාමුව තුළට පවා ඇතුළත් වී බලපෑම් කරන බව පෙන්වා දෙන්න. උදාහරණයක් ලෙස, 2018 පකිස්තානයේ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන්ගේ (අයිතිවාසිකම් සුරැකීමේ) පනත සංක්‍රාන්ති සමාජභාවය නිර්වචනය කිරීමේ දී අන්තර්ලිංගික පුද්ගලයන් ද ඊට ඇතුළත් කර ඇත. මෙය වැරදියි.

- උපතේදීම ලිංගිකත්වය පැවරෙන්නේ බාහිර ව්‍යුහ විද්‍යාව මත පදනම්ව බව අපි දනිමු. මිනිසුන්ට ලිංගිකත්වය හා සම්බන්ධ කායික හා මානසික ලක්ෂණ ඇත. මේවා ලිංගික සහලක්ෂණ හැඳින්වේ. බාහිර ලිංගික අවයව, ප්‍රජනක අවයව, හෝර්මෝන සහ වර්ණදේහ ලිංගික ලක්ෂණ සඳහා උදාහරණ වේ. ලිංගික ලක්ෂණ අනුව අපට පිරිමි සහ ගැහැණු ශරීර හඳුනා ගත හැකිය.

- පිරිමි ශරීරයක් ඇති පුද්ගලයෙකුට ශිෂ්ණයක් සහ වෘෂණ කෝෂ, පුරස්ථි ග්‍රන්ථිය, කූපර් ග්‍රන්ථිය, අපසාහී වාහිනිය, විසර්ජක නාල ආදියෙන් සමන්විත අභ්‍යන්තර ප්‍රජනක පද්ධතියක් ද; XY වර්ණදේහ ද ඇති අතර; මූලික වශයෙන් ටෙස්ටොස්ටෙරෝන් හෝමෝනය ද නිපදවයි. කාන්තා ශරීරයක් ඇති පුද්ගලයෙකුට යෝනි මාර්ගයක් සහ පියයුරු, ඩිම්බ කෝෂ, පැලෝපීය නාල, ගර්භාෂය ආදියෙන් සමන්විත අභ්‍යන්තර ප්‍රජනක පද්ධතියක් ඇත. XX වර්ණදේහ සහ මූලික වශයෙන් ඊස්ට්‍රජන් හෝර්මෝනය නිපදවයි. පිරිමි හෝ කාන්තා සිරුරු වලට ගැලපෙන ලිංගික ලක්ෂණ ඇති එවැනි පුද්ගලයින්ව එන්ඩොසෙක්ස් පුද්ගලයින් ලෙස හඳුන්වයි.

- නමුත් පිරිමි ශරීරය සහ කාන්තා ශරීරය යන නිර්වචනවලට හරියටම නොගැලපෙන ලිංගික ලක්ෂණ ඇති අයද සිටිති. එවැනි ඕනෑම වෙනස්කමක් ඇති පුද්ගලයෙකු අන්තර් ලිංගික පුද්ගලයන් ලෙස හැඳින්වේ.

- අන්තර් ලිංගික සිරුරේ එක් වර්ගයක් නොමැත. අන්තර්ලිංගික යනු ලිංගික පුළුල් පරාසයක විහිදී ගිය, විවිධ වූ ලිංගික ලක්ෂණ වලට අදාළ වන පොදු පදයකි.

***<u>සාරාංශ කිරීම</u>***

*උපතේදී පවරන ලද ලිංගිකභාවය මත පදනම්ව යම් ආකාරයකට ඔබ හැසිරිය යුතු යැයි සමාජය අපේක්ෂා කරන බව සාරාංශ කරන්න. වෙනත් වචන වලින් කිවහොත්, සමාජය ඔබට සමාජභාවී භූමිකාවන්ට අනුගත වීමට උගන්වන බව අපට පැවසිය හැකිය.*

*ඒ අතරම, පුද්ගලයෙකු තම සමාජභාවය පිළිබඳ අවබෝධය පුළුල් කරගනී - එය තම සමාජභාවය පිළිබඳ ගැඹුරු අභ්‍යන්තර හැඟීමකි. සමහර අවස්ථාවල දී කෙනෙකුගේ සමාජභාවය. සමාජ සම්මත ආකාරයේ ලිංගිකභාවය සමඟ නොගැලපේ. එවිට එම පුද්ගලයාට සංක්‍රාන්ති ක්‍රියාවලියක් හරහා තම ශරීරය වෙනස් කිරීමෙන් සිය සැබෑ සමාජභාවී අනන්‍යතාව තහවුරු කර ගත හැක.*

*අප පෙනී සිටින ආකාරයෙන් - එනම් අප අඳින පළඳින ආකාරය සහ අපගේ හැසිරීම් රටාව තුළ, අපි අපගේ සමාජභාව්‍ය ප්‍රකාශ කරමු. මෙය සමාජභාවී ප්‍රකාශනය ලෙස හැඳින්වේ.*

*ස්ත්‍රී පුරුෂ හැරුනු විට වෙනත් සමාජභාවයන් බොහෝ ප්‍රමාණයක් තිබේ. කෙනෙකුගේ සමාජභාවීය අනන්‍යතාව පදනම් වන්නේ ඔවුන් තමන්ගේ සමාජභාවය අර්ථකථනය කරන ආකාරය මතය.*

*අන්තර් ලිංගික පුද්ගලයන් සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයින් සමඟ පටලවා ගත යුතු නැත. අන්තර් ලිංගිකත්වය යනු ලිංගික ලක්ෂණ වන අතර සහ සංක්‍රාන්ති සමාජභාවය යනු සමාජභාවීය අනන්‍යතාවයි.*

*පුද්ගලයෙකුගේ සමාජභාවීය අනන්‍යතාව සහ සමාජභාවී ප්‍රකාශනය එකිනෙකාගෙන් වෙනස්ව තිබියදීත්, සියලු මිනිසුන් සමාන වන අතර සමාන ගෞරවයෙන් හා ගරුත්වයෙන් සැලකිය යුතුය.*

# 02 සැසිය: ලිංගික දිශානතියේ විවිධත්වය පිළිබඳ හැඳින්වීම

**කාලය**

පැය 1 යි

**ඉලක්ක කණ්ඩායම**

සියලුම කණ්ඩායම්
කණ්ඩායමකට සහභාගිවන්නන් 30 ක්

**අරමුණු**

මෙම සැසිය අවසානයේ, සහභාගිවන්නන්ට

- ලිංගික දිශානතිය තුළ හුදු ලිංගික ආකර්ෂණයට වඩා බොහෝ දේ ඇතුළත් වන බව තේරුම් ගැනීමට
- පොදුවේ පිළිගත් ලිංගික දිශානති කිහිපයක් ලැයිස්තුගත කිරීමට

හැකියාව ලැබෙනු ඇත.

**අවශ්‍ය මෙවලම්**

- Post-it notes සහ පෑන්

**සූදානම් වීම**

- Slides
- හිස් අවකාශයක් (බිත්තියක් වැනි) කොටස් තුනකට බෙදා එහි 'චිත්තවේගීය ආකර්ෂණය', 'රෝමාන්තික ආකර්ෂණය', 'ලිංගික ආකර්ෂණය' (මෙම අනුපිළිවෙලින්) යනුවෙන් ලේබල් අලවන්න.

**පියවර**

- මෙම ක්‍රියාකාරකමේදී අපි ආකර්ෂණය ගැන කතා කරන බව පැහැදිලි කරන්න.
- ක්‍රියාකාරකම (විනාඩි 15) සෑම ප්‍රතිචාර දක්වන්නෙකුටම posts-it notes 3 බැගින් ලබා දෙන්න. සහකරුවෙකු වෙත ඇති ආකර්ෂණය චිත්තවේගීය, ආදර සහ ලිංගික ආකර්ෂණය ලෙස පොදුවේ විස්තර කර ඇති බව පැහැදිලි කරන්න. සමහර අර්ථකථනවල අධ්‍යාත්මික ආකර්ෂණය පිළිබඳ අංගයක් ද ඇතුළත් බව සලකන්න. සමහර විට පුද්ගලයෙකු කෙරෙහි ඇති ආකර්ෂණයයේ ප්‍රතිඵලයක් ලෙස ආදරය ඇති විය හැක. ආකර්ෂණයේ මෙම විවිධ පැති ගැන සිතා බැලීමට සහභාගිවන්නන්ට ආරාධනා කර පහත සඳහන් එක් එක් ප්‍රශ්නවලට පිළිතුරු එක් එක් post-it note හි සටහන් කරන ලෙස පවසන්න. ඔවුන් පිළිතුරු ලිවූ පසු, ඔවුන්ට වඩාත්ම අදාළ යැයි සිතන කාණ්ඩය යටතේ post-it note එක බිත්තියේ ඇලවිය හැකිය. සමහර පිළිතුරු වර්ග දෙකක් අතරට වැටිය හැක.
- සහභාගිවන්නන්ට ඔවුන් යමෙකු වෙත ආකර්ෂණය වූ හෝ ඔවුන් ආදරය කළ අවස්ථාවක් සිහිපත් කර මෙම ප්‍රශ්න 3 ට පිළිතුරු දීමට උත්සාහ කිරීමට ආරාධනා කරන්න:
    - ඔබ යමෙකු වෙත ආකර්ෂණය වී ඇති බව ඔබට වැටහුණු විට - ඔබට හැඟුණේ කෙසේද?
    - ඔබට යමෙකු කෙරෙහි ආකර්ෂණයක් ඇති වූ විට ඔවුන් සමඟ කිරීමට ඔබට අවශ්‍ය වූ ක්‍රියාකාරකම් මොනවාද?
    - ඔබ ආකර්ෂණය වූ පුද්ගලයා තුළ වූ කුමක් සඳහා ඔබ ආකර්ෂණය වූයේ ද?
- සෑම කෙනෙකුම ඔවුන්ගේ පිළිතුරු ඇලවූ පසු, පිළිතුරු දෙස සාමූහිකව බලන්න. සමාන පිළිතුරු සහ වෙනස් වූ පිළිතුරු සටහන් කරන්න.

- පිළිතුරු නිවැරදි ගණයට අයත් දැයි සාකච්ඡා කරන්න. නිවැරදි පිළිතුර කුමක්ද යන්න නිර්ණය කිරීම සඳහා තදබල නීති නොමැති අතර, බොහෝ පිළිතුරු වල ආකර්ෂණ වර්ග කිහිපයක් ඇතුළත් වූ සංකලනයක් තිබිය හැක. තේරුම් ගැනීමේ පහසුව සඳහා උදාහරණ සහිත පහත වගුව ඉදිරිපත් කර ඇත

| | **චිත්තවේගීය ආකර්ෂණය** | **රෝමාන්තික ආකර්ශණය** | **ලිංගික ආකර්ෂණය** |
|---|---|---|---|
| | විස්තරඃ<br>චිත්තවේගීය බැඳීමක් ඇත. ඔබට ඔවුන් සමඟ බැඳීමක් දැනේ. ඔවුන් සමඟ ඔබේ අදහස් බෙදා ගැනීමට තරම් ආරක්ෂිත බවක් දැනේ. එකිනෙකා තේරුම් ගන්නා බවට ඔබට හැඟේ. | විස්තරඃ<br>චිත්තවේගීය සම්බන්ධතාවයෙන් ඔබ්බට ගිය ගැඹුරු ආදරයක් ඇත. මෙය බොහෝ විට එම අවස්ථාවේ දී, සමහර විට ජීවිත කාලයම ගත කිරීමට ඇති ආශාව සමඟ සම්බන්ධ වේ. | විස්තරඃ<br>ඔබට පුද්ගලයා කෙරෙහි ලිංගික ආශාවක් දැනේ. |
| ඔබ යමෙකු වෙත ආකර්ෂණය වන බව ඔබට වැටහුණු විට - ඔබට හැඟුණේ කෙසේද? | **උදාහරණඃ**<br>සතුටු<br>ආරක්ෂිතයි<br>විශ්වාසයි | **උදාහරණඃ**<br>ඔවුන් සමඟ කාලය ගත කිරීමට අවශ්‍ය බව දැනීම<br>ආදරය දැනීම<br>ඔවුන්ව සතුටෙන් තැබිය යුතු බව දැනීම | **උදාහරණඃ**<br>ඔවුන්ව ස්පර්ශ කිරීමට හා සිප ගැනීමට ආශාවක් ඇතිවීම.<br>ඔවුන් 'සරාගී/ ආකර්ෂණීය' බව හැඟීම. |
| ඔබට යමෙකු කෙරෙහි ආකර්ෂණයක් ඇති වූ විට ඔවුන් සමඟ කිරීමට ඔබට අවශ්‍ය වූ ක්‍රියාකාරකම් මොනවාද? | **උදාහරණඃ**<br>ඔවුන් සමඟ කතා කිරීම<br>ඔවුන්ට සවන් දීම<br>ඔබේ දවස ගැන ඔවුන්ට පැවසීම | **උදාහරණඃ**<br>අත් පටලා ගෙන යාම.<br>චිත්‍රපටියක් නැරඹීමට හෝ /කෝපි කෝප්පයක් පානය කිරීමට යාම.<br>ඔවුන්ව හමුවීම. | **උදාහරණඃ**<br>සිප ගැනීම<br>ලිංගිකව හැසිරීම |
| ඔබ ආකර්ෂණය වූ පුද්ගලයා තුළ වූ කුමක් සඳහා ඔබ ආකර්ෂණය වූයේ ද? | **උදාහරණඃ**<br>කරුණාව<br>හොඳ සවන්දෙන්නෙක් වීම<br>දයාබර වීම / ආදරණීය වීම | **උදාහරණඃ**<br>දරා ගැනීමේ හැකියාව / නොපසුබට උත්සාහය<br>ස්ථාවරත්වය<br>ශක්තිමත් චරිතයක් වීම | **උදාහරණඃ**<br>ඔවුන්ගේ ශරීරය<br>ඔවුන්ගේ අදහස් ප්‍රකාශනය / හැසිරීම |

- එක් ආකාරයක ආකර්ෂණයක් අනෙකකින් තොරව පැවතිය හැකි බවත් එය පුද්ගලික අත්දැකීමක් බවත් සලකන්න. නිදසුනක් වශයෙන්, යමෙකු පුද්ගලයෙකුට ලිංගිකව පමණක් ආකර්ෂණය විය හැකි නමුත් චිත්තවේගීව හෝ රෝමාන්තික හැඟීමකින් ඔවුන් වෙත ආකර්ෂණය නොවිය හැක. සමහර පුද්ගලයන් ලිංගිකව ආකර්ෂණය වන්නේ නැත. කිසියම් පුද්ගලයෙකු කෙරෙහි ලිංගික ආකර්ෂණයක් නොමැති අය අලිංගික (asexual) පුද්ගලයෙකු ලෙස හඳුනාගත හැකිය. කෙසේ වෙතත්, සමහර අලිංගික පුද්ගලයන් චිත්තවේගී / රෝමාන්තික ආකර්ෂණය අත්විඳිති.

- චිත්තවේගී, රෝමාන්තික සහ ලිංගික ආකර්ෂණය කුමක්දැයි අප දැන් තේරුම් ගෙන ඇති බැවින්, මෙම ආකර්ෂණයට ලක්වන පුද්ගලයා සහ ඔවුන්ගේ සමාජභාවය දෙස බැලීමට කාලය පැමිණ ඇති බව පැහැදිලි කරන්න.

- PPT Slides භාවිතා කරමින්, ලිංගික දිශානතිය යන්න චිත්තවේගීය, රෝමාන්තික සහ ලිංගික ආකර්ෂණය සමඟ අවබෝධ කරගත යුතු බව පැහැදිලි කරන්න. ආකර්ෂණයට ලක්වන පුද්ගලයාගේ සමාජභාවය මත පදනම්ව, ලිංගික දිශානතිය හඳුනාගත හැකිය.

- ලිංගික දිශානතිය පිළිබඳ අපගේ අවබෝධය තවමත් වර්ධනය වෙමින් පවතී. අපගේ වර්තමාන අවබෝධයට අනුව, විෂම රිසිභාවය, සමරිසිභාවය, ද්විරිසිභාවය, සර්ව රිසිභාවය සහ අලිංගිකත්වය ලෙස ලිංගික දිශානතීන් 5ක් හඳුනාගත හැකිය.

සටහන්

**විෂමරිසි භාවය:** වෙනස් ලිංගයක පුද්ගලයන් කෙරෙහි ප්‍රධාන වශයෙන් හෝ මුළුමනින් ම ඇතිවන, දිගුකාලීනව පවත්නා චිත්තවේගීය, රෝමාන්තික හෝ ලිංගික ආකර්ෂණය. නිදසුනක් වශයෙන්, කාන්තාවන්ට ආකර්ෂණය වන පිරිමින්. මෙම ලිංගික දිශානතිය සාමාන්‍යයෙන් සෘජු" ලෙස හැඳින්වේ.

**සමරිසි භාවය:** ප්‍රධාන වශයෙන් හෝ මුළුමනින් ම එකම ලිංගයේ පුද්ගලයන්ට පවතින චිත්තවේගීය, රෝමාන්තික හෝ ලිංගික ආකර්ෂණය. සමරිසි ආකර්ෂණය අත්විඳින පුද්ගලයින් තමන් "සමරිසි පිරිමි", "සමරිසි කාන්තා", "කුවියර හෝ "සමරිසි ආකර්ෂණය ඇති පුද්ගලයින්" ලෙස හඳුනාගත හැකිය.

**ද්විරිසි භාවය:** ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේම පුද්ගලයන් කෙරෙහි පවතින චිත්තවේගීය, රෝමාන්තික හෝ ලිංගික ආකර්ෂණය. නිදසුනක් වශයෙන්, පිරිමින්ට හා කාන්තාවන්ට ආකර්ෂණය වන පිරිමින්.


**සර්ව රිසි භාවය:** ඔවුන්ගේ සමාජභාවය නොසලකා මිනිසුන්ට චිත්තවේගීය, රෝමාන්තික හෝ ලිංගික ආකර්ෂණය. නිදසුනක් වශයෙන් පුරුෂයෙක්ට, ස්ත්‍රියකට, සංක්‍රාන්ති සමාජභාවී ස්ත්‍රියකට, සංක්‍රාන්ති සමාජභාවී පුරුෂයෙකුට හෝ ස්ත්‍රී පුරුෂ භාවය ද්විමය නොවන පුද්ගලයෙකුට ආකර්ෂණය විය හැකිය.

**අලිංගික භාවය:** දිගු කාලීනව ලිංගිකව ආකර්ෂණයක් පුද්ගලයෙක් කෙරෙහි ඇති නොවීම. එවැනි ලිංගික ආකර්ෂණයක් අත්විඳිය නොහැකි පුද්ගලයින් "අලිංගික" හෝ "ඒස්" ලෙස හඳුනා ගත හැකිය. ලිංගික ආකර්ෂණය නොමැතිකම යනු චිත්තවේගීය සහ/හෝ රෝමාන්තික ආකර්ෂණය වැනි වෙනත් ආකාරයේ ආකර්ෂණයන් නොමැතිකම නොවේ. අලිංගිකභාවී පුද්ගලයන් කිසිවිටෙක ලිංගිකව හැසිරෙන්නේ නැති බව හෝ කිසිවිටක එයින් සතුටක් විඳින්නේ නැත යන්න ද එයින් අදහස් නොවේ.

- මෙතෙක් සාකච්ඡා කර ඇති දේ පිළිබඳව කිසියම් ප්‍රශ්නයක් ඇති ද යන්න සහභාගිවන්නන්ගෙන් විමසා ඔවුන්ගේ ගැටළු විසඳන්න. ඇසිය හැකි සමහර ප්‍රශ්න සහ ඊට අදාළ පිළිතුරු සැසි 04( පොදු බිය සහ පොදු මිථ්‍යාවන් තුළ සොයා ගත හැක.

<u>සාරාංශය</u>

සමාජභාවී පුද්ගලයාගේ රූපය භාවිතා කරමින්, පෙර සැසියේ දී සාකච්ඡා කළ පරිදි, ස්ත්‍රී පුරුෂ සමාජභාවී ප්‍රකාශනය යනු ඔබ ඔබවම ඉදිරිපත් කරන ආකාරය බව සාරාංශ කරන්න. එය ඔබ බාහිරව පෙනෙන ආකාරය, ඔබ අඳින පළඳින ආකාරය, ඔබ හැසිරෙන ආකාරය, ඔබේ හැසිරීම් රටාව ආදියයි. ඔබේ සමාජභාවීය අනන්‍යතාව යනු ඔබ ඔබේ සමාජභාවය ගැඹුරින් සහ අභ්‍යන්තරව තේරුම් ගන්නා ආකාරයයි. එය සමාජභාවය පිළිබඳ කෙනෙකුගේම අවබෝධයකි. එය ඔබගේ බාහිර ලිංගික අවයව මත පදනම් වූ උපතේදී පවරන ලද ලිංගිකත්වයට වඩා වෙනස් විය හැකිය -එය ලිංගික ලක්ෂණයකි. ලිංගික දිශානතිය යනු ඔබ චිත්තවේගීයව, රෝමාන්තිකව සහ ලිංගිකව ආකර්ෂණය වන්නේ කවුරුන් වෙතද යන්නයි. ඔබේ ලිංගික දිශානතිය තීරණය කරන්නේ ඔවුන්ගේ සමාජභාවයයි



| ප්‍රධාන පදය | අර්ථ දැක්වීම | උදාහරණ හෝ වර්ගීකරණය |
|---|---|---|
| **ලිංගිකත්වය** | උපතේදී පවරා ඇත | පිරිමි හා ගැහැණු |
| **ලිංගික ලක්ෂණ** | කායික හා ව්‍යුහ විද්‍යාත්මක සංයුතිය | අන්තර්ලිංගික, එන්ඩෝසෙක්ස් |
| **සමාජභාවීය අනන්‍යතාවය** | ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිළිබඳ ගැඹුරු අභ්‍යන්තර හැඟීම | පුරුෂයා, ස්ත්‍රිය, සංක්‍රාන්ති සමාජභාවී පුරුෂයා, සංක්‍රාන්ති සමාජභාවී ස්ත්‍රිය, කුවියර් සමාජභාවය, ද්‍රවිත සමාජභාවය, ද්විමය නොවන සමාජභාවය, සමාජභාවය තහවුරු නොකරන ලද |
| **සමාජභාවීය සමාජභාවී ප්‍රකාශනය** | පුද්ගලයෙකු පෙනී සිටින ආකාරය | ස්ත්‍රී, පුරුෂ, ඇන්ඩ්‍රොජිනස්, අපැහැදිලි |
| **ලිංගික දිශානතිය** | 'චිත්තවේගීය, 'රෝමාන්තික සහ ලිංගික ආකර්ෂණය | සමරිසි, ද්විරිසි, විෂමරිසි, සර්වරිසි, අලිංගික |

මානව සමාජභාවීය සහ ලිංගිකත්වයේ සියලුම අංග වර්ණාවලියක් මත සිදු වේ. SOGIESC යනු හුදු ද්විමය නොවේ. මෙම විවිධත්වයට හේතුව කුමක්දැයි හරියටම නොදනී. එය ජීව විද්‍යාත්මක හා පාරිසරික සාධකවල ප්‍රතිඵලයකි. මෙය මානව වර්ගයාගේ විවිධත්වයයි.

සමාජභාවීය අනන්‍යතාවය සහ ලිංගික දිශානතිය අනිවාර්යයෙන්ම නිශ්චිත නොවන අතර කාලයත් සමඟ වෙනස් විය හැක. කෙසේ වෙතත්, ඔබේ ලිංගික දිශානතිය පුද්ගලික කාරණයකි; එය බලයෙන් හෝ බාහිර පීඩනයෙන් වෙනස් කළ නොහැක.

මනුෂ්‍යයන් ඔවුන්ගේ සියලු විවිධත්වයන් තුළ වුව ද සමාන වන අතර සමාන පිළිගැනීම හා ගෞරවය ලැබිය යුතුය.

# සැසිය 03 ආසියාවේ සමරිසි නීති

*සමරිසිභාවය පිළිබඳ රටවල නීතිමය තත්ත්වය නිරූපනය කරන සිතියමක් ආධාරයෙන් සිදු කරන සාකච්ඡාවක්*

**කාලය**

විනාඩි 20 ක්

**ඉලක්ක කණ්ඩායම**

සියලුම කණ්ඩායම්
කණ්ඩායමකට සහභාගිවන්නන් 30 ක්

**අරමුණු**

මෙම සැසිය අවසානයේ, සහභාගිවන්නන්ට

- සමරිසි ක්‍රියාකාරකම් අපරාධකරණයේ යටත් විජිත සම්භවය තේරුම් ගැනීමට
- සමරිසි සහකරුවන් අතර සිදුවන ලිංගික ක්‍රියා සම්බන්ධයෙන් ලිබරල් නීති පවතින රටවල් හඳුනා ගැනීමට
- රටවල නෛතික රාමු නිරන්තරයෙන් විකාශනය වන බවත්, ඒ පිළිබඳ කතා කිරීම හා ඒ වෙනුවෙන් පෙනී සිටීම හරහා නීති වෙනස් කිරීමට අවස්ථා ඇති බවත් තේරුම් ගැනීමට හැකි වනු ඇත.

**සකස් කිරීම**

- PPT Slides
- පහත දක්වා ඇති සිතියමේ ඉහළ විභේදනයක් සහිත රූපයක් මෙම සබැඳියෙන් බාගන්න

  https://ilga.org/maps-sexual-orientation-laws

**සම්පත් දායකයා වෙත සටහන**

04 වැනි සැසියේ පළමු පියවර ආරම්භ කිරීම සලකා බලන්න: මෙම සැසිය ආරම්භ කිරීමට පෙර පොදු බිය සහ පොදු මිථ්‍යාවන්, මේ අනුව සම සම්පත් දායකයාට සහභාගිවන්නන්ගෙන් ප්‍රශ්න වර්ග කිරීමට සහ කෙටියෙන් සූදානම් වීමට කාලය ලබා දේ.

**පියවර**

ලිංගික සුළුතරයන් අපරාධකරණය කිරීම සැබවින් ම යටත් විජිත උරුමයේ කොටසක් බව පැහැදිලි කරන්න. බ්‍රිතාන්‍ය පාලන සමයේදී, වික්ටෝරියානු දෘෂ්ටිවාදය දේශීය නීති රාමු තුළට විවිධ ආකාරවලින් ඇතුළු කරන ලද අතර, අස්වාභාවික ලිංගිකත්වය අපරාධකරණය කිරීම ඉන් එක් ආකාරයකි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, දණ්ඩ නීති සංග්‍රහයේ (1883) 365 සහ 365 ඒ යන වගන්ති හරහා ශ්‍රී ලංකාව තුළ සමරිසි ලිංගික ක්‍රියාකාරකම් තවමත් අපරාධයක් ලෙස පවතී. මෙම නීතිය මොඩියුල 03 හි විස්තරාත්මකව සාකච්ඡා කෙරේ.

- යටත් විජිතකරණයට පෙර සමරිසි සේවනය අපරාධකරණය කිරීම පිළිබඳ සඳහනක් ඉතිහාසයේ නොමැත. එය බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේ යුදෙව්- ක්‍රිස්තියානි හරයන් සියලුම යටත් විජිතවලට ආරෝපණය කිරීම හා එමගින් එම රටවල්වල නෛතික පරිසරය වෙනස් කිරීමේ ක්‍රියාවලියේ ප්‍රතිඵලයකි. කෙසේ නමුත් මෙම නීති දකුණු ආසියාතික රටවල්වල ආගමික හරයන් සමඟ මිශ්‍ර විය. එබැවින් බ්‍රිතාන්‍යයන් විසින්ම 1967 දී සමරිසි සේවනය තවදුරටත් අපරාධයක් ලෙස නොසලකා හැරීමට තීරණය කළද, දේශීය සංස්කෘතික හරයන් හා වටිනාකම් නාමයෙන් තවමත් දකුණු ආසියාතික රටවල සමරිසි සේවනය අපරාධයක් සේ සැලකේ.

- බොහෝ පශ්චාත් යටත් විජිත ප්‍රාන්තවල, විශේෂයෙන්ම බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට අයත්ව තිබූ රටවල්වල, සමරිසිභාවය බටහිර සංකල්පයක් ලෙස නිරූපණය කර ඇත. ඒ අතරම, ලිංගික සුළුතරයන්ගේ අයිතිවාසිකම් ඇතුළු මානව හිමිකම් දේශීය සම්ප්‍රදායන් සහ සංස්කෘතිය මත පැටවීම් ලෙස සැලකේ.

- කුවියර සමාජභාවී මිනිසුන්ට සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීමට බාධාවක් වන දකුණු ආසියාවේ සංස්කෘතික භාවිතයන් සහ වටිනාකම් මොනවාදැයි සහභාගිවන්නන්ගෙන් විමසන්න. සමහර කරුණු පහත දැක්වේ.
    - ප්‍රජා අනන්‍යතාවය ශක්තිමත් වේ. මිනිසුන් තනි පුද්ගලයන් ලෙස නොව ප්‍රජාවක කොටසක් ලෙස දකියි. මිනිසුන් තම ඥාතීන්ගේ හෝ ප්‍රජාවන්ගේ මත පිලිබඳ සවිඥ්ඥානික ය.
    - විවාහය සහ දරුවන් ලැබීම සමාජ තත්ත්වය හා සම්බන්ධ වේ. ස්ත්‍රී හා පුරුෂ පරමාදර්ශ දෙකම මාතෘත්වය සහ පීතෘත්වය වටා ගෙතී ඇත.
    - විවාහය තෝරා ගැනීමකට වඩා දෙමාපියන් හට කෙරෙන යුතුකමක් ලෙස සැලකේ.
    - ලිංගිකත්වය රහසක් ලෙස හෝ තහනම් දෙයක් ලෙස සලකනු ලැබේ. පාසල්වල ඵලදායී ලිංගික අධ්‍යාපනයක් නොමැත. ප්‍රජනනය සඳහා හැර ලිංගිකව එක්වන පුද්ගලයින් (සමරිසි යුවල වැනි) කාමුක, සල්ලාල හෝ අශිෂ්ට ලෙස සැලකේ.
    - දකුණු ආසියාතික දේශපාලන වේදිකාව ජාතිකවාදී දේශපාලනයෙන් ආධිපත්‍යය දරයි. ජාතිකවාදී දේශපාලනය බොහෝ විට තම මතවාදයන් ශක්තිමත් කිරීම සඳහා සාම්ප්‍රදායික සහ අනුකූල සාරධර්ම භාවිතා කරයි. ලිබරල් සහ සමාජයේ පිළිගත් මතයන්ට නොගැලපෙන අදහස් ප්‍රතික්ෂේප කෙරේ.
    - මානව හිමිකම්වලට ගරු නොකිරීම ද සාධකයකි. මානව හිමිකම් බටහිර සංකල්පයක් ලෙස සැලකේ. මානව හිමිකම් ආරක්ෂා කරන සහ ප්‍රවර්ධනය කරන ශක්තිමත් කලාපීය සහයෝගීතාවයක් (යුරෝපීය සංගමය වැනි) නොමැත.
    - ප්‍රධාන ආගම් ආසියාවේ ආරම්භ වූ අතර මිනිසුන් විසින් දැඩි ලෙස ආගමික මතවාද හා ඒ හා සබැඳි ආගමික වටිනාකම් දරයි. සමහර අවස්ථාවල දී ආගමික වටිනාකම් නිදහසට කරුණක් ලෙස භාවිතා කරමින් කුවියර සමාජභාවී මිනිසුන්ට සමානාත්මතාවයට ඇති අයිතිය කප්පාදු කරයි.


- පොදුරාජ්‍ය මණ්ඩලයේ රටවල් 53 න් 36 ක සමරිභාවය සාපරාධී ලෙස සලකන නීති ඇත. කෙසේ වෙතත්, ලොව පුරා සමානාත්මතාවය සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් දක්නට ලැබේ. මේ වන විට ලෝකයේ රටවල් 28ක් සමරිසි විවාහ පිළිගෙන ඇති අතර තවත් රටවල් 34ක් සමරිසි යුවල සඳහා යම් හවුල්කාරිත්ව පිළිගැනීමක් ලබා දේ. 2020 දෙසැම්බර් වන විට, රටවල් 81කට ලිංගික දිශානතිය පදනම් කරගෙන රැකියා ස්ථානයේ වෙනස් කොට සැලකීමට එරෙහිව නීති තිබුණි. මීට වසර විස්සකට පෙර සිටියේ එවැනි රටවල් 15 ක් පමණි.

- සහභාගිවන්නන් මෙම සිතියමේ (Slides) රූපය වෙත ගෙන ගොස් ආසියානු රටවල්වල නීතිමය සන්දර්භය සටහන් කරන්න. සමරිසිභාවය අපරාධකරණය නොකළ සහ සමරිසි විවාහ සහ හවුල්කාරිත්වයන් පිළිගෙන ඇති රටවල් සැලකිල්ලට ගන්න. සමරිසි ලිංගික ක්‍රියාකාරකම් අපරාධ ලෙස සලකන රටවල් ද සැලකිල්ලට ගන්න. සිතියමේ අධි-විභේදන රූපයක් මෙතැනින් නැරඹිය හැක/බාගත හැක: https://ilga.org/maps-sexual-orientation-laws

  ඔබට සහභාගිවන්නන් සමඟ සිතියම අධ්‍යනය කිරීමේ දී, නිර්අපරාධකරණය සිදු වූ ආකාරය සහ අදාළ විය හැකි මෑත කාලීන සිද්ධීන් හෝ සිදුවීම් පිළිබඳ තොරතුරු බෙදා ගත හැකිය. නිදසුනක් වශයෙන්, 2018 දී, ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණය සමරිසි සහකරුවන් අතර ලිංගික හැසිරීම අපරාධයක් බවට පත් කර තිබූ 377 වගන්තිය ඉවත් කල බව ඔබට පැවසිය හැකිය. විනිසුරුවන් මූලික වශයෙන්ම ඔවුන්ගේ තර්ක පුද්ගල ස්වාධිපත්‍යය, වෙනස් කොට සැලකීම් නොකිරීම සහ පෞද්ගලිකත්වයේ වැදගත්කම යනාදිය මත පදනම්ව ඉදිරිපත් කළහ. සමරිසිභාවය මානසික රෝගයක් නොවන බවට ඇමරිකානු මනෝවිකිත්සක සංගමය විසින් පිළිගෙන ඇති බව ද ඔවුහු සඳහන් කළහ. ආසියාතික රටවල නීතිමය තත්ත්වය පිළිබඳ විස්තර පහත සම්පත් දායකයාගේ සටහනී කොටසේ දක්වා ඇත

- සිතියම වැඩි දියුණු කිරීමෙන් පසු භූතානයේ නීතිමය තත්ත්වය වෙනස් වී ඇති බව සලකන්න.

- සම්පත් දායකයා වෙත සටහන් කොටස ද්විමය නොවන සමාජභාවී අනන්‍යතා හඳුනාගැනීම පිළිබඳ අමතර තොරතුරු ද සපයයි. 'ලිංගික දිශානතිය' සහ 'සමාජභාවී අනන්‍යතාවය' අතර ව්‍යාකූලත්වයක් ඇති නොවන ආකාරයෙන් මෙම තොරතුරු බෙදා ගත යුතුය.




**සම්පත්දායකයා වෙත සටහනක්**

ලෝකයේ අනෙකුත් කලාපවලට සාපේක්ෂව ආසියාවේ මානව අයිතිවාසිකම් සීමිතය. අවම වශයෙන් ආසියානු රටවල් විස්සක සමරිසි ලිංගික ක්‍රියාකාරකම් තහනම් කර ඇත.

අවම වශයෙන් රටවල් අටක් LGBTIQ පුද්ගලයන් සඳහා ආරක්ෂාවන් පනවා ඇති අතර, ඊශ්‍රායලය සහ තායිවානය පමණක් සමරිසි සබඳතා පිළිගැනීම ඇතුළු පුළුල් පරාසයක් තුළ විහිදුනු අයිතිවාසිකම් ලබා දී ඇත.

ඇෆ්ගනිස්ථානය, බෲනායි, ඉරානය, කටාර්, සෞදි අරාබිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ යේමනය යන රටවල සමරිසි ක්‍රියාකාරකම්වලට මරණීය දණ්ඩනය හිමි වේ.

**නැගෙනහිර ආසියාව**

දකුණු කොරියාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ලිංගිකත්වය, ආගම හෝ සමාජ තත්ත්වය මත පදනම්ව වෙනස් කොට සැලකීම තහනම් කරයි, එය LGBTQ පුද්ගලයින්ට අදාළ වන බව අධිකරණ අමාත්‍යාංශය පවසා ඇත. එහෙත්, මෙම "ආරක්ෂණයන්" බලාත්මක කිරීමේ බලයකින් තොර අයිතිවාසිකම් ලෙස ක්‍රියාත්මක වේ. සමරිසි විවාහවලට එළඹීම සඳහා මිනිසුන්ට අයිතියක් නැත. මිනිසුන්ට සිය සමාජභාවය වෙනස් කිරීම සඳහා ඉල්ලා සිටිය හැකි අතර එය සිදු වන්නේ, වෙනත් ආකාරවලින් ඔවුන්ගේ සිවිල් නිදහස අහිමි කරන දැඩි තත්වයන්ට අනුකූල වන්නේ නම් පමණි.

චීනයේ නවතම දණ්ඩ නීති සංග්‍රහය සමරිසි වැඩිහිටියන් අතර ලිංගික සංසර්ගය පැහැදිලිවම තහනම් නොකරයි. සමරිසි ලිංගික ක්‍රියාකාරකම් 1997 සිට නීත්‍යානුකූල වේ. කෙසේ වෙතත්, LGBTQ පුද්ගලයන් වෙනස් කොට සැලකීමෙන් ආරක්ෂා කරන නීති කිසිවක් නොමැති අතර සමරිසි විවාහ හෝ හවුල්කාරිත්වය පිළිගන්නා නීති නොමැත. කෙනෙකුගේ සමාජභාවය වෙනස් කිරීමට ඇති අයිතිය, පවතින නමුත්, එය සීමාකිරීම් හා අවවාදයන්ගෙන් පිරී ඇත.

හොංකොං සමරිසි විවාහ හඳුනා නොගන්නා නමුත් තනි පුද්ගල යුවල වලට, අධිකරණයේදී වෙනස් කොට සැලකීමේ ප්‍රතිපත්තිවලට අභියෝග කළ හැකිය.

2021 දී, සුවිශේෂී මහාධිකරණ තීන්දුවකින් පසු විවාහක සමරිසි සහකරුවන්ට හොංකොං හි සහනාධාර සහිත නිවාස හිමිකර ගැනීමට අවසර දෙන බව වාර්තා විය. 2020 දී සමරිසි යුවලවලට උරුමය සඳහා සමාන අයිතිවාසිකම් ලබා දෙන බවට නඩු තීන්දුවකින් පිළිගත්තේ ය. සමරිසි යුවළක් වන හෙන්රි ලී සහ ඔහුගේ මියගිය සහකරු එඩ්ගර් එන්ග් රජයට එරෙහිව දිනූ මෙම නඩුව සමරිසි පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් අත්කර ගත් දෙවන ජයග්‍රහණය විය.

ජපානය සමරිසි විවාහ පිළිගන්නේ නැත. කෙසේ වෙතත්, ප්‍රාදේශීය මහ නගර සහා කිහිපයක් සමරිසි යුවලගේ අයිතිවාසිකම් "විවාහයට සමාන" ලෙස පිළිගනී. සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන්ට යම් යම් කොන්දේසි යටතේ රාජ්‍ය පවුල් ලේඛනයේ සිය සමාජභාවය වෙනස් කර දෙන ලෙස ඉල්ලා සිටිය හැක.

**දකුණු ආසියාව**

බංගලිදේශය සමරිසි ලිංගික ක්‍රියාකාරකම් අපරාධයක් ලෙස සලකයි. ජීවිතාන්තය දක්වා සිරගත කිරීම දඬුවම් ලෙස ලැබිය හැකි අතර එහිදී මෛථුනය සම්පූර්ණ කිරීමට සමරිසි පිරිමින් (කාන්තාවන් ඇතුළත් නොවේ) කාමුක සංසර්ගයේ යෙදීමේ දී ප්‍රවේශ කිරීම පමණක් අදාළ වේ. සමරිසි පුද්ගලයින් හට හමුදා සේවයේ යෙදීමට දැඩි තහනමක් තිබේ. 2013 දී, බංග්ලාදේශය හිජ්‍රා ජනගහනය "තුන්වන ලිංගික සමාජභාවයක් සහිත පුද්ගලයින්" බව පිලිගන්නා ලද අතර ඡන්දය ප්‍රකාශ කිරීම, සංචාරය කිරීම, හඳුනා ගැනීම සහ අනෙකුත් මූලික සිවිල් අයිතිවාසිකම් භුක්ති විඳීමට ඉඩ සලසා දුනි.

2019 දී, භූතානය දණ්ඩ නීති සංග්‍රහයේ 213 වගන්තිය එනම් "අස්වාභාවික ලිංගිකත්වය" තහනම් කිරීමේ ක්‍රියාවලිය ඉවත් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. 2020 දෙසැම්බර් මාසයේ පැවති ඒකාබද්ධ රැස්වීමකදී, "අස්වාභාවික ලිංගිකත්වය" තහනම් කිරීම සංශෝධනය කිරීමට පාර්ලිමේන්තුව එකඟ විය. "වැඩිහිටියන් අතර සමරිසිභාවය අස්වාභාවික ලිංගික ක්‍රියාවක් ලෙස නොසැලකිය යුතු" බව පැහැදිලි කර ඇත. භූතානයේ රජු වන Druk Gyalpo ගේ අත්සනින් පසුව 2021 පෙබරවාරි 17 වැනි දින සිට එම නීතිය බලාත්මක විය.

2020 දී ILG විසින් සිතියම සංවර්ධනය කරන ලද අතර, මෙම වෙනස සිතියමෙහි නිවැරදිව දක්වා නොමැති බව සලකන්න.

2018 දී ඉන්දියාවේ සමරිසි ලිංගික ක්‍රියාකාරකම් නීත්‍යානුකූල කර ඇත. සමරිසි යුවළවල් සම්බන්ධයෙන්, ලියාපදිංචි නොකළ වාසය සහ සංවාසය පිළිගැනිණි. ලිංගික දිශානතිය සහ සමාජභාවීය අනන්‍යතාවය මත පදනම්ව වෙනස් කොට සැලකීම රට පුරා තහනම් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ලිංගික දිශානතිය සහ සමාජභාවය මත පදනම්ව සමානාත්මතාවයට සහ වෙනස් කොට සැලකීමෙන් වැළකීමට ඇති අයිතිය ඉන්දියාව පුරා අධිකරණ විසින් තහවුරු කර ඇත. නිදසුනක් වශයෙන්, 2021 පෙබරවාරි මාසයේදී උත්තර් ප්‍රදේශ් හි අලහබාද් මහාධිකරණය සුවිශේෂී තීන්දුවකින් ප්‍රකාශ කළේ ඕනෑම සේවකයෙකු ඔවුන්ගේ ලිංගික දිශානතිය හේතු කරගෙන රැකියාවෙන් ඉවත් කිරීම නීති විරෝධී බවයි. ලිංගික දිශානතිය පුද්ගලික කාරණයක් වන අතර එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාපිතව පිළිගත් පෞද්ගලිකත්වයේ අයිතිය මගින් ආරක්ෂා කර ඇති බව මහාධිකරණය වැඩිදුරටත් ප්‍රකාශ කළේය. 2019 සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන්ගේ (අයිතිවාසිකම් සුරැකීමේ) පනත් කෙටුම්පත, ඉන්දියාවේ සමාජ සාධාරණත්වය සහ සවිබල ගැන්වීම් පිළිබඳ අමාත්‍යවරයා විසින් 2019 ජූලි 19 වන දින ලෝක් සභාවට ඉදිරිපත් කරන ලදී.

2018 වසරේ ඉන්දීය ශ්‍රේෂ්ඨාධිකරණ විසින් Navtej Singh Johar & Ors' vs' Union of India AIR 2018 SC 4321) හිදී ලබා දුන් නඩු තීන්දුව 19 වන ශතවර්ෂයේ දී බ්‍රිතාන්‍යයන් විසින් හඳුන්වා දුන් දණ්ඩ නීති සංග්‍රහයේ 377 වගන්තිය එනම්, "ස්වභාවධර්මයේ පිළිවෙලට එරෙහිව" ලිංගිකව හැසිරීම ජීවිතාන්තය දක්වා සිර දඬුවම් ලැබිය හැකි අපරාධයක් බවට පත් කළ වගන්තිය ඉවත් කලේය. මීට පෙර ද දිල්ලි මහාධිකරණය විසින් 2009 දී මෙම නීතිය අවලංගු කරන ලද නමුත් 2013 දී නැවත එය ස්ථාපිත කරන ලදී. විනිසුරුවන් මූලික වශයෙන් පුද්ගල ස්වාධිපත්‍යය, වෙනස් කොට සැලකීම සහ පෞද්ගලිකත්වය පිළිබඳ වැදගත්කම කෙරෙහි අවධානය යොමු කරමින් ඔවුන්ගේ තර්ක ඉදිරිපත් කළ අතර, ඔවුන් නැවත නැවතත් ඇමරිකානු මනෝචිකිත්සක සංගමය විසින් සමරිසිභාවය මානසික රෝග ලැයිස්තුවෙන් ඉවත් කිරීම (APA) 1973 ඉස්මතු කර දැක්වීය. තව ද 2003 දී එක්සත් ජනපදය තුළ සමරිසි ලිංගික ක්‍රියාකාරකම් සාපරාධීකරණයෙන් තොර කළ නඩුවේ APA හි ඇමරිකන් සංක්ෂිප්තය ඇතුළු APA ලේඛන කිහිපයක් ද විනිසුරුවන් විසින් උපුටා දක්වන ලදී.

මාලදිවයින සමරිසි සංසර්ගය සහ විවාහ තහනම් කරයි, සිරගත කිරීම, කස පහරවල් සහ මරණ දඬුවම ඇතුළු විවිධාකාර වූ දඬුවම් මේ සඳහා ඇත. මෙම තහනම් කිරීම් කලාතුරකින් ක්‍රියාත්මක වේ. රජය විසින් සමරිසි පුද්ගලයින්ට හමුදාවේ සේවය කිරීම තහනම් කර ඇත

LGBTIQ පුද්ගලයන් නීතිය යටතේ "ස්වාභාවික පුද්ගලයන්" ලෙස සලකන බවට නේපාලයේ ශ්‍රේෂ්ඨාධිකරණය 2007 දී තීන්දු කළේය. රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සමානාත්මතාවයට ඇති අයිතිය පිළිබඳ වගන්තියේ 'ලිංගික සුළුතරයන්' විශේෂයෙන් පිළිගනී.

පකිස්ථානය සමරිසි ලිංගික ක්‍රියාකාරකම් සිරගත කළ හැකි අපරාධයක් ලෙස සලකයි. එය කලාතුරකින් බලාත්මක වේ. නමුත් සමරිසි සහ සංක්‍රාන්ති සමාජභාවී ලිංගික වෘත්තිකයන් ඉලක්ක කර ගනිමින් , "ප්‍රසිද්ධියේ සිදුකරන අසභ්‍ය ක්‍රියා" අපරාධයක් බවට පත් කරන තවත් නීතියක් නිතර භාවිතා වේ. 2009 දී ශ්‍රේෂ්ඨාධිකරණය බලධාරීන්ගෙන් ඉල්ලා සිටියේ පුද්ගලයන්ට සිය ජාතික හැඳුනුම්පත්වල "සංක්‍රාන්ති සමාජභාවී-පිරිමි" හෝ "සංක්‍රාන්ති සමාජභාවී-කාන්තාවන්" ලෙස ස්වයං-හඳුනා ගැනීමකට ඉඩ ලබා දෙන ලෙසයි. Kakhi එදිරිව Rawalpindi (2009), නඩුවේ දී පකිස්ථාන ශ්‍රේෂ්ඨාධිකරණයේ අගවිනිසුරු ඉෆ්තිකාර් චෞද්‍රිගේ සුවිශේෂී තීන්දුවක් මගින් සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාවන්ට ප්‍රතිලාභ සහ සමාන ආරක්ෂාවක් ලබා දෙන ලෙස නියම කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ට දැන් ඡන්දය ප්‍රකාශ කිරීමට සහ දේශපාලන තනතුරු සඳහා ඉදිරිපත් වීමට ද හැකිය.

ගිනිකොණදිග ආසියාව

නිදහසින් පසු කාම්බෝජය සමරිසි ලිංගික ක්‍රියාකාරකම් අපරාධයක් ලෙස නම් කර නැත. සමරිසි විවාහ පැහැදිලිවම නීත්‍යානුකූල නොවන නමුත්, 2008 සිවිල් සංග්‍රහය යුවල යන්න විස්තර කිරීමට "කලත්‍රයන්" යන වචනය භාවිතා කරයි. නමුත් විශේෂයෙන් ආරක්ෂාවේ නාමයෙන් වෙනස් කොට සැලකීමට පොලිසියට පුළුල් බලයක් ලබා දෙන නීති හේතුවෙන් වෙනස්කොට සැලකීම් කිරීම් දිගටම පවතී.

ඉන්දුනීසියාවේ ජාතික මට්ටමින් සමරිසි ලිංගික ක්‍රියාකාරකම් අපරාධයක් බවට පත් කරන නීති නොමැත. කෙසේ වෙතත්, සමහර නීති LGBTQ පුද්ගලයන්ට වෙනස් කොට සලකයි. සමරිසි විවාහ පැහැදිලිවම නීතිවිරෝධී වන අතර විෂමරිසි සහ සමරිසි පුද්ගලයන් සඳහා 16 සහ 18 ලෙස විවිධ වයස් කාණ්ඩ තිබේ. විකාශන ප්‍රමිතීන් රූපවාහිනියේ LGBTQ සමාජභාවී ප්‍රකාශනය සීමා කරන අතර LGBTQ කේන්ද්‍ර කරගත් යෙදුම් සහ වෙබ් අඩවි සඳහා, යෝජිත තහනම් කිරීම් තිබේ.

2021 ජනවාරි මාසයේදී, ගතානුගතික ඉන්දුනීසියානු ප්‍රාන්තයක් වන අචේහිදී ලිංගිකව හැසිරීම සඳහා මිනිසුන් දෙදෙනෙකුට ප්‍රසිද්ධියේ වේවැල් පහර දෙන ලදී. අචේ යනු ඉන්දුනීසියාවේ ඉස්ලාමීය නීතිය පනවන එකම කලාපයයි

මැලේසියාවේ දණ්ඩ නීති සංග්‍රහය ගුද සහ මුඛ සංසර්ගය අපරාධයක් ලෙස සලකන අතර වසර 20ක් දක්වා සිර දඬුවම් නියම කරයි. මැලේසියාවේ සමහර ප්‍රාන්ත ඉස්ලාමීය ෂරියා නීතිය පනවා ඇති අතර සමරිසි සේවනයට කස පහර දීමෙන් දඬුවම් කරයි. සමරිසි පුද්ගලයින්ට හමුදාවේ සේවය කිරීම එරට නීතිය මගින් පැහැදිලිවම තහනම් කරයි.

මියන්මාරය තුළ සමරිසි සේවනයේ යෙදීමේ ප්‍රතිඵලයක් ලෙස වසර 10ක් දක්වා සිරදඬුවම් ලැබිය හැක. සමරිසි යුවලවලට විවාහ වීමට ඇති අයිතිය හෝ වෙනස්කොට නොසැලකීමේ අයිතිය ආරක්ෂා කරන නීති නොමැත.

පිලිපීනයේ, සමරිසි යුවලවල් ආරක්ෂා කරන නීති සම්පාදනය ප්‍රමාද කිරීමට ප්‍රබල කතෝලික ජනගහනයක් සමත් වී ඇත. 2004 දී රජය වෙනස් කොට සැලකීම වැළැක්වීමේ පනතක් අනුමත කළේය. එක්සත් ජනපදය පදනම් කරගත් Pew පර්යේෂණ මධ්‍යස්ථානය පිලිපීනය සමරිසි ප්‍රජාවට වඩාත්ම මිත්‍රශීලී බව ශ්‍රේණිගත කර ඇතː ජපානය 54% දකුණු කොරියාව 39% සහ ඇමරිකා එක්සත් ජනපදය 60% සමඟ සසඳන විට වැඩිහිටි පිලිපීන ජාතිකයන්ගෙන් 73% ක ප්‍රමාණයක් සමරිසිභාවය සමාජය විසින් පිළිගත යුතු බවට එකඟ විය.

සිංගප්පූරුව 377 වගන්තිය යටතේ සමරිසි ලිංගික ක්‍රියාකාරකම් සඳහා දඬුවම් කරන අතර, එය වසර 2 දක්වා සිරගත කළ හැකි අපරාධයකි. 2014 දී, සිංගප්පූරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සමරිසිභාවයේ "වෙනස් නොවන බව" පිළිබඳ "නිශ්චිත නිගමනයක්" නොමැති බව තීන්දු කළේය. සිංගප්පූරුව සමරිසි පුද්ගලයින් හට හමුදාවේ සේවය කිරීම පැහැදිලිවම තහනම් කරයි. කෙසේ වෙතත්, සිංගප්පූරුව සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් සම්බන්ධයෙන් ලිබරල් ප්‍රතිපත්තියක් අනුගමනය කර ඇත. අග්නිදිග ආසියාවේ අනන්‍යතා ලේඛනවල සමාජභාවය වෙනස් කිරීමට ඉඩ සලසන එකම රට සිංගප්පූරුවයි.

සිංගප්පූරුවේ 377 වගන්තිය අභියෝගයට ලක් කෙරෙන නඩු දෙකක් දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. ඒවා නම්, සමරිසි යුවලක් වන Kenneth Chee iy Gary Lim විසින් ගොනු කරන Tan Eng Hong එදිරිව නීතිපති සහ Lim Meng Suang එදිරිව නීතිපති යන නඩු වේ. මෙම නඩු දෙකම එකට විභාගයට ගැනීමට අභියාචනාධිකරණය එකඟ වී ඇත.

වියට්නාමයේ, 1945 සිට සමරිසි ලිංගික ක්‍රියාකාරකම් අපරාධිකරණයෙන් තොර කර ඇත. සමරිසි පුද්ගලයන්ට හමුදාවේ සේවය කළ හැකිය. සමරිසි විවාහ තහනම් කිරීමට හෝ පිළිගැනීමට කිසිදු වගන්තියක් ඇතුළත් කිරීමකින් තොරව සංශෝධිත විවාහ නීතියක් සම්මත කරගෙන සමරිසි විවාහ ව්‍යංගයෙන් නීත්‍යානුකූල කර ඇත. එබැවින් සමරිසි විවාහ සඳහා තවදුරටත් දඩ මුදල් අය නොකෙරේ. සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් සම්බන්ධයෙන් ගත් කල, වියට්නාමය ලිබරල් නොවේ; සමාජභාවය වෙනස් කිරීමේ ශල්‍යකර්මයකට භාජනය වීම තවමත් නීති විරෝධී ය.

බෲනායි හි සමරිසිභාවය නීති විරෝධී ලෙස පවතින අතර මෙම නීතිය පිරිමින්ට සහ කාන්තාවන්ට අදාළ වේ. මිනිසුන් අතර ලිංගික සබඳතා පැවැත්වීමට දඬුවම් වශයෙන් මරණ දඬුවම ලබා දීම හෝ කස පහර ලබා දීම සිදු කරන අතර; කාන්තාවන් අතර ලිංගික සබඳතා පැවැත්වීමට වේවැල් පහර ලබා දීම හෝ සිරගත කිරීම මගින් දඬුවම්

ලබා දෙයි. 2019 මැයි මාසයේදී, බෲනායි රජය විසින් දැනට සමරිසි හැසිරීම්වලට එරෙහිව පවතින මරණීය දණ්ඩනය අත්හිටුවීම පිළිබඳ නීතිය ශරියා අපරාධ නීති සංග්‍රහයට ප්‍රකාරව ගල්ගසා මරා දැමීම දක්වා දීර්ඝ කරන ලදි.

1956 දී තායිලන්තය සමරිසි සේවනය සාපරාධී නොවන ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. සමරිසි භාවී පුද්ගලයන්ට එරෙහිව නඩු පැවරීම මිල අධික සහ අනවශ්‍ය ක්‍රියාවක් ලෙස පිළිගැනුණේ එම නීතිය පැවතියද සැබෑ නඩු පැවරීමක් එමඟින් සිදු නොවූ බැවිනි.

# සැසිය 04 පොදු බිය සහ පොදු මිථ්‍යාවන්

සහභාගිවන්නන් විසින් නිර්නාමිකව අසන ප්‍රශ්නවලට සම්පත් දායකයා විසින් පිළිතුරු දෙයි.

**කාලය**

විනාඩි 20 ක්

**ඉලක්ක කණ්ඩායම**
සියලුම කණ්ඩායම්

කණ්ඩායමකට සහභාගිවන්නන් 30 ක්

**අරමුණු**

මෙම සැසිය අවසානයේ, සහභාගිවන්නන් හට

• SOGIESC හි විවිධත්වය පිළිබඳ සමහර පොදු මිථ්‍යාවන් සහ වැරදි වැටහීම් වලට එරෙහි වීමට හැකියාවක් ලැබෙනු ඇත.

**අවශ්‍ය මෙවලම්**

- සහභාගිවන්නන් සඳහා කඩදාසි සහ පෑන්

**සූදානම් විම**

- PPT Slides
- ඔබ පෙර සැසිය ආරම්භ කිරීමට සැසිය 03( ආසියාවේ සමරිසි නීති) සෑම සහභාගිවන්නෙකුටම කඩදාසි කැබලි 2ක් දෙන්න. LGBT වීම ගැන ඔවුන්ට ඇති ප්‍රශ්න නිර්නාමිකව ලිවීමට ඔවුන්ගෙන් ඉල්ලා සිටින්න. ප්‍රශ්න එකතු කිරීම සඳහා කාමරය වටා භාජනයක් අතිනත යවන්න. LGBT වීම පිළිබඳ මිථ්‍යාවන් සහ වැරදි වැටහීම් පරීක්ෂා කිරීමට මෙය අවස්ථාවක් බව සලකන්න. සහභාගිවන්නන් මෙහිදී තමන්ට ඇති ව්‍යාකූල/ අපැහැදිලි තත්ත්වයන් පැහැදිලි කර ගැනීමට උත්සාහ කළ හැකිය. එසේත් නැතිනම් තමන්ට හමු වූ මිථ්‍යාවක් ඔවුන් බෙදාහදා ගැනීමට පුළුවන. සහභාගිවන්නන්ට තිබිය හැකි අව්‍යාජ ප්‍රශ්න ඉදිරිපත් කිරීමට ඔවුන්ව දිරිමත් කරන්න. මෙම අභ්‍යාසය නිර්නාමික සහ සම්පූර්ණයෙන්ම විනිශ්චය නොවන බව අවධාරණය කරන්න.

- 03 වන සැසියේදී, සම- සම්පත්දායකයාට මෙම ප්‍රශ්න හරහා ගොස් ප්‍රශ්න තාර්කික වර්ගීකරණයකට වර්ග කිරීමට ලක් කර සහ අවශ්‍ය නම්, අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු සොයා ගැනීමට හැකිය.

**පියවර**

- මෙම සැසියේදී විවිධ SOGIESC ඇති පුද්ගලයින් වටා ඇති පොදු වැරදි මත කිහිපයක් සාකච්ඡා කිරීමට සහ මෙම වැරදි වැටහීම් වලට ප්‍රතිචාර දැක්වීමට සහභාගිවන්නන්ට අවස්ථාව ලැබෙන බව පැහැදිලි කරන්න.
- එක් එක් ප්‍රශ්නය හෝ ප්‍රශ්න සමූහය ගෙන සාක්ෂි සහ කරුණු යොදාගෙන ප්‍රශ්නවලට පිළිතුරු දීමට උත්සාහ කරන්න. සමහර ප්‍රශ්න/ මිථ්‍යාවන් සහ පිළිතුරු/ප්‍රතිචාර පහත දක්වා ඇත.

**සටහන්**

***සමරිසි පුරුෂයෙකු වීම මානසික රෝගයක්ද?***

- සමරිසිභාවය මානසික රෝගයක් නොවේ.
- 1973 දී ඇමරිකානු මනෝවිකිත්සක සංගමය සමරිසිභාවය මානසික රෝගයක් නොවන බවට වර්ගීකරණය කළේය.
- මැයි 17 (සමරිසි භීතිකාවට සහ සංක්‍රාන්තික සමාජභාවී භීතිකාවට එරෙහි ජාත්‍යන්තර දිනය ලෙසද සමරනු ලැබේ) යනු 1992 දී ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) සමරිසිභාවය මානසික රෝගයක් නොවන බවට වර්ගීකරණය කිරීමට සාක්ෂි සම්භාරය පිළිගත් දිනයයි.

- 2016 දී සමරිසි හීතිකාවට සහ සංක්‍රාන්ති සමාජභාවය පිළිබඳ හීතිකාවට එරෙහි ජාත්‍යන්තර දිනය සැමරීම සඳහා නිකුත් කරන ලද එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් ලේඛනය (IDAHOT) මානව ලිංගිකත්වය ව්‍යාධිකරණය කිරීම නැවැත්වීමේ අවශ්‍යතාවය සාකච්ඡා කරයි.
- 2021 අගෝස්තු මාසයේදී ශ්‍රී ලංකා මනෝවිකිත්සක විද්‍යාලය සමරිසිභාවය මානසික රෝගයක් නොවන බව පිළිගනිමින් සහ සමරිසි ලිංගික ක්‍රියාකාරකම් අපරාධකරණයෙන් තොර කිරීම සඳහා ප්‍රකාශයක් නිකුත් කළේය.

***සමරිසි පුරුෂයෙකු වීම තෝරාගැනීමක් හෝ කැමැත්තක් ද?***

සමරිසිභාවය තවදුරටත් තේරීමක් හෝ විෂම රිසි පුද්ගලයෙක් නොවීමට ගත් තීරණයක් නොවේ. සමරිසියෙකුගෙන් "ඔබ සමරිසි පුද්ගලයෙකු වීමට තීරණය කළේ කවදාද?" යන්න ඇසීම , විෂම රිසි පුද්ගලයෙකුගෙන්, "ඔබ විරුද්ධ ලිංගයේ අය වෙත ආකර්ෂණය වීමට තීරණය කළේ කවදාද?" යන්න ඇසීම හා සමාන වේ.

- විද්‍යාත්මක දත්ත පෙන්වා දෙන්නේ ලිංගික දිශානතිය (සමරිසිභාවය හෝ විෂමරිසි භාවය, එනම් සමරිසි හෝ ඍජු) ජීව විද්‍යාත්මක සහ පාරිසරික සාධකවල ප්‍රතිඵලයක් බවයි.

***සමරිසිභාවය පරිණාමයට විරුද්ධයි. එවිට එය අස්වාභාවික නොවේද?***

ඇත්ත වශයෙන්ම, සමරිසිභාවය ස්වභාවයෙන්ම පොදු ය. ජපන් මැකේක් සහ රතු පිටි කුරුමිණියන් වැනි සමහර සතුන් සමරිසි ලිංගික ක්‍රියාකාරකම්වල යෙදේ.

- පෙන්ගුයින් සහ ලේසන් ඇල්බට්‍රොස් වැනි සතුන් සමහර අවස්ථාවල සමරිසි සහකරුවන් සමඟ හවුල් වේ. සත්වෝද්‍යානවල සිටින සමරිසි පෙන්ගුයින් ජෝඩු පෙන්ගුයින් පැටවුන් හදා වඩා ගැනීම පවා ප්‍රසිද්ධ වූ අවස්ථා ඇත.
- විරුද්ධ ලිංගයේ සහකරුවන් සිටින විට පවා විශේෂ දෙකක් එකම ලිංගික සහකරුවන් කෙරෙහි ජීවිත කාලය පුරාම ලිංගික ආකර්ෂණයක් ඇති බව නිරීක්ෂණය වී ඇත. ඒ මිනිසුන් සහ ගෘහාශ්‍රිත බැටළුවන්ය..

http://www.bbc.com/earth/story/20150206-are-there-any-homosexual-animals
https://www.independent.co.uk/news/world/australasia/gay-penguin-couple-adopt-chick-melbourne-b1762200.html

***මිථ්‍යාවඃ සමරිසිභාවය බටහිර සංකල්පයකි.***

ලෝකයේ ලිංගික සුළුතරයන් අපරාධකරණය ඇත්ත වශයෙන්ම යටත් විජිත උරුමයේ කොටසකි. බ්‍රිතාන්‍ය පාලන සමයේදී, වික්ටෝරියානු දෘෂ්ටිවාදය දේශීය නීති රාමු තුළට විවිධ ආකාරවලින් ඇතුළු කරන ලද අතර, එක් මාර්ගයක් වන්නේ අස්වාභාවික ලිංගිකත්වය අපරාධකරණය කිරීමයි. යටත් විජිතකරණයෙන් බොහෝ කලකට පසුව වුව ද ඉන්දියාවේ, බංග්ලාදේශයේ, ශ්‍රී ලංකාවේ සහ නේපාලයේ අපරාධ නීති යටතේ 'අස්වාභාවික ලිංගිකත්වය' අපරාධකරණය කර ඇත.

***මිථ්‍යාවඃ විවිධ SOGIESC ඇති පුද්ගලයින් විෂමරිසි පුද්ගලයින්ට වඩා කාමුක බවින් හෝ වැඩි ලිංගිකත්වයකින් යුක්තයි***

- සමාජය තුල වඩාත් කැපී පෙනෙන්නේ හෝ දෘශ්‍යමාන වන්නේ කාමුක, ලිංගිකත්වයට වැඩි නැඹුරුතාවක් දක්වන පුද්ගලයන් බවට ඇති ඒකාකෘතිකය මඟින් මෙම අදහස සමාජය තුල පැතිරී ඇත. වැඩි වශයෙන් සමරිසි කාන්තාවන් හා පිරිමින් සිය සමාජභාවය හෙළි කරන විට මෙම ඒකාකෘතිකය සමාජය තුළින් වියැකී යයි. විවිධ SOGIESC ඇති පුද්ගලයින් හට අන් ඕනෑම අයෙකු මෙන් ස්ථාවර, එක් සහකරුවෙකුට පමණක් සීමාවූ, කැපවූ සබඳතා ඇති කර ගැනීමට හැකියාව ඇත. සමරිසි යුවලක් බොහෝ විට නාගරික ප්‍රජාවන්ගෙන් වෙන්ව, ඔවුන් හා නිතර නොගැටෙන ආකාරයට සිය පවුලේ අය සමඟ අර්ධ නාගරිකව හෝ වෙනත් රටක ජීවත් වේ.
- මෙම මිථ්‍යාව වටා ඇති තවත් ගැටළුවක් වන්නේ LGBTIQ වීම ලිංගිකත්වය සම්බන්ධයෙන් පමණක් වීමයි. විවිධ SOGIESC ඇති පුද්ගලයින් සිල්ලර බඩු සඳහා සාප්පු යාම, රෙදි සේදීම, දරුවන් ඇති දැඩි කිරීම, පැළ සිටුවීම සහ දිනපතා රැකියාවට යාම ඇතුළු පූර්ණ ජීවිත ගත කරයි. LGBTIQ වීම යනු ඔබ ආදරය කරන අය සහ ඔබ ඔබව හඳුනා ගන්නා ආකාරයයි.
- ලිංගික දිශානතිය ලිංගික ආකර්ෂණය පමණක් නොවේ. එහි චිත්තවේග හා රෝමාන්තික ආකර්ෂණයේ අංග ද ඇත.

***මිථ්‍යාව: විවිධ SOGIESC ඇති පුද්ගලයින් ඇතැම් හැසිරීම්, ඇඳුම් පැළඳුම් හෝ භෞතික ලක්ෂණ මගින් හඳුනාගත හැකිය***

- විවිධ SOGIESC ඇති පුද්ගලයින් විෂමරිසි පුද්ගලයින් මෙන්ම විවිධ හැඩයන්, ප්‍රමාණයන් සහ වර්ණවලින් පැමිණේ. සමහර LGBTIQ පුද්ගලයන් ඒකාකෘති හැසිරීම් සහ ලක්ෂණ මගින් හඳුනාගත හැකිය. කෙසේ වෙතත්, බොහෝ විෂමරිසි පුද්ගලයන් ද මෙම හැසිරීම් සහ ලක්ෂණ පෙන්නුම් කරයි. අද, විවිධ SOGIESC ඇති පුද්ගලයින් අඩු ප්‍රමාණයක් ප්‍රධාන ප්‍රවාහයේ ප්‍රජාව සමඟ අනුරූප වීමට ඇඳුම් ඇඳිය යුතු යැයි සිතයි.

***මිථ්‍යාව: සමරිසි ගුරුවරුන්ට පන්ති කාමරය තුළට ඒමට ඉඩ නොදිය යුතුය***

- පීඩෝෆීලියා (ළමා දූෂණය/කාමුකත්වය) සහ සමරිසිභාවය සම්පූර්ණයෙන්ම වෙනස් සංකල්ප දෙකකි. ළමා කාමුකත්වය හෝ ළමා ලිංගික අපයෝජනය යනු බලය අනිසි ලෙස භාවිතා කරමින් දරුවෙකුගෙන් ලිංගික අවශ්‍යතා සපුරා ගැනීමයි. සමරිසිභාවය යනු සමරිසි ආකර්ෂණයයි. සමරිසි සම්බන්ධතාවයකදී, කැමැත්ත ඇති වැඩිහිටියන් අතර ලිංගිකත්වය සිදු වේ.

- ළමා ලිංගික අපයෝජනය ඔවුන්ගේ සමාජභාවය නොසලකා දරුවන්ට එරෙහිව සිදු කෙරේ. කෙසේ වෙතත්, ගැහැණු ළමයින් පිරිමි ළමයින්ට වඩා දෙගුණයක් මේ සඳහා ගොදුරු වේ. අපරාධකරුවන් මේ සඳහා පෙළඹෙන්නේ බලයෙන් සහ පාලනයෙන් මිස ලිංගික ආශාවෙන් නොවේ.

***මිථ්‍යාව: මිනිසුන්ට සමරිසිත්වයෙන් සුව කළ හැකියි***

- මෙය රෝගයක් නොවන බැවින් සුව කිරීමක් ද නැත.
- ව්‍යාධිජනක වර්ගීකරණයන් මත පදනම්ව, LGBT පුද්ගලයින් අපවාදාත්මක, හානිකර, සදාචාර විරෝධී හා බලහත්කාර සැලකීම්වලට ලක් වේ. විශේෂයෙන් ම මෙහිදී ළමයින්ව සහ නව යොවුන් වියේ දරුවන්ව සිය ලිංගික දිශානතිය හා සමාජභාවය මත පදනම් ව විවිධ පරිවර්තන ක්‍රියාවලි හෝ පරිවර්තන ප්‍රතිකාර වෙත යොමු කරන අතර එය අහිතකර ලෙස ඔවුන්ට බලපෑම් ඇති කරයි.
- ස්ව කැමැත්තෙන් තොරව බලකිරීමෙන් හෝ බලහත්කාරයෙන් සිදු කරන ප්‍රතිකාර සහ ක්‍රියා පටිපාටි දරුණු කායික හා මානසික පීඩාවන් සහ වේදනාවන්වලට තුඩු දිය හැකි අතර ඒවා දිගු කාලීනව නැතහොත් ජීවිත කාලය පුරාවටම වුව ද පැවතිය හැක. එවන් ක්‍රියා වධහිංසාවලින් සහ වෙනත් කුරිරු, අමානුෂික හෝ අවමන් සහගත සැලකීම්වලින් හෝ දඬුවම්වලින් නිදහස් වීමේ අයිතිය උල්ලංඝනය කිරීමට ද හේතු විය හැක. තවද මෙම ව්‍යාධිකරණ වර්ගීකරණයන් පුද්ගලයින්ට එරෙහිව සිදු කරන වෙනත් අපයෝජනයන් සාධාරණීකරණය කිරීම සඳහා භාවිතා කෙරේ. සමරිසි සම්බන්ධතා අඛණ්ඩව අපරාධකරණය කිරීම, සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින්ගේ සමාජභාවය නිල වශයෙන් පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ එසේ පිළිගැනීම සඳහා අපවාදාත්මක කොන්දේසි පැනවීම ඊට ඇතුළත් වේ. මෙය LGBT ප්‍රජාව වෙනස්කොට සැලකීමට තුඩු දෙන අතර එමගින් ඔවුන්ට අධ්‍යාපනය, සෞඛ්‍යය, රැකියා හෝ නිවාස සඳහා ඇති අයිතීන් භුක්ති විඳීමට ඇති ඉඩ අවහිර වේ.

# 5 වන සැසිය : ශ්‍රී ලංකාවේ කුවියර් සමාජභාවී පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ව්‍යාපාරය - කාලරාමුව

ක්‍රියාකාරකමක් සමඟ සිදු කරන සාකච්ඡාවක්.

**කාලය**

පැය 1

**ඉලක්ක කණ්ඩායම**

සියලුම කණ්ඩායම්

කණ්ඩායමකට සහභාගිවන්නන් 30 ක්

**අරමුණු**

මෙම සැසිය අවසානයේ, සහභාගිවන්නන්ට හට:

- ශ්‍රී ලංකා ඉතිහාසය තුළ දක්නට ලැබෙන, කුවියර සමාජභාවී පුද්ගලයන්ගේ ව්‍යාපාරයට සම්බන්ධ සුවිශේෂී සිදුවීම් හඳුනා ගැනීමට හා
- LGBTIQ අයිතිවාසිකම් සඳහා රාජ්‍ය ප්‍රතිචාරයේ උච්චාවචනයන් හඳුනා ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

**අවශ්‍ය මෙවලම්**

- කාඩ්

**සකස් කිරීම**

- සටහන් වල ලැයිස්තුගත කර ඇති සිදුවීම්වල විස්තර තනි පත්‍රවල මුද්‍රණය කරන්න. එක කඩදාසියක මුද්‍රණය කළ යුත්තේ එක් සිදුවීමක් පමණි. සිදුවීම් 26 ක් ඇත. සහභාගිවන්නන් අඩු සංඛ්‍යාවක් සිටී නම්, සහභාගිවන්නන් සංඛ්‍යාවට ගැළපෙන පරිදි ලැයිස්තු ගත කර ඇති සිදුවීම්වලින් එක හා සමාන/අනුගාමී සිදුවීම් දෙකකින් එකක් ඉවත් කරන්න.

**පියවර**

මෙම ක්‍රියාකාරකමේදී ඔබ ශ්‍රී ලංකාවේ කුවියර පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ව්‍යාපාරයේ ඉතිහාසය දෙස බලන බව පැහැදිලි කරන්න.

- සහභාගිවන්නන් අතර සිදුවීම් මුද්‍රණය කර ඇති පත්‍රිකා බෙදාහරින්න.
- සිදුවීම් කියවා එම සිදුවීම් කාලානුක්‍රමික පිළිවෙළට සිටින ආකාරයට පේළියකට සිටගන්නා ලෙස සහභාගිවන්නන්ගෙන් ඉල්ලා සිටින්න. මෙම ක්‍රියාකාරකම සඳහා විනාඩි 10ක් දෙන්න. අවශ්‍ය තැන්වල දී සහාය ලබා දෙන්න.
- සහභාගිවන්නන් පේළියක සිටගත් පසු, සහභාගිවන්නන්ගෙන් ඔවුන්ගේ පත්‍රවල ඇති සිදුවීම් කියවන ලෙස ඉල්ලා සිටින්න.
- 'මේ ගැන ඔබ සිතන්නේ කුමක්ද?', 'මෙය සිදු වූ බව ඔබ සිතන්නේ ඇයි?', 'මෙය නැවත සිදු විය හැකිද? 'ඔබ සිතන්නේ ඉන් පසුව සිදු වූයේ කුමක්ද?' වැනි ප්‍රශ්න භාවිතා කරමින් මෙම සිදුවීම් පිළිබඳව අදහස් දැක්වීමට සහභාගිවන්නන් පොළඹවමින් මෙම සිදුවීම් වටා අන්තර්ක්‍රියාකාරී සාකච්ඡාවක නිරත වන්න.
- සටහන් රටා. උදාහරණයක් වශයෙන්, ජාත්‍යන්තර ප්‍රජාව ඉදිරියේ රජයේ ස්ථාවරය ප්‍රගතිශීලී බව ඔබට පෙනෙනු ඇත. කෙසේ වෙතත්, දේශපාලඥයින් සහ මාධ්‍යයන් විසින් LGBTI පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිගැනීමට එරෙහිව බරපතළ ලෙස බාධා පමුණුවන අතර ප්‍රජාවන් පිළිබඳ දුර්මත ද සමාජයේ පතුරවයි.

HIV වැළැක්වීමේ වැඩසටහන් මෙම ව්‍යාපාරය සඳහා ධනාත්මක ලෙස දායක වී ඇති ආකාරය නිරීක්ෂණය කරන්න. LGBTIQ පුද්ගලයන් සඳහා, විශේෂයෙන්ම සමාජ මාධ්‍යවල පිළිගැනීම සහ ගෞරවය ක්‍රමයෙන් වැඩි වෙමින් පවතින ආකාරය සැලකිල්ලට ගන්න.

**සටහන්**

1995

Companions on a Journey (COJ) සිය ක්‍රියාකාරකම් ආරම්භ කළේ කුවියර සමාජභාවී පුද්ගලයන් විසින් නායකත්වය දරණ මෙරට ප්‍රථම සංවිධානය ලෙස ය. මෙම ව්‍යාපාරය සමරිසි පිරිමි පුද්ගලයින් සමඟ වැඩ කිරීමට අවධානය යොමු කළ අතර අවසානයේ සමරිසි අයිතිවාසිකම් පිළිබඳ ප්‍රමුඛ සංවිධානයක් බවට පත්විය. මෙම කණ්ඩායමේ ප්‍රධාන අරමුණ වූයේ සමරිසිභාවය අපරාධකරණයෙන් තොර කිරීමයි. එහි නිර්මාතෘ ෂර්මන් ද රෝස් ශ්‍රී ලංකාවේ පළමු වරට සිය සමාජභාවය සමරිසි යැයි විවෘතව ප්‍රකාශ කල පුද්ගලයා ලෙස හැඳින්වේ. එසේ විවෘත වීම නිසා ඔහුට විවිධ තර්ජන හා පහරදීම්වලට මුහුණ දීමට සිදු විය. කෙසේ වෙතත්, COJ සමරිසි ප්‍රජාව සඳහා ආරක්ෂිත ස්ථානයක් බවට පත් විය; කුවියර චිත්‍රපට ප්‍රදර්ශනය කිරීම සහ සමරිසි සාහිත්‍යයට ප්‍රවේශය ලබා දීම සහ HIV/AIDS පිළිබඳ තොරතුරු සැපයීම; මෙන්ම රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන සමඟ HIV වැළැක්වීමේ උපාය මාර්ගය ක්‍රියාවට නැංවීම සිදු කරන ලදි. 2011 දී COJ විසුරුවා හරින ලද්දේ මුදල් අවභාවිතය පිළිබඳ චෝදනා මත ය.

1999

1999 වන විට, කාන්තා උපකාරක කණ්ඩායම (WSG) COJ තුළ ස්වාධීන ආයතනයක් ලෙස මතු විය. එය සමරිසි කාන්තා, ද්වීරිසි සහ සංක්‍රාන්තික සමාජභාවී (LBT) කාන්තාවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටි පළමු සහ එකම කණ්ඩායම විය.

1999 දී, WSG පළමු සමරිසි සමුළුව සඳහා කැඳවුම් කළේය. නමුත් ජාතික පුවත්පතක් වන ද අයිලන්ඩ් විසින් සම්මන්ත්‍රණයට සහභාගී වන කාන්තාවන් දූෂණය කරන බවට ලිපියක් පළ කිරීමෙන් පසු උත්සවය අවලංගු විය. සංවිධානය පසුව 2010 දී විසුරුවා හරින ලදී.

2004

Equal Ground (EG) නිර්මාණය කරන ලද්දේ Rosanna Flamer-Caldera විසිනි. සංවිධානය සියලුම ලිංගික දිශානතීන් සහ සමාජභාවයන්ට අයත් පුද්ගලයන්ගේ මානව හිමිකම් වෙනුවෙන් පෙනී සිටියි.

2005

රජය වෙනස් වීමත් සමඟ LGBTIQ ප්‍රමුඛ සංවිධාන නිරීක්ෂණයට ලක් විය. මාධ්‍ය මගින් LGBTIQ කණ්ඩායම් ඉලක්ක කර ගනිමින් සමරිසි භීතිකාව පදනම් වූ වාර්තාකරණය ද සිදු විය.

2009

පිරිමින් සමඟ ලිංගිකව එක්වන පිරිමින් (MSM)/ HIV සහ ලිංගික සෞඛ්‍යය පිළිබඳ පළමු ජාතික උපදේශන රැස්වීම පැවැත්විණි. ලිංගාශ්‍රිතව සම්ප්‍රේෂණය වන ආසාදන සඳහා ප්‍රතිකාර ලබා ගන්නා පුද්ගලයින් සඳහා ප්‍රථම ගොඩ වැදීමේ මධ්‍යස්ථානය COJ හරහා විවෘත කරන ලදී.

2011

ආපදා කළමනාකරණ සහ මානව හිමිකම් අමාත්‍යාංශයට වාර්තා කරන කමිටුවක් විසින් සකස් කරන ලද අයිතිවාසිකම් පනත් කෙටුම්පතක, ලිංගික දිශානතිය ආරක්ෂා කල යුතු ලක්ෂණයක් ලෙස පැහැදිලිවම ඇතුළත් කර ඇත. 2011 දී කැබිනට් මණ්ඩලය විසින් සම්මත කරන ලද ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම මගින් නියම කරන ලද පරිදි, මෙම පනත් කෙටුම්පත සමාලෝචනය සඳහා අධිකරණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී. කෙසේ වෙතත්, එය සම්මත කර ගත්තේ නැත.

2014

ආගමික අන්තවාදය හිස එසවීමත් සමඟ, සිංහලේ, බොදු බල සේනා වැනි අන්තවාදී සංවිධාන මගින් සමාජය තුළ අසහනකාරී තත්තවයක් ඇති කළේය. ඔවුන් LGBTIQ පුද්ගලයන් සඳහා සමානාත්මතාවය සඳහා ඇති අයිතිය තහවුරු කිරීමට දරන උත්සාහයන් නොකඩවා හෙළා දුටු අතර, LGBTI සංවිධානවලට තර්ජනය කරන ලද අතර විශේෂයෙන් ම සමාජ මාධ්‍ය හරහා පහර දෙන ලදි.

2014

ශ්‍රී ලංකාව සමරිසි විවාහ නීතිගත කිරීමට පියවර ගැනීමේ කොන්දේසිය මත ඉදිරිපත් කර තිබූ බ්‍රිතාන්‍ය ආධාර විකල්පය රජය ප්‍රතික්ෂේප කළ බව එවකට ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යවරයා අප්‍රේල් මාසයේදී පුවත්පත්වලට වාර්තා කළේය.

දැඩි ලෙස ණය බරින් මිරිකී සිටින සහ සිවිල් යුද්ධයකින් දුබල වූ රටක්, සංස්කෘතික වටිනාකම් පිළිබඳ වැරදි මතයක් මත පදනම්ව ඔවුන්ගේ නීතිමය රාමුවට සාක්ෂි මඟින් අනුබල දෙන සංශෝධනයක් ඇති කිරීම ප්‍රතික්ෂේප කළේය.

2014

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව විසින් ඔක්තෝම්බර් මාසයේදී ජිනීවාහිදී සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ශ්‍රී ලංකාවේ වාර්තාව සමාලෝචනය කිරීමෙන් අනතුරුව අතිරේක සොලිසිටර් ජෙනරාල් බිම්බා ජයසිංහ තිලකරත්න මෙසේ ප්‍රකාශ කළාය:

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12.1 ව්‍යවස්ථාව ලිංගික දිශානතිය සහ සමාජභාවීය අනන්‍යතාවය සඳහා සමානාත්මතාවය සහතික කරයි" සහ 12.2 ව්‍යවස්ථාව යටතේ "ලිංගික දිශානතිය සහ ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ අනන්‍යතාවය මත වෙනස් කොට සැලකීමේ නීති ව්‍යවස්ථා විරෝධී" බව ද දක්වයි. "ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365 ඒ වගන්ති කිසිඳු කණ්ඩායමක් ඉලක්ක කර ගනිමින් පනවා නොමැති බවත් ඒවා ඇත්තේ මහජන සදාචාරය ආරක්ෂා කිරීමට" බවත් ඇය සඳහන් කළාය.

2015

ජූනි මාසයේදී, එවකට විදේශ අමාත්‍යවරයාව සිටි මංගල සමරවීර, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සමරිසි කාන්තා සහ සමරිසි පිරිමි සේවකයින්ට අඹුසැමි ප්‍රතිලාභ ඉවත් කිරීමේ රුසියානු යෝජනාවට එරෙහිව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව අත්අඩංගුවට ගන්නා ලෙස ජාතික නිදහස් පෙරමුණේ විමල් වීරවංශ විසින් ඉල්ලා සිටියේය. වීරවංශ මහතා මෙසේ ප්‍රකාශ කර ඇත: "සමරිසි හා සමරිසි හිතකාමී වීම අද අපගේ විදේශ ප්‍රතිපත්තිය බවට පත්ව ඇත. මෙය දිගුකාලීනව ශ්‍රී ලංකාවට අහිතකර ප්‍රතිවිපාක ඇති කරයි... එය අපේ සංස්කෘතියට බලපානු ඇත. ඒ නිසා දණ්ඩ නීති සංග්‍රහය කඩ කළ ඇමැතිවරයා අත්අඩංගුවට ගත යුතුයි."

මෙම කරුණ සම්බන්ධයෙන් තවත් විපක්ෂ නායකයෙකු වන පිවිතුරු හෙළ උරුමයේ ප්‍රධාන ලේකම් උදය ගම්මන්පිල පැවසුවේ සමානාත්මතාවය යනු සියලු කණ්ඩායම් සමාන ලෙස පිළිගැනීම නොවන බවයි.

2015

දෙසැම්බර් මාසයේදී පාර්ලිමේන්තු මන්ත්‍රී නලින්ද ජයතිස්ස ඩේලි නිවුස් සමග සම්මුඛ සාකච්ඡාවකට එක්වෙමින් මෙසේ ප්‍රකාශ කළේය: "මම සමරිසි කාන්තා , සමරිසි පුරුෂ , ද්වීරිසි සහ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන්ගේ (LGBT) අයිතිවාසිකම්වලට සම්පූර්ණයෙන්ම විරුද්ධයි. මෙය මිනිසාගේ අවශ්‍යතාවයක් නොවේ. අපට අනාගත පරපුරක් අවශ්‍යයි. විද්‍යාත්මක අත්හදා බැලීම්වලින් හෙළි වන්නේ මානසික ආතතිය නිසා මෙවැනි හැඟීම් පිටවන බවයි. මිනිසුන් ආතතියෙන් පෙළෙන විට හෝ එවැනි පරිසරයක සිටින විට, අස්වාභාවික හැඟීම් පිටතට පැමිණේ. නිදසුනක් වශයෙන්, ඔවුන් හික්මීමකින් හෝ පාලනයකින් තොරව ජීවත් වන විට මෙම හැසිරීම අපට නොපෙනේ. කෙසේ වෙතත්, ඔවුන් කුඩු කර ඇත්නම්, මෙම හැසිරීම අපට දැකගත හැකිය. මම ගැහැනියක් සහ පිරිමියෙක් අතර විවාහයක් ගැන විශ්වාස කරනවා. සමරිසි විවාහ අස්වාභාවිකයි. එය මිනිසාගේ පරිණාමයට විරුද්ධයි."

2016

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව (HRCSL) විසින් විශේෂිත තේමා ගැටළු සම්බන්ධයෙන් අනු කමිටු 9ක් පත් කරන ලදී. 1996 අංක 21 දරණ HRCSL පනතේ 10 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා රජය විසින් කළ යුතු ප්‍රතිපත්තිමය මැදිහත්වීම් පිළිබඳ කොමිෂන් සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අනුකමිටු විසින් එක් එක් තේමාවට අදාළ නීති සම්පාදනය, ප්‍රතිපත්ති සහ තිල භාවිතයන් සමාලෝචනය කිරීමට අපේක්ෂා කරන ලදී. තවද, අනුකමිටු විසින් අදාළ ගැටළු සම්බන්ධයෙන් අවශ්‍ය ප්‍රතිපත්ති සහ ප්‍රායෝගික මැදිහත්වීම් පිළිබඳව කොමිෂන් සභාවට උපදෙස් දීම ද අපේක්ෂා කරන ලදී. ඔවුන් LGBTIQ පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ උප කමිටුවක් පිහිටුවූ අතර එය ආරම්භයේ සිටම අක්‍රියව පවතී. LGBTIQ පුද්ගලයන්ගේ අයිතීන් පිළිබඳ අනුකමිටුව විසින් LGBTIQ පුද්ගලයන් "සුව කිරීමට" ප්‍රවර්ධනය කරන සහ වෛද්‍ය ප්‍රතිකාර ලබා දෙන බවට ප්‍රචාරණය කරන අනවසර වෛද්‍ය සායන පිළිබඳව සොයා බැලීම සඳහා පුද්ගලික වෛද්‍ය ආයතන අධීක්ෂණය සහ නියාමනය කිරීමට නියම කර ඇති පුද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවේ අවධානය යොමු කරන ලදී. පාසල් විෂය මාලාවට පරිපූර්ණ ලිංගික අධ්‍යාපනය (CSE) ඇතුළත් කිරීම, විශ්වවිද්‍යාල තුළ LGBTIQ පුද්ගලයන්ට හිරිහැර කිරීමේ සිද්ධීන් නිරීක්ෂණය කිරීම සහ සමාජභාවය තහවුරු කිරීමේ සහතික සඳහා අයදුම් කරන අය මුහුණ දෙන අභියෝග පිළිබඳව ද අනු කමිටුව සාකච්ඡා කර ඇත. උදාහරණයක් වශයෙන් හෝර්මෝන ප්‍රතිකාර හා ශල්‍යකර්මවලට භාජනය වීම වැනි ප්‍රතිකාර ලබා ගැනීමට නොහැකි/හෝ අකමැති අයට සමාජභාවය හඳුනාගැනීමේ සහතික ලබා දීමෙන් වළකින අවස්ථා ඇත.

2016

ජූනි මාසයේදී ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින් සඳහා සමාජභාවය තහවුරු කිරීමේ සහතිකය ප්‍රදානය කිරීමේ ක්‍රියා පටිපාටිය ඇතුළත් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

වර්තමානයේ දී සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන්ට ඔවුන්ගේ උප්පැන්න සහතිකය සහ අනෙකුත් හැඳුනුම්පත් ලේඛන ඔවුන්ගේ සැබෑ සමාජභාවී අනන්‍යතාවයට ගැලපෙන පරිදි වෙනස් කළ හැක. සංක්‍රාන්ති සමාජභාවය පුද්ගලයන් මුහුණ දෙන වෙනස්කොට සැලකීම් සහ ප්‍රචණ්ඩත්වය ද එම චක්‍රලේඛයෙන් හඳුනාගෙන ඇත.

එම චක්‍රලේඛය මඟින් වයස අවුරුදු 16ට වැඩි අයට සහතිකය සඳහා අයදුම් කිරීමට අවසර ලබා දී ඇත. අයදුම්කරුවන් මනෝ වෛද්‍යවරයෙකුගේ තක්සේරුවකින් පසු සමාජභාවය හඳුනාගැනීමේ සහතිකයක් (GRC) ලබා ගත යුතුය. සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින් සඳහා සමාජභාවය තහවුරු කිරීමේ සහතිකය (GRC) මනෝ වෛද්‍යවරයකු විසින් සහතික කළ යුතු අතර පසුව සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයක ප්‍රධානියා විසින් සහතික කළ යුතුය.

2021 වර්ෂයේ 3 වැනි කාර්තුව වනවිට නිකුත් කර ඇති GRC සංඛ්‍යාව 193 කි. කෙසේ වෙතත්, සහතිකය නිකුත් කිරීමට බලය ඇති සෞඛ්‍ය පහසුකම් සහිත මධ්‍යස්ථාන සීමිත වීම හේතුවෙන් සහතිකය ලබා ගැනීමේදී යම් යම් අභියෝග පවතී.

2017

ශ්‍රී ලංකා රජය සමරිසිභාවය නිර්සාපරාධීකරණය  කිරීම ගැන සලකා බැලීය. මෙම ව්‍යාපෘතිය අවසානයේ දී අත්හැර දමන ලද අතර, LGBTI මූලික කරගත් දේශීය රාජ්‍ය නොවන සංවිධාන රට තුළ උපදේශන කටයුතු පැවැත්වීමට පෙළඹුණි.

2017

ජනවාරි මාසයේදී, මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්මෙන් සමරිසි ලිංගික ක්‍රියාකාරකම් නිර්සාපරාධීකරණය  කිරීමේ යෝජනාවක් රජය විසින් ඉවත් කරන ලදී; "සංස්කෘතිකයට නුසුදුසු" යෝජනා අත්හැරීමට ජනාධිපතිවරයා තීරණය කළ බව එහිදී මුදල් පිලිබඳ රාජ්‍ය අමාත්‍ය ලක්ෂ්මන් යාපා අබේවර්ධන ප්‍රකාශ කළේ ය.

2017

ජනවාරි මාසයේදී, එවකට සිටි අධිකරණ අමාත්‍යවරයා, යුරෝපා සංගමයේ GSP+ සහනය පිළිබඳ කොන්දේසි ගැන කතා කරමින් මෙසේ ප්‍රකාශ කළේය:

"රට තුළ සමරිසිභාවය නීතිගත කරන ලෙසද අපෙන් ඉල්ලා සිටියේය. යුරෝපීයයන් අපෙන් ඉල්ලා සිටියේ එය මූලික ව්‍යවස්ථාවේ අවසානයට ඇතුළත් කරන ලෙසයි. අපි ඔවුන්ට පැහැදිලිවම කිව්වා ඔවුන්ට අශිෂ්ට සංස්කෘතියක් තිබුණත් ශ්‍රී ලාංකිකයන් එවැනි මානසික රෝගවලින් පෙළෙන අය නොවන බව. ප්‍රමුඛ සංක්‍රාන්ති අයිතිවාසිකම් ක්‍රියාකාරිකයෙකු වන ආචාර්ය චමින්ද්‍ර වීරවර්ධන ප්‍රකාශ කළේ "ලිංගික දිශානතිය සහ සමාජභාවය පදනම් කරගෙන තම සහෝදර පුරවැසියන්ට යුක්තිය ඉටු නොකිරීමට තරම් කුඩා මනසක් ඇති අධිකරණ ඇමතිවරයෙකු අප සතුව සිටින බවට මෙම ප්‍රකාශය සාක්ෂියක්" බවයි.

2017අගෝස්තු මාසයේදී, , ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතීන් පිළිබඳ කමිටුව (CESCR) එහි අවසාන නිරීක්ෂණවලදී ශ්‍රී ලංකාවෙන් ඉල්ලා සිටියේ "සම්මුතිවාදී සමරිසි හැසිරීම් නිර්සාපරාධීකරණය කිරීමේ අරමුණින් දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කරන ලෙසයි." ශ්‍රී ලංකාව "LGBTI පුද්ගලයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වයට එරෙහිව සටන් කිරීමට සහ වැළැක්වීමට සහ ඔවුන්ගේ සියලු මානව හිමිකම්, විශේෂයෙන්ම සෞඛ්‍ය, අධ්‍යාපනය, රැකියා සහ නිවාස සඳහා ඇති අයිතිය සමානව භුක්ති විඳීම සහතික කිරීමට හදිසි පියවර ගන්නා ලෙස" එය තවදුරටත් නිර්දේශ කළේය. ශ්‍රී ලංකාව තුළ ලිංගික දිශානතිය සහ සමාජභාවය පදනම් කරගෙන සිදු කරන වෙනස් කොට සැලකීම් ද ඇතුලුව , වෙනස්කොට සැලකීමට එරෙහිව නීති මාලාවක් හඳුන්වා දෙන ලෙස CESCR තවදුරටත් නිර්දේශ කළේ ය.

2017

UPR සමාලෝචනයෙන් පසුව ශ්‍රී ලංකාවේ නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල් නෙරිල් පුල්ලේ විසින්,  ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහය වෙනස් කිරීමට නොවැම්බරයේදී පොරොන්දු ලබා දුන්නේ " කිසිදු නීතිමය ප්‍රතිපාදනයක් LGBTIQ ප්‍රජාවට වෙනස් කොට සලකන ආකාරයෙන් භාවිතා නොකිරීමට රජය විසින් කැප වී සිටින බව" ප්‍රකාශ කරමින් ය.

2017

2018 - 2022 ජාතික HIV/ලිංගාශ්‍රිත රෝග පිළිබඳ උපායමාර්ගික සැලැස්ම යටතේ අධි අවදානම් සහිත ජනගහණය සහ HIV සමඟ ජීවත්වන පුද්ගලයින්ට හිතකාමී, උදව් ලබාදෙන පරිසරයක් ඇති කිරීමට සහ NAC හි නීතිමය සහ සදාචාරාත්මක අනුකමිටුව ප්‍රතිසංවිධානය කිරීම සඳහා යෝජනා කර ඇත. අධි අවදානම් සහිත ජනගහණය සහ HIV සමඟ ජීවත්වන පුද්ගලයින් සඳහා ආධාරක පරිසරය ශක්තිමත් කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින් සමඟ පෙනී

සිටීමටත්, ඉලක්කගත ජනගහනය අපරාධ බවට පත් කරන නීති - විශේෂයෙන්ම දණ්ඩ නීති සංග්‍රහයේ 365 සහ 365 ඒ යන වගන්ති, ගණිකා නිවාස ආඥාපනත, පාදඩ ආඥාපනත නැවත පිරික්සීම සහ අවලංගු කිරීමටත් මෙමගින් අපේක්ෂා කෙරේ.

උපායමාර්ගික සැලැස්ම විසින් සමරිසි සබඳතා සාපරාධී ලෙස සලකන දණ්ඩ නීති සංග්‍රහයේ වගන්ති දෙකක් පිරිමින් සමඟ ලිංගිකව එක්වන පිරිමින්ට සහ සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවන්ට HIV/STI සේවාවන් වෙත ප්‍රවේශ වීමට බාධාවක් ඇති කරන බව හඳුනාගෙන ඇත. HIV වැළැක්වීම සඳහා, අධි අවදානම් සහිත ජනගහණයට සේවා ලබාගැනීමට බාධා කරන නීති නැවත සලකා බැලීම වැදගත් වේ.

2018

2018 මුල් භාගයේදී, එහි තුන්වන UPR චක්‍රය තුළදී, LGBT පුද්ගලයින්ට වෙනස් කොට සැලකීම වැළැක්වීම සහ ඒවාට එරෙහිව සටන් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය ඉතාලිය, ආර්ජන්ටිනාව සහ පෘතුගාලයේ නිර්දේශ වලට සහාය දැක්වීය. කැමැත්තෙන් සිදු කරන සමරිසි හැසිරීම් නිර්සාපරාධීකරණය කිරීම සඳහා බොහෝ නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

2018

නොවැම්බර් මාසයේදී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අර්බුදය අතරතුර, එවකට ශ්‍රී ලංකාවේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන, අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා ඇතුලු පිරිසව ඔහුගේ කතාවක දී "සමනල රැල " යන වාක්‍ය ඛණ්ඩය භාවිතා කරමින් හඳුන්වා අපහාස කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අර්බුදය පුරාවටම LGBTIQ සංවිධානවල නියෝජිතයෝ අනෙකුත් සිවිල් සමාජ සංවිධාන සමඟ එක්ව එම අර්බුදයට එරෙහිව කොළඹදී විරෝධතා දැක්වූහ.

2019 අප්‍රේල් මාසයේදී ශ්‍රී ලංකාව 6 වැනි කාලාවර්ත සමාලෝචනය මානව හිමිකම් කමිටුවට ඉදිරිපත් කළේය. එම වාර්තාවේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සම්බන්ධ සාකච්ඡාවලට ලිංගික දිශානතිය පදනම් කරගෙන වෙනස් කොට සැලකීම පැහැදිලිවම තහනම් කිරීම සඳහා නිර්දේශ ඇතුළත් වන බවත් එය ප්‍රතිපත්තිමය ප්‍රමුඛතාවයක් බවත් රජය සඳහන් කළේය.

"ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වැනි ව්‍යවස්ථාව සමානාත්මතාවයට සහ වෙනස්කම් වලට ලක් නොවීමට ඇති අයිතිය සහතික කරයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) ව්‍යවස්ථාව තුළින් ආවරණය වන විෂය පථය ව්‍යතිරේකයකින් තොරව පුද්ගලයන්ගේ සමානාත්මතාවය සහතික කරන බව 2014 දී ශ්‍රී ලංකාව, කමිටුව හමුවේ පැහැදිලි කළේය.

තවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (2) ව්‍යවස්ථාව වෙනස් කොට සැලකීමේ තහනම් හේතුන්වලින් පරිපූර්ණ නොවන බවත්, ලිංගික දිශානතිය පදනම් කරගෙන වෙනස්කොට සැලකීම් ව්‍යංගයෙන් තහනම් කර ඇති බවත් කාන්තාවන්ට එරෙහි සියලුම ආකාරයේ වෙනස් කොට සැලකීම් පිටුදැකීම පිළිබඳ සම්මුතියේ (CEDAW) සහ ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් කමිටුව ඉදිරියේ ශ්‍රී ලංකාව පැහැදිලි කළේය. *NHRAP* හි සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පරිච්ඡේදයට වෙනස්කොට සලකන දණ්ඩ නීති පිළිබඳ සමාලෝචනයක් කිරීමට සහ ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීම සහතික කිරීමට ප්‍රතිපත්තිමය වශයෙන් කැපවීමෙන් මැදිහත් වීමක් ඇතුළත් කර ඇත.

2021

මාර්තු 1 වන දින @GotabayaR - ජනාධිපති ගෝඨාභය රාජපක්ෂගේ නිල ට්විටර් ගිණුම ට්වීට් කළේ,

"අද #ZeroDiscrimination Day (වෙනස් කොට සැලකීම් ශූන්‍ය දිනය). ජනාධිපතිවරයා ලෙස වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ලිංගිකත්වය, ජාතිය, ශාරීරික පෙනුම සහ විශ්වාසයන් නොසලකා ගෞරවාන්විතව ජීවිතය ගත කිරීමට සෑම කෙනෙකුටම ඇති අයිතිය සුරක්ෂිත කිරීමට මම අධිෂ්ඨාන කරගෙන සිටිමි"

වෙනස් කොට සැලකීමට ලක් නොකිරීමට ජනතාවට ඇති අයිතිය පිළිගනිමින් වෙනස් කොට සැලකීමේ ශූන්‍ය දිනය සමරමින් ජනාධිපති රාජපක්ෂගේ ට්විටර් පණිවුඩය පැමිණෙන්නේ ජනාධිපතිවරයා විසින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇති අවස්ථාවකය.

2021

ජූනි මාසයේදී, ප්‍රෞඪත්වයේ මාසය (PRIDE) මාසය අගයමින්, ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකු (MP) සිය සහය සමාජ මාධ්‍ය ප්‍රකාශයන් සහ නිල ට්විටර් ගිණුම් හරහා ප්‍රකාශ කළහ.

කොළඹ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී සහ ශ්‍රී ලංකා රජයේ හිටපු ආර්ථික ප්‍රතිසංස්කරණ සහ පොදු බෙදාහැරීම් පිළිබඳ අමාත්‍ය හර්ෂ ද සිල්වා මෙසේ ලිවීය.

"කිසිදු රටක් මිනිසුන්ගේ අයිතිවාසිකම් ඔවුන් ආදරය කරන්නෙ කා හටද යන්න මත පදනම්ව නොසලකා හැරීම නොකළ යුතුය. LGBTQ ප්‍රජාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් අප පෙනී සිටිය යුත්තේ එබැවිනි. වෛරය, වෙනස් කොට සැලකීම සහ නොදැනුවත්කමට එරෙහිව සටන් කිරීමට අප සැමට කාර්යභාරයක් ඇත."

මඩකලපුව දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ශානකියන් රාසමානිකම් ට්විටර් පණිවුඩයක් නිකුත් කරමින් කියා සිටියේ, "සෑම කෙනෙකුටම තමන්ට තමන්ව දැනෙන ආකාරයෙන් ජීවත් වීමට සහ තමන්ට කැමති අයට ආදරය කිරීමට අයිතියක් ඇත. ශ්‍රී ලංකාවේ ජනවාර්ගික සුළුතරයන් (දෙමළ සහ මුස්ලිම්) මෙන්ම, LGBTIQ පුද්ගලයන්ද සංඛ්‍යාත්මකව සුළු ප්‍රමාණයක් පමණි. උතුරු නැගෙනහිර පිළිබඳව මිනිසුන් අතර පවතින අපකීර්තිය ඉවත් කිරීමට සහ දැනුවත් කිරීමට අපි විශේෂ සැලකිල්ලක් දැක්විය යුතුයි."

පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය හරිනි අමරසූරිය මහත්මිය LGBTIQ ප්‍රජාව පිළිබඳ දැනුවත් කිරීම සඳහා මාර්ගගත පොදු සාකච්ඡා වල නිරත වන , LGBTIQ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින උපදේශිකාවක් ලෙස හඳුන්වා දිය හැක.

2021

2021 අගෝස්තු මාසයේදී ශ්‍රී ලංකා මනෝවිකිත්සක විද්‍යාලය සමරිසිභාවය මානසික රෝගයක් නොවන බව පිළිගනිමින් සමරිසි ලිංගික ක්‍රියාකාරකම් නිර්සාපරාධීකරණය කිරීම සඳහා ප්‍රකාශයක් නිකුත් කළේය. මෙම ප්‍රකාශය නිකුත් කර ඇත්තේ පොලිස් නිලධාරීන්ට පුහුණුවක් අතරතුර සමරිසිභාවය මානසික රෝගයක් බව මනෝ උපදේශිකාවක් යැයි කියාගන්නා තැනැත්තියක විසින් ප්‍රකාශ කරන ලද වීඩියෝ පටයකට පිළිතුරු වශයෙනි. සමාජ මාධ්‍ය තුළ පුළුල්ව ප්‍රචාරය වූ මෙම වීඩියෝව LGBTIQ ප්‍රජාවන්, ක්‍රියාකාරීන් සහ සිවිල් සමාජ සංවිධාන අතර කෝපයක් ඇති කිරීමට හේතු විය.

2021

වර්තමානයේ, රට තුළ LGBTIQ සංවිධාන ගණනාවක් තිබේ. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, ජනවාර්ගික අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය, කාන්තා සහ මාධ්‍ය සාමූහිකය, සහ ග්‍රාස්රූට්ඩ් ට්‍රස්ට් ඇතුළුව LGBTIQ අයිතිවාසිකම් සඳහා සහාය දක්වන සංවිධාන ද ඇත.

LGBTIQ ව්‍යාපාරය එය සමන්විත වන ආයතන සහ සංවිධාන සංචිතයෙන් පමණක් නොව එහි සාමූහික ක්‍රියාකාරීන්ගේ අනන්‍යතාවය අනුව ද විවිධ වේ. ජනවිකාස සැකැස්ම අනුව මෙම ව්‍යාපාරය රටෙහි විවිධත්වට මෙන් ම විශාල පාරසයක විහිදී පවතී. ආගම, වාර්ගිකත්වය, භාෂාව සහ රැකියාව අනුව විවිධ වූ පුද්ගලයින් මෙම ව්‍යාපාරය සැබවින්ම ඡේදනය කරයි.

### සම්පත් දායකත්වය ලබා දෙන්නාට සටහනක්

දැනට ශ්‍රී ලංකාවේ සේවය කරන LGBTIQ ප්‍රමුඛ සංවිධානඃ

- හාර්ට් ටු හාර්ට් (Heart to Heart)
- ජාතික සංක්‍රාන්ති සමාජභාවී පුද්ගයින්ගේ ජාලය (NTN)
- වෙනස සංක්‍රාන්ති පුද්ගයින්ගේ ජාලය
- Young Out Here (YOH)
- ප්‍රජා සුභසාධක සංවර්ධන අරමුදල (CWDF)
- චත්‍ර
- ජැෆ්නා සංගමය
- Equal Grounds

# සැසිය 06 වැදගත් වචන

PPT Slides භාවිතයෙන් සාකච්ඡාව

**කාලය**

මිනිත්තු 30

**ඉලක්ක කණ්ඩායම**

සියලුම කණ්ඩායම්

කණ්ඩායමකට සහභාගිවන්නන් 30 ක්

**අරමුණු**

මෙම සැසිය අවසානයේ, සහභාගිවන්නන්ට :

- SOGIESC හි විවිධත්වයට අදාළ ප්‍රධාන වචන (පාරිභාෂිත) නිවැරදිව නිර්වචනය කිරීමට සහ
- හානිකර, සෘණාත්මක හෝ භාවිතයට නොගත් වචන හඳුනා ගන්න හැකි වනු ඇත.

**සැකසුම**

PPT Slides භාවිතයෙන්

**පියවර**

- මෙම සැසියේදී, අදාළ යෙදුම් කිහිපයක තේරුම සොයා ගත හැකි බව පැහැදිලි කරන්න. ලිංගිකත්වය සහ සමාජභාවය පිළිබඳ අපගේ අවබෝධය ගැඹුරු වන විට SOGIESC හි විවිධත්වය පිළිබඳ පාරිභාෂිතය තවමත් පරිණාමය වෙමින් පවතින බව පැහැදිලි කරන්න. එම නිසා, අදාළ පාරිභාෂිතය පිළිබඳව යාවත්කාලීනව සිටීම වඩාත් සුදුසු ය.
- PPT Slides භාවිතා කරමින්, සෑම වචනයක්ම පෙන්වා සහභාගිවන්නන්ට මෙයින් අදහස් කරන්නේ කුමක්ද යන්න පැහැදිලි කිරීමට අවස්ථාවක් ලබා දෙන්න. වචනයට විවිධ අර්ථයන් හෝ පැහැදිලි කිරීම් තිබේදැයි සහභාගිවන්නන්ගෙන් විමසන්න. යම් එකඟතාවයක් ඇති වූ පසු ඊළඟ PPT Slides වෙත යන්න.
- සැසිය අවසානයේදී, LGBTIQ ප්‍රජාවට අදාළ යැයි සිතිය හැකි වෙනත් වචන තිබේදැයි සහභාගිවන්නන්ගෙන් අසන්න? ප්‍රාදේශීය භාෂාවල යම් නියමයන් හෝ අපහාසාත්මක පද තිබේදැයි සහභාගිවන්නන්ගෙන් අසන්න. කෙසේ වෙතත්, මෙය සමහර සහභාගිවන්නන්ට උත්ප්‍රේරක අත්දැකීමක් විය හැකි බවත්, සම්පත් දායකයා ලෙස, අනෙක් සහභාගිවන්නන් අපහසුතාවයට පත් නොකිරීමට වග බලා ගැනීමට ඔබට සිදු විය හැකි බවත් සලකන්න. සහභාගීවන්නන්ට ප්‍රකාශ කළ හැකි කිසියම් සෘණාත්මක වටිනාකම් සහිත විනිශ්චයක් නිසි ආකාරයෙන් ආමන්ත්‍රණය කිරීමට වග බලා ගන්න.
- පහත සටහන් කොටසේ, ඔබට PPT Slides වල සපයා ඇති වචන සහ ඒවායේ නිර්වචන සොයා ගත හැක.

## සටහන්

**සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයා**

සාමාන්‍ය හෝ සාම්ප්‍රදායික අර්ථයෙන් උපතේදී පවරා ඇති ලිංගිකත්වය සමඟ සමාජභාවය නොගැලපෙන පුද්ගලයෙක්.

සංක්‍රාන්ති සමාජභාවීය යනු නාම පදයක් නොව නාම විශේෂණයක් වන බැවින් සංක්‍රාන්තිකයෙක් යන වචනය භාවිත කිරීමෙන් වළකින්න.

**සංක්‍රාන්තිය**

පුද්ගලයෙකු තම සැබෑ සමාජභාවය සමඟ සම්මුඛ වීම සඳහා ඔවුන්ගේ සමාජභාවී ප්‍රකාශනය සහ ලිංගික ලක්ෂණ වෙනස් කරන ක්‍රියාවලිය මෙසේ හඳුන්වයි. කෙනෙකුගේ සමාජභාවී අනන්‍යතාවය ප්‍රකාශ කිරීම සඳහා ඇඳුම් ඇඳීම, හැඳුනුම්පත් ලේඛන වෙනස් කිරීම සහ වෛද්‍ය ක්‍රියා පටිපාටිවලට යොමු වීම මේ යටතේ ගත හැකිය.

**සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයා**

එනම්, ඔවුන්ගේ සැබෑ සමාජභාවී අනන්‍යතාවයට අනුකූල වන පරිදි තම ශරීරය වෙනස් කර ගැනීම සඳහා වෛද්‍ය සහ ශල්‍ය පටිපාටියන් අනුගමනය කළ අයෙකි. හෝර්මෝන ප්‍රතිකාරය, පියයුරු බද්ධ කිරීම හෝ ඉවත් කිරීම, කටහඬ වෙනස් කිරීමේ සැත්කම් සහ ලිංගික අවයව නැවත සැකසීමේ ශල්‍යකර්ම යනු පුද්ගලයෙකුට සමාජභාවයට ගැලපෙන පරිදි තම සිරුර වෙනස් කළ හැකි ක්‍රම කිහිපයකි.

**උඩුකයෙකි සිදු කරන ශල්‍යකර්ම**

මෙය සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයකු තම සමාජභාවී අනන්‍යතාවයට අනුකූල වන පරිදි තම පපුව/පියයුරු වෙනස් කිරීමට සිදු කරනු ලබන සැත්කමකි. සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවකට පියයුරු බද්ධ කරන සැත්කම සිදු කරනු ඇත. සංක්‍රාන්ති සමාජභාවී පුරුෂයෙකුට පියයුරු ඉවත් කිරීමේ සැත්කමක් සිදු කරනු ඇත.

**යටිකයෙහි සිදුකරන ශල්‍යකර්ම**

සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයකු තම සමාජභාවය සමඟ සම්මුඛ වීම සඳහා තම ලිංගේන්ද්‍රිය වෙනස් කිරීමට සැත්කමක් කරනු ඇත. මෙය 'ලිංගිකත්වය නැවත පැවරීමේ සැත්කමක්' හෝ 'ලිංගභේදය තහවුරු කිරීමේ සැත්කමක්' ලෙසද හැඳින්වේ.

**MSM**

MSM යනු පිරිමින් සමඟ ලිංගිකව හැසිරෙන පිරිමින් යන්නයි. මෙම වචනය HIV වැලැක්වීමේ වැඩසටහන් වල භාවිතා කරනුයේ මිනිසුන්ව ඔවුන්ගේ ලිංගික හැසිරීම් මත පදනම්ව වර්ගීකරණය කිරීමටයි. ඊට හේතුව එය HIV සම්ප්‍රේෂණය වීමේ අවදානම ඉහළ යාමට හේතුව ලිංගික හැසිරීම් වීමයි. සමරිසි සහ ද්විරිසි පිරිමින් සහ පිරිමි ලිංගික වෘත්තිකයන් MSM කාණ්ඩයට අයත් වේ. තවද විෂම රිසි ලෙස හඳුනාගන්නා නමුත් පිරිමින් සමඟ ලිංගිකව හැසිරෙන පිරිමින් ද සිටින අතර ඔවුන් ද මෙම කාණ්ඩයට අයත් වන බව සැලකිල්ලට ගත යුතු ය.

**නච්චි**

නච්චි යනු ශ්‍රී ලංකාවේ ස්ත්‍රී ලාලිත්‍යය ඇති පුරුෂයින් හැඳින්වීමට භාවිතා කරන යෙදුමකි. මෙය සංක්‍රාන්ති සමාජභාවී ස්ත්‍රීන් සහ ස්ත්‍රී ලාලිත්‍යය ඇති පුරුෂ සමාජය තුළින් ඉස්මතු වූ යෙදුමකි. ස්ත්‍රී ලාලිත්‍ය ඇති පුරුෂයන්, සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවන් සහ සමරිසි පිරිමින් , නච්චි ලෙස හඳුනාගත හැකිය.

**නපුංසක**

සිංහල භාෂාවේ ඍජු පරිවර්තනයට අනුව නපුංසක යනු සමාජභාවයක් නොමැතිකමයි. කෙසේ වෙතත්, ව්‍යවහාරයේදී නපුංසක යන්න තුන්වැනි ලිංගයක්, හෝ තුන්වැනි සමාජභාවයක් යන අරුතින් භාවිතා වේ. සමහර පුද්ගලයන් මෙම යෙදුම අවමන් සහගත යෙදුමක් ලෙස සලකයි.

**සංක්‍රාන්ති සමජභාවී පුරුෂයන්**

උපතේදී ස්ත්‍රියක් ලෙස පවරන ලද හා හඳුනා ගන්නා ලද නමුත් සැබෑ සමාජභාවය හෝ සමාජභාවීය අනන්‍යතාව පිරිමියෙකුට සමාන වන පුද්ගලයෙකි. (F2M) හෝ 'ගැහැණු සිට පිරිමි' ලෙසද හැඳින්වේ.

**සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවක්**

උපතේදී පුරුෂයෙකු ලෙස පැවරී ඇති නමුත් සැබෑ සමාජභාවය හෝ සමාජභාවීය අනන්‍යතාව ස්ත්‍රියකගේ අනන්‍යතාවයට සමාන වූ පුද්ගලයෙකි. (M2F) හෝ 'පිරිමි සිට ගැහැණු' ලෙසද හැඳින්වේ.

**සිස් සමාජභාවය පුද්ගලයා**

උපතේදී පවරන ලද තම ලිංගිකත්වය හා සම්බන්ධ වූ සම්මතයට සිය සමාජභාවී අනන්‍යතාවය අනුරූප වන පුද්ගලයෙකි. නිදසුනක් වශයෙන්, උපතේදී පුරුෂයෙකු ලෙස නියම කර ඇති සහ තමාව පුරුෂයෙකු ලෙස හඳුනා ගන්නා පුද්ගලයෙකු.

**අන්තර්ලිංගික**

පිරිමි සිරුර සහ කාන්තා ශරීරය යන නිර්වචනවලට හරියටම නොගැලපෙන ලිංගික ලක්ෂණ ඇති අයෙකි. ඔවුන්ට පිරිමි සහ ගැහැණු යන දෙපාර්ශවයේ ම ලිංගික ලක්ෂණ තිබිය හැකිය.

**සොඩොමි**

කලාතුරකින් අර්ථ දක්වා ඇති නමුත් මිනිසුන් දෙදෙනෙකු අතර ගුද සංසර්ගය හැඳින්වීමට භාවිතා කරන බයිබල් සම්භවයක් සහිත වචනයකි. Sodomy සහ buggery යනු නීතිමය භාෂාවේ බොහෝ විට භාවිතා වන සමාන වචන වේ. මෙම වචන සමරිසිභාවය පිළිබඳ නිෂේධාත්මක අර්ථයන් ඇති කරන අතර ඒවා භාවිතයට නොගනී.

**ලිංගික දිශානතිය**

ලිංගික දිශානතිය තීරණය වන්නේ යමෙකු චිත්තවේගී, රෝමාන්තික සහ ලිංගික ආකර්ෂණය අත්විඳින ආකාරය අනුව ය. සමරිසි, විෂමරිසි, ද්විරිසි, සර්වරිසි සහ අලිංගික යනු පොදුවේ හඳුනාගත් ලිංගික දිශානතීන් ය.

**ඩිමිසෙක්ෂුවල්**

Demisexual ද ලිංගික දිශානතියකි. Demisexual පුද්ගලයන්ට යමෙකු කෙරෙහි ලිංගික ආකර්ෂණයක් දැනෙන්නේ ඔවුන් පුද්ගලයා සමඟ චිත්තවේගී බැඳීමක් ඇති විට පමණි.

**වෙනත් ලිංගික දිශානතියක් ගැන ඔබ දන්නවාද?**

**සමරිසි කාන්තා**

චිත්තවේගීව, රෝමාන්තිකව සහ ලිංගිකව වෙනත් කාන්තාවන්ට ආකර්ෂණය වන කාන්තාවක්.

**ද්විරිසි පුද්ගලයෙක්**

ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයේ පුද්ගලයන් වෙත චිත්තවේගීයව, ප්‍රේමණීයව හා ලිංගිකව ආකර්ෂණය වන පුද්ගලයෙකි. නිදසුනක් වශයෙන්, පිරිමි සහ ගැහැණු යන දෙපාර්ශවයටම ආකර්ෂණය වන පිරිමියෙක්.

### Bicurious පුද්ගලයෙක්

මෙයින් අදහස් කරන්නේ ද්වීරිසි භාවය ප්‍රශ්න කරන හෝ ගවේෂණය කරන පුද්ගලයෙකුයි. ස්ත්‍රී පුරුෂ දෙපිරිසටම අයත් කෙනෙකුගේ චිත්තවේගීය, රෝමාන්තික සහ ලිංගික ආකර්ෂණය පිළිබඳ ඇතිවන කුතුහලයක් මෙයට ඇතුළත් වේ.

### බුච්

පුරුෂ සමාජභාවී ප්‍රකාශනයක් ඇති සමරිසි කාන්තාවන් මෙසේ හැඳින් වේ. ඔවුන් 'ටොම්බෝයි' හෝ 'ඩයික්' ලෙසද හැඳින්වේ.

පිරිමින් ලෙස හැසිරෙමින් සබඳතා තුළ පුරුෂ සහ ස්ත්‍රී ද්විමය ගතිකතාවයන් පවත්වා ගෙන යන බවට චෝදනා කරමින් බුච් සමරිසි කාන්තාවන් ඉතිහාසය පුරාම සමාජය විසින් කොන් කර තිබේ . කෙසේ වෙතත්, සමාජභාවී අනන්‍යතා සහ ප්‍රකාශන එකිනෙකාට ආවේණික වන අතර, සියලුම අනුකූල නොවන අනන්‍යතාවලට ගරු කළ යුතුය.

සමහර ස්ත්‍රී ප්‍රකාශන/ලක්ෂණ ඇති බුච් සමරිසි කාන්තාවන් baby dyke හෝ soft butch ලෙස හැඳින්විය හැක.

### ඩ්‍රැග් ක්වීන් (Drag Queen)

සාමාන්‍යයෙන් හඳුන්වනු ලබන්නේ කාන්තා ඇඳුම් අඳින පිරිමින් ය. 'ඩ්‍රැග් කලා ආකෘතියක් ලෙස සැලකේ. 'ඩ්‍රැග් ක්වීන්' යනු නිතිපතා ඩ්‍රැග් ලෙස කටයුතු කරනා තැනැත්තෙකි.

කාන්තාවන්ට පිරිමි ඇඳුම් ඇඳීමට හෝ ඇඳගෙන යාමටද හැකිය.

1920 ගණන්වල හොඳම ස්ත්‍රී චරිතයට හෝ ඇඳුමට සම්මාන පිරිනැමූ සාද පැවති කාලයේ සිට 'ඩ්‍රැග් සංස්කෘතියට ලෝකයේ දිගු ඉතිහාසයක් ඇත.

ලංකාවේ ඩ්‍රැග් ක්වීන්ලා ගැන ඔබ දන්නවාද?

### Coming out

පිටතට පැමිණීම යනු පුද්ගලයෙකුගේම ලිංගික දිශානතිය හෝ සමාජභාවය අන්‍යයන්ට විවෘත කිරීම හෝ ප්‍රසිද්ධියේ බෙදා ගැනීමයි. බොහෝ දෙනෙකුට මෙය එක් වරම සිදු වූවක් නොව ක්‍රියාවලියකි. නිදසුනක් වශයෙන්, පුද්ගලයෙකු ආරම්භයේදී විශ්වාසදායක මිතුරන්ගේ කවයකට පමණක් සිය සමාජභාවය හෙළි කිරීමට හැකි ය.

### Closeted

“Closeted”, LGBTIQ ප්‍රජාව තුළ ඔවුන්ගේ ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී පුරුෂ භාවය ප්‍රසිද්ධියේ හෝ විවෘතව බෙදා නොගන්නා පුද්ගලයන් විස්තර කරයි. මෙය ‘in the closet’ ලෙසද හැඳින්වේ.

### Queer

තනිකරම විෂමරිසි නොවන පුද්ගලයන් විස්තර කරන පොදු සර්වනාම පදයකි. කුවියර යන පදය (LBGTIQ හි Q යන්න), ලිංගිකත්වය යනු ස්වාධීන සහ අන්‍යෝන්‍ය වශයෙන් වෙන් වූ කාණ්ඩවල එකතුවක් නොව වර්ණාවලියක් බව පිළිගනී. queer යන වචනය භාවිතය සමරිසි පිරිමි, සමරිසි කාන්තා සහ ද්වීරිසි යන්නෙන් ඔබ්බට, එනම් එවැනි කණ්ඩායම්වලට හෝ ලේබලවලට නොගැලපෙන පුද්ගලයන්ට, වෙනත් විකල්ප විවෘත කරයි.

කුවියර යන පදය අතීතයේදී අපහාසාත්මක යෙදුමක් ලෙස භාවිතා කරන ලදී. මෙම යෙදුම LGBTIQ ප්‍රජාව විසින් නැවත භාවිතයට ගැණීම වර්ධනය වී ඇත.

## Mx

Mx යනු Mr' and Ms' වෙනුවට භාවිතා කළ හැකි උදාසීන සමාජභාවයක් සහිත සර්වනාමයක් වන අතර එය ද්විමය සමාජභාවය හඳුනා නොගන්නා පුද්ගලයින් විසින් භාවිතා කරනු ලැබේ.

## Passing (පාසින් (ග්))

LGBT+ පුද්ගලයෙකු ඍජු හෝ cisgender ලෙස සලකන හෝ උපකල්පනය කරන ආකාරය මෙමගින් විස්තර කරයි. මෙම යෙදුම බොහෝ විට භාවිතා වන්නේ සිස් සමාජභාවී යැයි සමාජය විසින් සලකනු ලබන හෝ සමාජය විසින් උපකල්පනය කරන සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් සම්බන්ධයෙන් ය. සමහර අය මෙලෙස සමාජය විසින් තමන් පිළිබඳව දකින ආකාරයට ප්‍රිය කරන අතර, තවත් සමහර අය එයින් අපහසුතාවට පත් වේ.

# සැසිය 07 SOGIESC සහ ශ්‍රී ලංකා මාධ්‍ය විවිධත්වය

*සහභාගිවන්නන් ඔවුන්ගේ අත්දැකීම් ආවර්ජනය කර කණ්ඩායම සමඟ බෙදා ගනී. slides භාවිතයෙන් සිදු කරන දේශනයකි.*

කාලය

විනාඩි 30 ක්

ඉලක්ක කණ්ඩායම

සියලුම කණ්ඩායම්

කණ්ඩායමකට සහභාගිවන්නන් 30 ක්

**අරමුණු**

මෙම සැසිය අවසානයේ, සහභාගිවන්නන්ට

- LGBTIQ පුද්ගලයන් සම්බන්ධයෙන් මාධ්‍ය විසින් ප්‍රචාරය කරන තොරතුරු විවේචනාත්මකව පරීක්ෂා කිරීමට හැකි වනු ඇත.

**අවශ්‍ය උපකරණ**

සහභාගිවන්නන් සඳහා කඩදාසි සහ පෑන්

**සකස් කිරීම**

PPT Slides භාවිතයෙන්

පියවර

සමාජයේ LGBTI පුද්ගලයන් පිළිබඳ සෘණාත්මක අදහස් පවතින බව සහභාගිවන්නන්ට පැහැදිලි කිරීමෙන් මෙම කෙටි සාකච්ඡාව ආරම්භ කරන්න. මේවාට දුර්මත සහ ඒකාකෘති ඇතුළත් වේ. දුර්මත යනු වැරදි අදහසක්, මතයක් හෝ වැරදි අවබෝධයකි. ඒකාකෘතියක් යනු කිසියම් පුද්ගලයෙකු හෝ කිසියම් දෙයක් පිළිබඳව කිසියම් අදහසක් පුළුල් ලෙස පිළිගෙන සිටීම හෝ සාමාන්‍යකරණය කරගෙන සිටීම යි. ලිංගික දිශානතිය පිළිබඳ දුර්මතයකට උදාහරණයක් නම් විෂමරිසිත්වය හැර අනෙකුත් සියලුම ලිංගික දිශානතීන් 'අස්වාභාවික' බවයි. සමරිසි පිරිමින් පිළිබඳ ඒකාකෘතියක් නම් ඔවුන්ට ස්ත්‍රී සමාජභාවී ප්‍රකාශන තිබීම යන්නයි. මෙම දුර්මත සහ ඒකාකෘතිවල ප්‍රතිඵලයක් ලෙස LGBTI ප්‍රජාවන් අපකීර්තියට හා වෙනස් කොට සැලකීම්වලට ලක් වේ. මෙම දුර්මත නිසා ඔවුන් හිංසාවන්ට හා අපයෝජනවලට ලක් වේ.
මෙම වැරදි වැටහීම් සහ ඒකාකෘතීන් පතුරුවන ප්‍රධාන තොරතුරු මූලාශ්‍රය ලෙස මාධ්‍ය හැඳින්විය හැක. ශ්‍රී ලංකාවේ මාධ්‍ය SOGIESC හි විවිධත්වය නිරූපණය කරන ආකාරය පිළිබඳව ඔබට දැන් සාකච්ඡාවක් කිරීමට ඇති බව පැහැදිලි කරන්න.

- සහභාගිවන්නන්ට ශ්‍රී ලංකාවේ මාධ්‍යවල දැක ඇති අමතක නොවන කුවියර චරිතය කවුද යන්න හෝ ශ්‍රී ලංකාවේ මාධ්‍යවලින් LGBTIQ පුද්ගලයන් ගැන ඔවුන් කියවූ හෝ අසා ඇති තොරතුරු ලිවීමට ඉල්ලා සිටින්න. මෙම ප්‍රශ්නය පිළිබඳ සිතීමට ඔවුන්ට විනාඩි 5ක කාලයක් ලබා දෙන්න.

- සහභාගිවන්නන්ගෙන් ඔවුන් ලියා ඇති දේ අන් අය සමඟ බෙදා ගැනීමට ආරාධනා කරන්න. එම රූපය/චරිතය/තොරතුරු LGBTI පුද්ගලයන් පිළිබඳ ඔවුන් තුල වූ අවබෝධය කෙරෙහි බලපෑ ආකාරය ද අසන්න. ඔවුන්ගේ මතය අනුව මෙය සෘණාත්මක, ධනාත්මක හෝ මධ්‍යස්ථ නිරූපණයක් දැයි අසන්න

- සහභාගිවන්නන් ඔවුන්ගේ අත්දැකීම් බෙදාගත් පසුව, සමහර අවස්ථාවල දී අපි කෙතරම් උගත් වුවත්, අප මාධ්‍යවලින් දකින දේ සහ අපට ලැබෙන තොරතුරු අප තුළ අගතීන් සහ පක්ෂග්‍රාහීකම් ඇති කළ හැකි බව ඔවුන්ට මතක් කර දෙන්න. එබැවින් අප භාවිතා කරන තොරතුරුවල නිර්වද්‍යතාවය ප්‍රශ්න කිරීම සහ විශ්වාසදායක මූලාශ්‍ර භාවිතයෙන් කරුණු දෙවරක් පරීක්ෂා කිරීම වැදගත් බව පෙන්වා දෙන්න.

- ශ්‍රී ලංකාවේ මාධ්‍ය මගින් ප්‍රචාරණය කරන ලද සමහර නිරූපණ ඉස්මතු කරන PPT Slides සහභාගිවන්නන්ට පෙන්වන්න. PPT Slides අන්තර්ගතය පහත සටහන් කොටසෙන් සොයා ගත හැක.

සටහන්

**ද අයිලන්ඩ් - 1999**

සමරිසි කාන්තාවන් දූෂණය කිරීම දිරිගන්වමින් පී අලස් විසින් ලිපියක් ලිවීය. කුවියර් මිනිසුන්ට එරෙහිව අපරාධ කළ අපරාධකරුවන් නිදහස් කරන ලෙස එම ලිපියෙන් ඉල්ලා සිටියේය. සමාජ ස්ක්‍රියාකාරිකයෙකු වන ෂර්මන් ඩි රෝස් ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයට පැමිණිල්ලක් කළ නමුත් සභාව එම පැමිණිල්ල ප්‍රතික්ෂේප කර ෂර්මන්ට දඩ නියම කළේය.

**සන්ඩේ ඔබ්සර්වර්**

2011

LGBT ප්‍රමුඛ සමහර රාජ්‍ය නොවන සංවිධාන HIV/AIDS වැළැක්වීමේ වැඩසටහන්වල නිරතව සිටින බව මවාපාමින්, ශ්‍රී ලංකාවේ සමරිසිභාවය ප්‍රවර්ධනය කරන බවට මෙම පුවත්පතේ කතුවැකිය මඟින් චෝදනා කළේය.

**ලක්බිම 2013**

සමවයස් දරුවන්ට HIV/AIDS පිළිබඳ අධ්‍යාපන වැඩමුළුවක් අනුරාධපුරයේ දී පැවැත්වූ අතර එය දරුවන්ගේ මනස වෙනස් කරමින් ඔවුන් සමරිසි පුද්ගලයින් බවට පත්කිරීමට උත්සාහ කරන බව පුවත්පතේ ලිපියක් මුද්‍රණය කළේය.

**කළම්බු ටෙලිග්‍රාෆ් 2016**

බොදු බල සේනා මහලේකම් - ගලගොඩඅත්තේ ඥානසාර හිමි: "අද රට පාලනය කරන්නේ සමරිසියින් පිරිසක්. මෙය ඉතා බරපතල ලෙස සැලකිල්ලට ගත යුතු කාරණයක්"
මෙසේ රජය විවේචනය කළ අතර සමරිසිභාවය නපුංසකකම සමඟ සමාන කළේය

<u>සාරාංශය</u>

මාධ්‍ය විසින් LGBTI පුද්ගලයන්ට හානිකරවන දුර්මත සහ ඒකාකෘති ප්‍රචලිත කරයි. මෙම ක්‍රියාවන් කුවියර ප්‍රජාව සම්බන්යෙන් දිගුකාලීන ඍණාත්මක ප්‍රතිවිපාක ඇති කළ හැකිය. මෙසේ මහජන මතයට බලපෑම් කිරීම විවිධ SOGIESC සහිත පුද්ගලයන්ට එරෙහිව ඇති සීමාකිරීම් සහ වෙනස්කොට සලකන නීති වෙනස් කිරීම අභියෝගාත්මක කරයි. මෙවැනි මාධ්‍ය තුළ පවතින ඍණාත්මක මතවාද දුරු කිරීම සඳහා LGBTIQ පිළිබඳ සංවේදීතාවයක් මාධ්‍යවේදීන් සහ ආයතන තුළ ඇති කළ හැකි අතර, LGBTIQ ප්‍රජාව පිළිබඳ ධනාත්මක සිතුවිලි ඔවුන් තුළ ඇති කළ හැකිය. කෙසේ වෙතත්, සමරිසි වෛරී ප්‍රකාශයන්ට එරෙහිව ක්‍රියාත්මක වන යාන්ත්‍රණයක් උදාහරණයක් ලෙස මාධ්‍ය මාර්ගෝපදේශනය සහ නීති වැනි ආයතනික යාන්ත්‍රණ ද තිබිය යුතුය.

# සැසිය 08 (ශ්‍රී ලංකාවේ විවිධ SOGIESC පුද්ගලයින්ට වෙනස් කොට සැලකීම සහ ප්‍රචණ්ඩත්වය

PPT Slides භාවිතා කරමින් දේශනය

**කාලය**

විනාඩි 30 ක්

**ඉලක්ක කණ්ඩායම**
සියලුම කණ්ඩායම්

කණ්ඩායමකට සහභාගිවන්නන් 30 ක්

**අරමුණු**

මෙම සැසිය අවසානයේ, සහභාගිවන්නන්ටඃ

- රාජ්‍ය ක්‍රියාකාරීන් විවිධ SOGIESC ඇති පුද්ගලයින්ට එරෙහිව විසින් සිදු කරනු ලබන ප්‍රචණ්ඩත්වයේ සහ වෙනස් කොට සැලකීමේ ආකාර හඳුනා ගැනීමට
- විවිධ SOGIESC ඇති පුද්ගලයන්ට එරෙහිව පවත්වාගෙන යන ප්‍රචණ්ඩත්වයේ ආකාර හඳුනා ගැනීමට
- යුක්තිය සඳහා ප්‍රවේශය සහ වෙනස්කොට සැලකීම් හා ප්‍රචණ්ඩත්වය අතර ඇති සම්බන්ධය ප්‍රකාශ කිරීමට

  හැකියාව ලැබෙනු ඇත.

**සැකසීම**

- PPT Slides භාවිතා කරමින්

**පියවර**

- මෙම කෙටි දේශනයේදී ඔබ විසින් ශ්‍රී ලංකාවේ LGBTIQ පුද්ගලයන් මුහුණ දෙන විවිධ වෙනස්කම් කිරීම් පිළිබඳව බෙදා ගැනීමට උත්සාහ කරන බව සලකන්න.
- වෙනස් කොට සැලකීම යනු ඔවුන් සතු යම් ලක්ෂණයක් මත පදනම්ව විවිධ කාණ්ඩවල පුද්ගලයන්ට අසාධාරණ හෝ අගතිගාමී සැලකීම බව පැහැදිලි කිරීම මගින් මෙම දේශනය ආරම්භ කරන්න. නිදසුනක් වශයෙන්, 1950 ට පෙර ඇමරිකා එක්සත් ජනපදයේ කළු ජාතිකයින්ට සුදු ජාතිකයින් හා සමානව අයිතිවාසිකම් නොතිබූ බව අපි දනිමු. ඔවුන්ට සුදු ජාතිකයින් සිටින එකම පාසල්වල ඉගෙනීමට, එකම ප්‍රවාහන මාධ්‍ය  භාවිතා කිරීමට හෝ සුදු ජාතිකයින් සමඟ එකම අවන්හල්වලට යාමට අවසර නොතිබුණි.
- වෙනස් කොට සැලකීම පෞද්ගලික පුද්ගලයන් මෙන්ම රජය විසින් ද සිදු කළ හැකිය. නමුත් රජය මිනිසුන්ට වෙනස් කොට සැලකීම වැළැක්වීමට නීති තිබේ. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වැනි ව්‍යවස්ථාවේ සඳහන් වන්නේ සියලු මිනිසුන් සමාන බවත් වෙනස් කොට සැලකීමෙන් නිදහස් විය යුතු බවත්ය. මෙය මූලික අයිතිවාසිකමකි. රජය ඔබට ස්ත්‍රී පුරුෂ භාවය, ජාතිය, ආගම හෝ එවැනි හේතු මත වෙනස්කම් කරන්නේ නම්, ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කිරීමෙන් ඔබට ඒ සඳහා පිළියම් ලබා ගත හැකිය.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 වැනි ව්‍යවස්ථාවේ සඳහන් වන පරිදි ලිංගික දිශානතිය සහ සමාජභාවය මත පදනම්ව වෙනස් කොට සැලකීමෙන් වළකන බව ශ්‍රී ලංකාවේ රජයේ නියෝජිතයන් පිළිගෙන ඇතත්, LGBTIQ පුද්ගලයන්ට වෙනස් කොට සැලකීම සඳහා ශ්‍රී ලංකාව තුළ බොහෝ නීති සහ භාවිතයන් තිබේ. දැන් අපි මෙම නීති සහ භාවිතයන් කිහිපයක් විමසා බලමු.

**සටහන්**

ශ්‍රී ලංකාවේ LGBTIQ පුද්ගලයන්ට වෙනස්කම් කරන නීති සහ භාවිතයන්

**දණ්ඩ නීති සංග්‍රහය 1883**

**365 වගන්තිය ඃ අස්වාභාවික වැරදි**

365 වගන්තිය ""ස්වභාව ධර්මයේ නියෝගයට එරෙහිව ස්වේච්ඡාවෙන් කායික සංසර්ගයේ යෙදීම" අපරාධයක් ලෙස දක්වා ඇත. මෙම පදවල තේරුම පැහැදිලිව නිර්වචනය කර නොමැති වුවද, මෙම නීතිය මගින් සමරිසි සහකරුවන් අතර ලිංගික හැසිරීම අපරාධයක් ලෙස පොදුවේ වටහාගෙන ගෙන ඇත.

**දණ්ඩ නීති සංග්‍රහය 1883**

**365අ වගන්තිය : පුද්ගලයන් අතර සිදු වන දරුණු අශෝභන ක්‍රියා**

365අ වගන්තිය "තදබල අශෝභන" ක්‍රියාවන් ලෙස හඳුන්වන අතර එබඳු ක්‍රියාවකට පාර්ශවකරුවෙකු වන හෝ එබඳු ක්‍රියාවක් යම් පුරුෂයෙකු ලවා කරවන හෝ කරවීමට තැත් කරන පුරුෂයෙකු වරදකට වරදකාරී විය යුතු " බව සලකයි.

මෙම විධිවිධානය පිරිමින් සහ කාන්තාවන් අතර ක්‍රියා සඳහා ද අදාළ වේ, මෙම කොටසට අනුව වරද සංතෘප්ත කිරීමට අදාළ සමාජභාවය 1995 දී හි මධ්‍යස්ථ බවට පත් කරන ලදී. ඊට පෙර මෙය පිරිමින්ට පමණක් අදාළ විය.

**දණ්ඩ නීති සංග්‍රහය 1883**

**399 වගන්තිය - අනෙකකු ලෙස පෙනී සිටීමෙන් වංචා කිරීම්**

399 වගන්තිය අනුව වෙනත් අයෙකු ලෙස පෙනී සිටිමින් වංචා කිරීම අපරාධයක් ලෙස සලකනු ලබන අතර, මේ සඳහා වසර 3 දක්වා සිරදඬුවමක් හා දඩයක් නියම කෙරේ. සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයින් ඉලක්ක කර ගැනීම සඳහා මෙම විධිවිධාන යොදා ගනී.

**පාදඩ ආඥා පනත**

මෙම නීතිය මගින් ප්‍රසිද්ධියේ අශික්ෂිත ක්‍රියා සිදු කිරීම සහ ලිංගික වෘත්තියේ යෙදීමේ අරමුණෙන් සැරිසැරීම තහනම් කෙරේ.

මෙම නීති සාමාන්‍ය තත්ත්ව යටතේ කලාතුරකින් ක්‍රියාත්මක වුවද, LGBTIQ පුද්ගලයින්ට හිරිහැර කිරීමට, කප්පම් ගැනීමට සහ අපයෝජනය කිරීම වැනි දෑ සිදු කිරීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන පුද්ගලයින් විසින් මෙම නීතිය භාවිතා කරයි.

2014 වර්ෂයේ දී, එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා මානව හිමිකම් භාවිතය පිළිබඳ වාර්තාව පෙන්වා දුන්නේ,

පොලිසිය විසින් LGBTI ප්‍රජාවේ සාමාජිකයින් අත්අඩංගුවට ගෙන ඔවුන්ට එරෙහිව සක්‍රීයව නඩු පැවරීම සිදු නොකරන අතර, කොළඹ සහ අනෙකුත් ප්‍රදේශවල සමරිසි කාන්තාවන්ට හා LGBTI ප්‍රජාවට අයත් අනෙක් පුද්ගලයන්ට හිරිහැර කිරීම සහ මුදල් හෝ ලිංගික අල්ලස් ලබා ගැනීම සහ පහර දීම සිදු කරන බවයි".

සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් සහ සමාජභාවය පිළිබඳ සම්මතයන්ට අනුකූල නොවන පුද්ගලයින් බිය ගැන්වීමට, ප්‍රශ්න කිරීමට, අත්අඩංගුවට ගැනීමට සහ රඳවා තබා ගැනීමට පාදඩ ආඥාපනත සහ දණ්ඩ නීති සංග්‍රහයේ 399 වන වගන්තිය භාවිතා කරනු ලැබේ. ලිංගික වෘත්තිකයන්ට හිරිහැර කිරීම සඳහා ද පාදඩ ආඥාපනත යොදා ගැනේ.

සංක්‍රාන්ති සමාජභාවීය කාන්තාවන් නීතිය ක්‍රියාත්මක කරන ආයතන මගින් අපයෝජනයට සහ හිරිහැරවලට ගොදුරු වීමට බොහෝ ඉඩකඩ ඇත්තේ ය. ඊට හේතුව ඔවුන් සංක්‍රන්ති සමාජභාවී පුද්ගලයින් බව ඔවුන්ගේ පෙනුමෙන් බොහෝ විට පෙනෙන බැවිනි. අනෙක් අතට, සමරිසි පිරිමි, ද්විරිසි සහ සමරිසි කාන්තාවන් සිස් සමාජභාවී ලෙස පෙනුමෙන් හඳුනාගනී. ස්ත්‍රීත්වය පහත් දෙයක් ලෙස සලකන පීතෘමූලික ආකල්ප හේතුවෙන් සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවන් එසේ වෙනස්කොට සැලකීම්වලට මුහුණ දෙයි. පවුලෙන් ප්‍රතික්ෂේප කිරීම සහ සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවන් සඳහා අධ්‍යාපනය සහ රැකියා සඳහා ඇති අවස්ථා සීමිත වීම තුළින් ඔවුන්ගේ ආර්ථික, සමාජීය සහ මූල්‍ය සුරක්ෂිතභාවය අහිමි කරයි, ඔවුන්ගේ ජීවිත අවදානමට ලක් වේ.

ශ්‍රී ලංකාවේ සංක්‍රාන්ති සමාජභාවී ලිංගික වෘත්තිකයන්ගෙන් සමන්විත ඉලක්කගත කණ්ඩායම් 3ක් සමඟ සම්මුඛ සාකච්ඡා 24ක් පවත්වමින්, සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවන්ට එරෙහිව සිදු කරන පොලිස් ප්‍රචණ්ඩත්වය පිළිබඳ ව Andrea Nichols විසින් ඩාන්ස් පොන්නයා ඩාන්ස් (Dance Ponnaya Dance) ශ්‍රී ලංකාවේ සංක්‍රාන්ති සමාජභාවී වෘත්තිකයන්ට එරෙහිව පොලිස් අපයෝජනයන්' (2010) ලෙස පර්යේෂණ පත්‍රිකාවක් සම්පාදනය කරන ලදී. එය වාචික, ශාරීරික සහ ලිංගික අපයෝජනයන් මෙන්ම වෙනස් කොට සැලකීම් පිළිබඳව ද ඉස්මතු කර පෙන්වයි. ප්‍රතිචාර දැක්වූවන්ගෙන් සමහර උපුටා ගැනීම් පහත දැක්වේ.

*"දැන් ඔවුන් (පොලිසිය) ඔබව පාරේදී දුටුවත් "පොන්නයා, පොන්නයෝ, ඔයා මොකද කරන්නේ?" අරකයි මේකයි, ඔව්, "පොන්නයා ජීප් එකට නගින්න." යැයි පවසයි. ඉතින් පොලිසිය ඒකයි අරකයි කියමින් අපිට කුණුහරුපෙන් බනිනවා, හේතුවක් නැතුව රිමාන්ඩ් කරනවා . දැන් පොලිසියට අපිව දිරවන්නේ නෑ. ඒ තරමට ම අපිව ඔවුන්ට තිත්තයි, අපිටත් ඔවුන්ව දරාගන්න බෑ. අපිව ඔවුන්ට හරිම පිළිකුල්. ඒක නිසා බයට පත්වෙනවා."*

*"පොලිසියෙනුත් අපිට ඕන තරම් හිරිහැර කරනවා. මොනවා හරි ගන්න පාරට බැස්සත් සමහර වෙලාවට අපිව අරන් ගිහින් ගහලා, හිරේට දාලා පහුවදා උදේ අපිව ආපහු එවන අවස්ථාත් තියෙනවා."*

*"පොලිසියෙන් මට ලොකු අසාධාරණ, අයුක්තිසහගත කටයුතු සිද්ධ වුණා. මම ලස්සන ඇඳුමක් ඇඳගෙන සිටියා, ඒ වගේම මට පියයුරු හා දිගු කෙස් සහිතයි. එදා මම ගැහැනියක් වගේ. එදා උදේ රේඩියෝ එක දාගෙන මට ඒ (ගීත)වලට නටන්න කිව්වා, මම මට පුළුවන් විදිහට නැටුවා. (පොලිසිය) මගේ මේ (පියයුරු)තදින් ස්පර්ශ කලා.*

*"දැන් අපි රෑට එලියට යනකොට කොල්ලෝ අපිව අරගෙන ගිහින් අපිට ගහලා සල්ලි සහ රන් ආභරණ අරගෙන යනවා, අපි ඒ ගැන පොලිසියට දන්වන විට කිසිම පියවරක් ගන්නේ නැහැ. ඔවුන් "හා හාහ්, එළියට යන්න. පලයන් එළියට!" කියලා අපිව එළවනවා*

*"ඒක වෙන්නෙ මෙහෙමයි. මගේ සහෝදරයාගේ ගෙදරින් යමක් හොරකම් කරලා, ඒකට මම පොලිසියට ගියා. එවිට ජීප් එකේ හිටපු නිලධාරීන් දෙන්නෙක් මට කතා කළා. "ඔයා අපි එක්ක ඉන්නේ නැත්නම් (ලිංගිකව) අපි ඔයාව කූඩුවට දානව කියලා," ඔවුන් කීවා.*

Equal Ground විසින් මානව හිමිකම් කමිටුවේ (2014) 110 වැනි සැසිවාරයට ඉදිරිපත් කළ Shadow Report හි LGBTIQ පුද්ගලයන්ට වෙනස් කොට සැලකීම් සහ සිදු කල අපයෝජනයන් පිළිබඳ සිදුවීම් කිහිපයක් ඇතුළත් කර ඇත. LGBTI පුද්ගලයන් බොහෝමයක් අත්අඩංගුවට ගැනීම් සිදු වන්නේ චෝදනා ගොනු කිරීමට නොව අල්ලස් ගැනීම්, බිය වැද්දීම්, කප්පම් ගැනීම්, ප්‍රචණ්ඩත්වය හෝ බලහත්කාරයෙන් ලිංගික අවශ්‍යතා සපුරා ගැනීම්වලට බව එහි දී පෙන්වා දෙන ලදී. නීතිය බලාත්මක කරන්නන් විසින් එසේ සිදුකරන හිරිහැර කිරීම් පිළිබඳ වාර්තාවේ සඳහන් උදාහරණ කිහිපයක් පහතින් සටහන් කර ඇත.

> *2012 දී කොළඹට නුදුරින් වෙරළ තීරයක දී සිය යතුරුපැදිය වෙත ආපසු යමින් සිටි සමරිසි කාන්තාවක් පොලිසිය විසින් අයාලේ යන චෝදනාව මත අත්අඩංගුවට ගන්නා ලදි. ඇයගේ පිරිමි පෙනුම සහ ඇය කලිසමක් ඇඳ සිටීම පිළිබඳව පොලිසිය අදහස් දැක්වූ අතර යතුරුපැදියක් පැදවීමට ඇය ගත් තීරණය සම්බන්ධයෙන් දැඩි ලෙස ප්‍රශ්න කරන ලදී. පොලිසිය ඇයව පැය පහකට ආසන්න කාලයක් රඳවා තබාගෙන නිදහස් කළේය.*
>
> *ආරක්ෂිත ලිංගික ක්‍රියා පිළිබඳ නිබන්ධනයක් සඳහා පිරිමින් කිහිපදෙනෙකු හා සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවක් සමඟ සම්මුඛ සාකච්ඡාවක් පවත්වමින් සිටි ගාල්ල ප්‍රදේශයේ සිසුවෙකු හට සිවිල් ඇඳුමින් සැරසුණු පොලිස් නිලධාරීන් විසින් පහර දෙන ලදී. ඔහු සාකච්ඡාව පවත්වමින් සිටි පිරිමින් අත්අඩංගුවට ගෙන පහර දී ඇති අතර, සංක්‍රාන්ති සමාජභාවී කාන්තාව පොලිස් නිලධාරීන් තිදෙනෙකු විසින් ඇගේ ගුද මාර්ගයට ලී පොල්ලක් ඇතුල් කර ලිංගිකව අපයෝජනයට ලක් කරන ලදී. සමරිසිභාවය ප්‍රවර්ධනය කරන බවට පොලිසිය සිසුවාට චෝදනා කර, කම්මුල් පහරක් එල්ල කර සිර මැදිරියකට දමන ලදී.*
>
> *2006 වසරේ සමරිසි පුද්ගලයන් දෙදෙනෙක්ව කොළඹ පොදු විවේකාගාරයකදී පොලිසිය විසින් අත්අඩංගුවට ගන්නා ලදි. පොලිස් නිලධාරීන් විසින් අපහාසාත්මක පාරිභාෂික වචන භාවිතා කරමින් සමරිසි පුද්ගලයින්ට අත්අඩංගුවට ගැනීමට හේතුව පැහැදිලි කළ අතර පිරිමින් දෙදෙනා විවේකාගාරය තුළ ලිංගිකව හැසිරුණු බවට චෝදනා කළහ. පසුව පොලිසිය ඔවුන් දෙදෙනාව වෙනත් ස්ථානයකට රැගෙන ගොස් ඇති අතර එහිදී ඔවුන් මුදා හැරීම සඳහා පොලිසිය අල්ලස් ඉල්ලා ඇත.*

සමරිසි/ද්විරිසි පිරිමින් සහ සංක්‍රාන්ති සමාජභාවී කාන්තාවන් උපත්පාලන කොපු රැගෙන යාමට මැලිවන හේතු ලෙස පෙන්වා දී ඇත්තේ, පොලිසියට ඔවුන්ව හසු වූ පසු ලිංගික වෘත්තිකයන් ලෙස චෝදනා කර ඔවුන්ව අත්අඩංගුවට ගැනීම පිළිබඳ ඇති බිය බව HIV නිවාරණය වෙනුවෙන් කටයුතු කරන්නන් වාර්තා කර ඇත. බොහෝ පිරිමින් පුද්ගලික අවකාශයන් නොමැතිකම හේතුවෙන් පොදු හෝ අර්ධ පොදු ස්ථානවල ලිංගිකව එක්වීමට යොමු වෙති. පොලිසියට හසු වේ යැයි ඇති බිය නිසා ඔවුන් ඉක්මන් හා අනාරක්ෂිත ලිංගික හැසිරීම් වලට යොමු වීම් වල අවදානමක් ඇත.

LGBTI පුද්ගලයන්ට එරෙහිව සිදුවන පොලිස් ම්ලේච්ඡත්වය සහ ප්‍රචණ්ඩත්වය පිළිබඳ සිදුවීම් විශාල සංඛ්‍යාවක් වාර්තා වී ඇති අතර, බිය හා අනාරක්ෂිත හැඟීම් හේතුවෙන් බොහෝ වින්දිතයින් ඒ පිළිබඳව වාර්තා කරන්නේ නැත.

ඒ අතරම, LGBTI පුද්ගලයන් ශ්‍රී ලංකාව තුළ ශාරීරික හා ලිංගික හිංසනයට ලක් වේ. මානව හිමිකම් කමිටුව වෙත 2014 ඉදිරිපත් කල shadow report මගින් EQUAL GROUND ආයතනය , විවිධ SOGIESC ඇති පුද්ගලයින් වෙත එල්ල කරන ලද විවිධ ප්‍රචණ්ඩත්වයන් විස්තර කර ඇත.

> *2013 ජූලි සහ ඔක්තෝබර් අතර මාස හතරක කාලය තුළ, EQUAL GROUND හි ක්ෂේත්‍ර නිලධාරීන් හට තමන්ගේ සමාජභාවී අනන්‍යතාවයේ ප්‍රතිඵලයක් ලෙස මරණ තර්ජනවලට ලක් වූ සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයන් තිදෙනෙකු හමුව ඇත. මීට අමතරව, 2011 දී සිදු කළ අධ්‍යයනයක ප්‍රතිඵලවලින් පෙනී යන්නේ ප්‍රතිචාර දැක්වූ LGBT ප්‍රජාවගෙන් ආසන්න වශයෙන් 37% ක් පමණ ශාරීරික අපයෝජන, තර්ජන, පහරදීම්, හිරිහැර, ස්ත්‍රී දූෂණ වලට ගොදුරු වූ බවයි, ඔවුන්ගෙන් බහුතරයක් පසුගිය වසර දෙක තුළ එක් වරකට වඩා එවැනි අපයෝජනයන් අත්විඳ ඇත. කායික අපයෝජනයට ලක් වූ ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 50%ක් ප්‍රකාශ කළේ එය ඔවුන්ගේ සමාජභාවය හෝ සමාජභාවී ප්‍රකාශනය නිසා සිදුවූවක් බවත්, ශාරීරික හිංසනයට ලක් වූ ප්‍රතිචාර දැක්වූවන්ගෙන් තවත් 41%ක් ඔවුන්ගේ ලිංගික දිශානතිය සහ සමාජ භාවය යන දෙකම නිසා සිදු වූ බවත් ය.*
>
> *LGBT ප්‍රජාව ඔවුන්ව දූෂණය කිරීම, පහරදීම, පැහැරගෙන යාම හෝ මරණීය තර්ජන එල්ල කිරීම් පිළිබඳ වාර්තාවන් EQUAL GROUND වෙත ලබා දී ඇත. නිදසුනක් වශයෙන්, පසුගිය වසර තුළ, 19 හැවිරිදි සංක්‍රාන්ති සමාජභාවීය කාන්තාවක්, එක් සැන්දෑවක නිවසට බයිසිකලයක යමින් සිටියදී, පිරිමියෙකු ඇයව නවතා වනාන්තර ප්‍රදේශයකට ඇදගෙන ගොස් දූෂණය කළ බව වාර්තා කළාය.*
>
> *වයස අවුරුදු 16 දී ඔහුව තම පාසලේ නාන කාමරයකට ගෙන ගොස් ජ්‍යෙෂ්ඨ සිසුන් දෙදෙනෙකු විසින් දූෂණය කර ඇති බව ද්විරිසි පිරිමියෙකු වාර්තා කළේය.*
>
> *තවත් වාර්තාවක, සංක්‍රාන්ති සමාජභාවී පුද්ගලයෙකු වාර්තා කළේ ඔහු සහ ඔහුගේ පෙම්වතා හාර්ඩ්වෙයාර් වෙළඳසැලක් ඉදිරිපිට සිටගෙන සිටියදී තමාට පහර දුන් බවයි. සංක්‍රාන්ති සමාංජභාවී පුද්ගලයාගේ ඇසට පහරක් වැදී ඔහුගේ ඇසට රුධිරය ගලා ගොස් හානි වී ඇත. එම යුවළ ඉන් බේරී ත්‍රිරෝද රථ කුලී රථයකට ගොඩව එතැනින් ඉවත්ව යනවිට යතුරුපැදිවලින් පැමිණි දෙදෙනකු ඔවුන් නවාතැන්ගෙන සිටි නිවසට යනතුරුම ඔවුන් පසුපසින් පැමිණ ඇත.*
>
> *2008 දී නැගෙනහිර ශ්‍රී ලංකාවේ සමරිසි මුස්ලිම් පිරිමි දෙදෙනෙක් වාර්තා කළේ ඔවුන්ගේ ලිංගික දිශානතිය නිසා ඔවුන් පැහැරගෙන ගොස් වධ හිංසා පමුණුවා ඔවුන්ගේ ජීවිතවලට මරණ තර්ජනය (Fatwa) එල්ල කළ බවයි. මීට අමතරව, 2008 දී ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ තවත් මුස්ලිම් තරුණයෙකුට ඔහුගේ ලිංගික දිශානතිය හේතුවෙන් ප්‍රහාරයක් එල්ල වූ අතර ඔහුට ඔහුගේ නිවසින් පලා යාමට සිදු විය.*

කාන්තා සහ මාධ්‍ය සාමූහිකය විසින් CEDAW කමිටුව වෙත 2017 ඉදිරිපත් කල Shadow Report මගින් LGBTI පුද්ගලයින්ට එරෙහිව ක්‍රියාත්මක වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ සිදුවීම් සඳහන් කරයි.

> *කාන්තාවන්ට උපකාර කරන කණ්ඩායමක් විසින් සිදු කරන ලද අධ්‍යයනයකින් හෙළි වූයේ සම්මුඛ පරීක්ෂණයට ලක් වූ LBT පුද්ගලයන් 33 දෙනාගෙන් අඩකට වඩා වැඩි ප්‍රමාණයක් ශාරීරික හා ලිංගික හිංසනයට මුහුණ දී ඇති අතර ඔවුන්ගෙන් 12 දෙනෙක් ඔවුන් මුහුණ දෙමින් පවතින ශාරීරික හිංසනය ගැන කතා කළ බවයි. ආසන්නතම පවුලේ සාමාජිකයන්, ආගන්තුකයන්, සම වයස්කරුවන්, සහකරුවන්, හිටපු සහකරුවන්, සේවා යෝජකයන්, අධීක්ෂකවරුන්, සම-සේවකයින් සහ අසල්වාසීන් යන අය මෙම අපරාධකරුවන් ගණයට ඇතුළත් වේ. අධ්‍යයනය සඳහා සම්මුඛ සාකච්ඡාවකට එක් වූ 39 හැවිරිදි සමරිසි කාන්ත්වාක් වූ රොෂ්මි වාර්තා කළේ, "ඇගේ සහකරුගේ පවුලේ අය බලහත්කාරයෙන් ඇයව සුව කිරීමට පෙති සහ බෙහෙත් දීමට උත්සාහ කළ අතර ඔවුන් ඇයව විෂමරිසි පුද්ගලයෙකු බවට පත් කිරීමට දැඩි උත්සාහයක් ගත් බවයි. තවත් සම්මුඛ සාකච්ඡාවකට සහභාගි වූ, සිය දෙමාපියන් සමග ජීවත් වන 36 හැවිරිදි කාන්තාවක් වන චමිලා පැවසුවේ ඇගේ මව "ඇගේ සමාජභාවය නොගැළපීම නිසා සහ ඇගේ සමරිසිභාවය සුව කිරීමට උත්සාහ කිරීමට සහ සුව කිරීමට මානසික සෞඛ්‍ය පිළිබඳ වෘත්තිකයෙකු වෙත ඇයව ගෙන ගිය බවයි.*
>
> *මෙම අධ්‍යයනයේ LBT සමාජභාවී ප්‍රතිචාර දැක්වූවන් 33 දෙනාම යම් ආකාරයක චිත්තවේගීය ප්‍රචණ්ඩත්වයකට මුහුණ දී ඇත. එයට සමාජභාවය පිළිබඳ සම්මතයන් බලාත්මක කිරීම, සමාජගත වීම සීමා කිරීම්, ශාරීරික හා චිත්තවේගීය නොසලකා හැරීම, පවුල්වලින් කොන් කිරීම සහ (විෂමරිසි) විවාහයට ඇතුළු වීමට බලකරමින් එල්ල කරන නිරන්තර පීඩනය ඇතුලත් වේ.*
>
> *මල්ලිකා නම් වූ වයස අවුරුදු 40 වන සමරිසි කාන්තාවක් මෙසේ පැවසුවාය: "මම හිතන්නේ මට ලොකුම වෙනස්කම් කළේ මගේ පවුලෙන්. චිත්තවේගීව සහ වාචිකව ඔවුන් මට (විරුද්ධව) වෙනස්කම් කර ඇත - මම සමරිසියෙකු බව ඔවුන් ප්‍රතික්ෂේප කිරීම සහ මම පිරිමියෙකු සමග සිටීම හැර වෙනත් කිසිවක් හරි යැයි පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීම... ඔවුන් මගේ සමාජභාවය සැඟවීමට දරන උපරිම උත්සහය සහ එය*

*පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීම.... එබැවින් ගැටළු ඇති වන්නේ ඔවුන්ගෙන් වන අතර ඒවා තවමත් ගැටලු ආකාරයෙන් ම පවතී.*

*සමරිසි සහකරුවන් අතර ලිංගික හැසිරීම අපරාධයක් ලෙස සැලකීම සහ පොලිසිය විසින් වෙනස් කොට සැලකීම හේතුවෙන්, ප්‍රචණ්ඩත්වයට මුහුණ දෙන LGBTIQ පුද්ගලයන් යුක්තිය පතා පොලිසියට නොයති. හියුමන් රයිට්ස් වොච් හි 2016 වාර්තාවක් මෙම සිදුවීම සම්බන්ධයෙන් අවධානය යොමු කරයි.*

*2007 වසරේ අගභාගයේ දී 31 හැවිරිදි සමරිසි කාන්තාවක් වන නිතුවා හට ඇගේ පෙම්වතියගේ පියා විසින් දිගින් දිගටම හිරිහැර හා මරණ තර්ජන එල්ල කළ නමුත් ඇය පොලිසියට ගියේ නැත. "නීතිය පිළිබඳව නොවේ නම්, මම යමක් කියන්නම්," ඇය පැවසුවාය. "මම මේ රටේ අපරාධකාරයෙක්. නීති අසමාන සහ අසාධාරණ වන විට යමක් කියමින් කාලය නාස්ති කිරීමේ තේරුම කුමක්ද? මට නීති විරෝධී වීමට අවශ්‍ය නැත. "*

**තවදුරටත් කියවීම**


- Joshua Arteta Gonzalez" ශ්‍රී ලංකාවේ කොළඹ LGBTQ ව්‍යාපාරයේ දේශපාලනය පිළිබඳ පශ්චාත් යටත් විජිත විශ්ලේෂණය, 2019.

  https://lup.lub.lu.se/luur/download?func=downloadFile&recordOId=8975740&fileOId=8979999

- මානව හිමිකම් කමිටුවේ (2014) 110 වැනි සැසිවාරයට ඉදිරිපත් කළ EQUAL GROUND " Shadow Report
  https://lup.lub.lu.se/luur/download?func=downloadFile&recordOId=8975740&fileOId=8979999

- ශ්‍රී ලංකාවේ සමරිසි සහ ද්වීලිංගික කාන්තාවන්ට එරෙහිව සමාන පදනමක්, මානව හිමිකම් උල්ලංඝනය කිරීම: කාන්තාවන්ට එරෙහි වෙනස් කොට සැලකීම තුරන් කිරීම පිළිබඳ කමිටුවට සෙවනැලි වාර්තාවක් (2016). ලබා ගත හැක

  https://tbinternet.ohchr.org/Treaties/CEDAW/Shared%20Documents/LKA/INT_CEDAW_NGO_LKA_24294_E.pdf

- හියුමන් රයිට්ස් වොච්, "අතේ සියලු ඇඟිලි පහම එක හා සමාන නොවේ" ශ්‍රී ලංකාවේ සමාජභාවය සහ ලිංගික දිශානතිය පදනම් කරගෙන වෙනස් කොට කිරීම (2016).

  https://www.hrw.org/sites/default/files/report_pdf/srilanka0816web.pdf

- කාන්තා සහ මාධ්‍ය සාමූහිකය, ශ්‍රී ලංකාවේ සමරිසියන්, ද්වීලිංගික කාන්තාවන් සහ සංක්‍රාන්ති ලිංගික පුද්ගලයන් වෙනස් කොට සැලකීම: කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් තුරන් කිරීම සඳහා වූ කමිටුවේ (CEDAW) (2017) 66 වැනි සැසිවාරයට සෙවනැලි වාර්තාව ඉදිරිපත් කරන ලදී.

  https://tbinternet.ohchr.org/Treaties/CEDAW/Shared%20Documents/LKA/INT_CEDAW_NGO_LKA_26252_E.pdf

- Kaleidoscope Human Rights Foundation & Equal Ground" ශ්‍රී ලංකාවේ LBTI පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් කාන්තාවන්ට එරෙහි වෙනස්කම් කිරීම් තුරන් කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ කමිටුවට සමගාමී වාර්තාව (2017).

  https://www.ecoi.net/en/file/local/1393616/1930_1487246228_int-cedaw-ngo-lka-26326-e.pdf

# සැසිය 09 විවිධ SOGIESC ඇති පුද්ගලයින්ගේ අයිතිවාසිකම් සම්බන්ධ ජාත්‍යන්තර වර්ධකයන්

විනාඩි 15ක ප්‍රශ්න හා උත්තර සැසියකින් පසුව PPT Slides ආධාරයෙන් දේශනය

**කාලය**

විනාඩි 45 යි

**ඉලක්ක කණ්ඩායම**

සියලුම කණ්ඩායම්

කණ්ඩායමකට සහභාගිවන්නන් 30 ක්

**අරමුණු**

මෙම සැසිය අවසානයේ, සහභාගිවන්නන්ට

- විවිධ SOGIESC සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ ලෝකය තුල ලබා ගෙන ඇති කැපී පෙනෙන ජයග්‍රහණ ලැයිස්තුගත කිරීමට
- LGBTIQ පුද්ගලයන්ගේ මානව හිමිකම්වලට අදාළ ප්‍රධාන ජාත්‍යන්තර මානව හිමිකම් උපකරණ සහ යාන්ත්‍රණ හඳුනා ගැනීමට

හැකියාව ලැබෙනු ඇත.

**සූදානම් වීම**

Slides

**පියවර**

මෙම අවසාන සැසියේදී ඔබ විවිධ SOGIESC ඇති පුද්ගලයින්ගේ අයිතිවාසිකම් සම්බන්ධ ජාත්‍යන්තර වර්ධනයන් දෙස බලන බව පැහැදිලි කරන්න.

- විනාඩි 20-30 අතර කාලයක් slides ආධාරයෙන් දේශනය පවත්වන්න. දේශනයට සහාය වීමට අදාල slides සහ සටහන් පහත දක්වා ඇත.
- මෙය දවසේ අවසාන සැසිය බව සලකමින්, මෙම සැසියේ හෝ පෙර සැසිවල ප්‍රශ්න සහ පිළිතුරු සඳහා අවසානයේ අවම වශයෙන් විනාඩි 15ක් වෙන් කරන්න. ප්‍රශ්න නොමැති නම්, අද දින ඉගෙන ගත් වඩාත්ම සිත්ගන්නා හෝ අමතක නොවන දේ බෙදා ගැනීමට ඔබට සහභාගිවන්නන්ගෙන් ඉල්ලා සිටිය හැක.

**සටහන්**

ආසියාවේ බොහෝ රටවල, විවිධ SOGIESC ඇති පුද්ගලයින්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් අස්ථාවර නීතිමය සහ සමාජ-දේශපාලන පරිසරයක් පවතී. LGBTI පුද්ගලයන් අපකීර්තියට, වෙනස් කොට සැලකීමට සහ ප්‍රචණ්ඩත්වයට මුහුණ දෙයි. විවිධ SOGIESC පිළිබඳ මිථ්‍යාවන් සහ වැරදි වැටහීම් පුළුල්ව පැතිර ඇත. නමුත් ලෝකය කෙමෙන් වෙනස් වෙමින් පවතී. වැඩි වැඩියෙන් රටවල් සහ ජාත්‍යන්තර සංවිධාන LGBTIQ පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිගනිමින් සිටී. පහත සටහන් විවිධ SOGIESC සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ කැපී පෙනෙන ගෝලීය ජයග්‍රහණ කිහිපයක් සාකච්ඡා කරයි.

සමහර ජයග්‍රහණ මානසික සෞඛ්‍ය අභියෝගවලින් විවිධ ලිංගික දිශානතිය සහ සමාජභාවය වෙන්කර හඳුනා ගැනීමට අදාළ වේ.

1973 දී ඇමරිකානු මනෝචිකිත්සක සංගමය (APA) සමරිසිභාවය මානසික රෝගයක් නොවන බව වර්ගීකරණය කළේය. මෙය සිදු කරනු ලැබුවේ එහි රෝග විනිශ්චය සහ සංඛ්‍යානමය අත්පොතෙහි (DSM) දෙවන සංස්කරණයෙන් "සමරිසිභාවය" පිළිබඳ රෝග විනිශ්චය ඉවත් කිරීමෙනි.

> 1992 දී ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) සමරිසිභාවය මානසික රෝගයක් ලෙස වර්ගීකරණය කළේය. declassified homosexuality as a mental illness.
>
> වඩාත් මෑතක දී, 2019 දී, ලෝක සෞඛ්‍ය සංවිධානය සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයෙකු වීම ව්‍යාධියක් නොවන බව දැක්වීය. රෝග පිළිබඳ ජාත්‍යන්තර වර්ගීකරණයේ (ICD-11) 11 වැනි සංශෝධනයෙහි ස්ත්‍රී පුරුෂ භාවය (සමාජභාවය) නොගැලපීම අර්ථ දක්වා ඇත්තේ පුද්ගලයෙකුගේ පළපුරුදු සමාජභාවය සහ පවරා ඇති ලිංගිකත්වය අතර කැපී පෙනෙන සහ නොනැසී පවතින නොගැලපීමක් ලෙසයි. පෙර අනුවාදයේ (ICD-10), මෙය මානසික සහ චර්යාත්මක ආබාධ යන පරිච්ඡේදයේ සමාජභාවී අනන්‍යතා ආබාධයක්' ලෙස සැලකේ.

මේ අතර ජාත්‍යන්තර මානව හිමිකම් රාමුව ද කැපී පෙනෙන ප්‍රගතියක් ලබා ඇත.

මානව හිමිකම් පිළිබඳ විශ්ව සමාජභාවී ප්‍රකාශනය (1948) එහි පූර්විකාවේ සඳහන් කර ඇත්තේ ලෝකයේ නිදහස, යුක්තිය සහ සාමයේ පදනම ලෙස මානව පවුලේ සියලුම සාමාජිකයින්ගේ නෛසර්ගික අභිමානය සහ සමාන සහ අත්‍යවශ්‍ය අයිතිවාසිකම් පිළිගැනීම් ය.

1976 දී බලාත්මක වූ සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR), වධහිංසාවලින් නිදහස් වීමට ඇති අයිතිය, පෞද්ගලිකත්වයට ඇති අයිතිය, නිදහසට ඇති අයිතිය සහ නීතිය ඉදිරියේ සමාන වීමට ඇති අයිතිය ඇතුළු සියලු මිනිසුන්ගේ මානව හිමිකම් පිළිගත්තේය. සම්මුතියට එකඟ වූ රාජ්‍යයන් සම්මුතියට ගරු කරන්නේ කෙසේද යන්න නිරීක්ෂණය කිරීම සඳහා සම්මුතිය මගින් මානව හිමිකම් කමිටුව පිහිටුවන ලදී. 1992 දී මානව හිමිකම් කමිටුව ටූනන් එදිරිව ඕස්ට්‍රේලියාවේ නඩුව විභාග කළේය. කමිටුව ප්‍රකාශ කළේ ඕස්ට්‍රේලියානු රජය ටස්මේනියාවේ (ඕස්ට්‍රේලියාවේ දූපත් ප්‍රාන්තයක්) සමරිසිභාවය අපරාධකරණය කිරීම ICCPR උල්ලංඝනය කිරීමක් බවයි. මෙම තීරණයෙන් පසුව, ඕස්ට්‍රේලියානු රජය ටස්මේනියාවේ සමරිසිභාවය සාපරාධී නොවන නීතියක් ලෙස සම්මත කළේය.

1976 දී බලාත්මක වූ ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICESCR), වැඩ කිරීමට ඇති අයිතිය, ප්‍රමාණවත් ජීවන තත්ත්වයකට ඇති අයිතිය, ශාරීරික හා මානසික සෞඛ්‍යයේ ඉහළම ප්‍රමිතිය භුක්ති විඳීමේ අයිතිය, අධ්‍යාපනය සඳහා ඇති අයිතිය, සහ මානව හිමිකම් ලෙස අනෙකුත් සංස්කෘතික අයිතිවාසිකම් භුක්ති විඳීමේ අයිතිය යනා දී අයිතීන් හඳුනා ගන්නා ලදී. සම්මුතිය අනුමත කර ඇති රාජ්‍යයන් සම්මුතියට ගරු කරන්නේ කෙසේද යන්න නිරීක්ෂණය කිරීම සඳහා සම්මුතිය මගින් ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ කමිටුවක් පිහිටුවන ලදී. 1992 දී මානව හිමිකම් කමිටුව ටූනන් එදිරිව ඕස්ට්‍රේලියාව නඩුව විභාග කළේය. කමිටුව ප්‍රකාශ කළේ ඕස්ට්‍රෙලියානු රජය ටස්මේනියාවේ (ඕස්ට්‍රේලියාවේ දූපත් ප්‍රාන්තයක්) සමරිසිභාවය අපරාධකරණය කිරීම ICCPR උල්ලංඝනය කිරීමක් බවයි. මෙම තීරණයෙන් පසුව, ඕස්ට්‍රේලියානු රජය ටස්මේනියාවේ සමරිසිභාවය නිර්අපරාධීකරණය කළේය.

1976 දී බලාත්මක වූ ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICESCR), වැඩ කිරීමට ඇති අයිතිය, ප්‍රමාණවත් ජීවන තත්ත්වයකට ඇති අයිතිය, ශාරීරික හා මානසික සෞඛ්‍යයේ ඉහළම ප්‍රමිතිය භුක්ති විඳීමේ අයිතිය, අධ්‍යාපනය සඳහා ඇති අයිතිය, සහ මානව හිමිකම් ලෙස අනෙකුත් සංස්කෘතික අයිතිවාසිකම් භුක්ති විඳීමේ අයිතිය යනා දී අයිතීන් හඳුනා ගන්නා ලදී. සම්මුතිය අනුමත කර ඇති රාජ්‍යයන් සම්මුතියට ගරු කරන්නේ කෙසේද යන්න නිරීක්ෂණය කිරීම සඳහා සම්මුතිය මගින් ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ කමිටුවක් පිහිටුවන ලදී. 2019 දී, කමිටුව විසින් කැමරූන්, එස්තෝනියාව, කසකස්තානය සහ මොරිෂස් රාජ්‍යන්ට LGBTIQ පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිගැනීම හා සමරිසි සේවනය සාපරාධී බවින් ඉවත් කිරීම පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කළේය.

ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුව (CRC); වධහිංසාවට එරෙහි කමිටුව (CAT); සහ කාන්තාවන්ට එරෙහිව වෙනස් කොට සැලකීම තුරන් කිරීම පිළිබඳ කමිටුව (CEDAW) ඔවුන්ට පිළිවෙලින් අධීක්ෂණය කිරීමට පැවරී ඇති ගිවිසුම ක්‍රියාත්මක කිරීමේදී සහ අර්ථ නිරූපණය කිරීමේදී ලිංගික දිශානතිය සහ සමාජභාවය මත පදනම් වූ තහනම් හේතු පැහැදිලිවම ඇතුළත් කර ඇත.

2013 දී 'ලිංගික දිශානතිය', 'සමාජභාවීය අනන්‍යතාවය' සහ 'සමාජභාවී ප්‍රකාශනය' යන සංකල්ප මුලුමනින්ම නීත්‍යානුකූලව බැඳී ඇති මෙවලමක් වන සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් සහ නොඉවසීමට එරෙහි අන්තර්-ඇමරිකානු සම්මුතිය තුළ පළමු වරට ඇතුළත් කරන ලදී.

2011 දී අප විසින් මානව හිමිකම් කවුන්සිලයේ පළමු SOGI යෝජනාව ගෙන එන ලදි. 2014 සහ 2016 දී මානව හිමිකම් කවුන්සිලයේ අඛණ්ඩ යෝජනා දෙකක් අනුගමනය කරන ලදී. දෙවැන්න ලිංගික දිශානතිය සහ සමාජභාවය පදනම් කරගෙන ප්‍රචණ්ඩත්වයට සහ වෙනස් කොට සැලකීමට එරෙහිව ආරක්ෂාව පිළිබඳ කාරණා සම්බන්ධයෙන් ස්වාධීන විශේෂඥයෙකුගේ අවශ්‍යතාව ඇති කරන ලදී.

**යෝග්‍යකාර්ටා මූලධර්ම**

| | |
|---|---|
| PRINCIPLE 1 | The Right to the Universal Enjoyment of Human Rights |
| PRINCIPLE 2 | The Rights to Equality and Non-Discrimination |
| PRINCIPLE 3 | The Right to Recognition before the Law |
| PRINCIPLE 4 | The Right to Life |
| PRINCIPLE 5 | The Right to Security of the Person |
| PRINCIPLE 6 | The Right to Privacy |
| PRINCIPLE 7 | The Right to Freedom from Arbitrary Deprivation of Liberty |
| PRINCIPLE 8 | The Right to a Fair Trial |
| PRINCIPLE 9 | The Right to Treatment with Humanity while in Detention |
| PRINCIPLE 10 | The Right to Freedom from Torture and Cruel, Inhuman or Degrading Treatment or Punishment |
| PRINCIPLE 11 | The Right to Protection from all Forms of Exploitation, Sale and Trafficking of Human Beings |
| PRINCIPLE 12 | The Right to Work |
| PRINCIPLE 13 | The Right to Social Security and to Other Social Protection Measures |
| PRINCIPLE 14 | The Right to an Adequate Standard of Living |
| PRINCIPLE 15 | The Right to Adequate Housing |
| PRINCIPLE 16 | The Right to Education |
| PRINCIPLE 17 | The Right to the Highest Attainable Standard of Health |
| PRINCIPLE 18 | Protection from Medical Abuses |
| PRINCIPLE 19 | The Right to Freedom of Opinion and Expression |
| PRINCIPLE 20 | The Right to Freedom of Peaceful Assembly and Association |
| PRINCIPLE 21 | The Right to Freedom of Thought, Conscience and Religion |
| PRINCIPLE 22 | The Right to Freedom of Movement |
| PRINCIPLE 23 | The Right to Seek Asylum |
| PRINCIPLE 24 | The Right to Found a Family |
| PRINCIPLE 25 | The Right to Participate in Public Life |
| PRINCIPLE 26 | The Right to Participate in Cultural Life |
| PRINCIPLE 27 | The Right to Promote Human Rights |
| PRINCIPLE 28 | The Right to Effective Remedies and Redress |
| PRINCIPLE 29 | Accountability |
| PRINCIPLE 30 | The Right to State Protection |
| PRINCIPLE 31 | The Right to Legal Recognition |
| PRINCIPLE 32 | The Right to Bodily and Mental Integrity |
| PRINCIPLE 33 | The Right to Freedom from Criminalisation and Sanction on the Basis of Sexual Orientation, Gender Identity, Gender Expression or Sex Characteristics |
| PRINCIPLE 34 | The Right to Protection from Poverty |
| PRINCIPLE 35 | The Right to Sanitation |
| PRINCIPLE 36 | The Right to the Enjoyment of Human Rights in Relation to Information and Communication Technologies |
| PRINCIPLE 37 | The Right to Truth |
| PRINCIPLE 38 | The Right to Practise, Protect, Preserve and Revive Cultural Diversity |

2006 දී, බණ්ඩනය වූ ජාත්‍යන්තර රාමුවක් සහ මනා සංවිධානයෙන් සිදුවන අපයෝජන රටාවක් පැවති වාතාවරණයක, කීර්තිමත් මානව හිමිකම් විශේෂඥයින් ගණනාවක් ඉන්දුනීසියාවේ යෝග්‍යාකර්තාහිදී හමුවිය. මෙම ප්‍රවීණයන් ජාත්‍යන්තර මානව හිමිකම් නීතියේ අර්ථ නිරූපණය මත ගොඩනැගුණු මූලධර්ම 29ක් එක ලේඛනයකට ඒකාබද්ධ කළේ එය විවිධ ලිංගික දිශානති සහ ලිංග අනන්‍යතා ඇති පුද්ගලයන්ට අදාළ වන බැවිනි. මෙම ලේඛනය යෝග්‍යකර්තා මූලධර්ම ලෙස හැඳින්වේ.

2017 දී, YP+10' ලෙස හැඳින්වෙන අතිරේක මූලධර්මද, මෙම මූලධර්මවලට ඇතුළත් විය. මෙම මූලධර්ම ලිංගික දිශානතිය, සමාජභාවය, සමාජභාවී ප්‍රකාශනය හෝ ලිංගික ලක්ෂණ පදනම් කරගෙන අපරාධකරණයට ලක් නොවීමේ නිදහස, අයිතිය සහ අවසරය පිළිගණී 'යෝග්‍යකර්තා මූලධර්ම ගිවිසුමක් මෙන් ප්‍රාන්තවලට නීත්‍යානුකූලව බැඳී නැත. මේ නිසා එය මෘදු නීති උපකරණයක් ලෙස හැඳින්වේ. නමුත් ඔවුන් LGBTIQ පුද්ගලයින් සඳහා

සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීම සඳහා පිළිගත යුතු සහ ආරක්ෂා කිරීමට අවශ්‍ය මානව හිමිකම් පිළිබඳ සවිස්තරාත්මක ප්‍රකාශයක් සපයයි.

යෝග්‍යකර්තා මූලධර්ම ජාත්‍යන්තර සහ කලාපීය මට්ටමින් මෙන්ම ජාතික අධිකරණවල, විශේෂයෙන් ආසියාවේ භාවිතයට ගෙන ඇත. ඉන්දියානු සහ නේපාල වැදගත් අධිකරණ තීරණ වලට (Naz Foundation vs' NTC of Delhi" and Pant vs' Nepal& 'ලිංගික අනන්‍යතාවය' යන යෙදුම ජාත්‍යන්තර නීතියට ඒකාබද්ධ කිරීම තහවුරු කිරීම සහ මානව හිමිකම් භාෂාවක් ලෙස යොදා ගැනීම යෝග්‍යකර්තා මූලධර්මවල විශිෂ්ටතම සාර්ථකත්වය කුමක් විය හැකිද යන්න ඉස්මතු කර ඇතඃ

## අනෙකුත් සමාන නීති උපකරණවලට පහත දෑ ඇතුළත් වේඃ

### 1996 මොන්ට්‍රියල් සමාජභාවී ප්‍රකාශනය

සමරිසි, ද්වීලිංගික සහ සංක්‍රාන්ති ලිංගික මානව හිමිකම් පිළිබඳ මොන්ට්‍රියෙල් ප්‍රකාශය යනු LGBT මානව හිමිකම් පිළිබඳ ජාත්‍යන්තර සමුළුව විසින් 2006 දී මොන්ට්‍රියල් හි සම්මත කරන ලද ලේඛනයකි. විශ්වීය වශයෙන් සහතික කළ යුතු අයිතිවාසිකම් ගණනාවක් පිළිබඳ මෙම ප්‍රකාශනය යෝජනා කරයි.

### 2013 මෝල්ටා ප්‍රකාශය

මෙම ප්‍රකාශය මෝල්ටාවේ පැවති තුන්වන ජාත්‍යන්තර අන්තර් ලිංගික සංසදයේදී සියලුම මහාද්වීපවලින් අන්තර් ලිංගික සංවිධාන 30ක් නියෝජනය කරමින් මානව හිමිකම් ආරක්ෂකයින් 34 දෙනෙකු විසින් සම්මත කරන ලදී. මෙම ප්‍රකාශය මඟින් අන්තර්ලිංගික පුද්ගලයින් සඳහා බලහත්කාරයෙන් සිදුකරන ශල්‍යකර්ම ක්‍රියා පටිපාටීන්, උපතේදීම මරා දැමීම සහ අන්තර් ලිංගික පුද්ගලයින් ඝාතනය කිරීම සහ අන්තර්ලිංගික පුද්ගලයින් බලහත්කාරයෙන් වන්ධ්‍යාකරණය කිරීම යනාදිය අවසන් කිරීමට ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඉල්ලා සිටියේ ය.

## ABBREVIATIONS

| | |
|---|---|
| SOGIESC | Sexual orientations, gender identities and expressions, and sex characteristics |
| WHO | World Health Organization |
| IDAHOT | International Day Against Homophobia and Transphobia |
| COJ | Companions on a Journey |
| WSG | Women's Support Group |
| LBT | Lesbian, Bisexual and Transgender |
| EG | Equal Ground |
| MSM | Men who have Sex with Men |
| LGBT | Lesbian, Gay, Bisexual and Transsexual |
| HRCSL | Human Rights Commission of Sri Lanka |
| CSE | Comprehensive Sexuality Education |
| GRC | Gender Recognition Certificate |
| CESCR | Committee on Economic, Social, and Cultural Rights |
| CEDAW | Committee on the Elimination of All Forms of Discrimination Against Women |
| MP | Members of Parliament |
| NTN | The National Transgender Network |
| YOH | Young Out Here |
| CWDF | Community Welfare Development Fund |
| ICD | International Classification of Diseases |
| ICCPR | International Covenant on Civil and Political Rights |
| ICESCR | International Covenant on Economic, Social and Cultural Rights |
| CAT | Committee Against Torture |
| CRC | Committee on the Rights of the Child |
| CEDAW | Committee on the Elimination of Discrimination against Women |

BRIDGE to Equality යනු ශ්‍රී ලංකාවේ LGBTQ ප්‍රජාවන්ගේ මානව හිමිකම් සුරැකීම වෙනුවෙන් ක්‍රියාත්මක වන ව්‍යාපෘතියකි. ජාත්‍යන්තර මානව හිමිකම් සහ නීති පිලිබඳව විනිසුරුවරුන්, නීතීඥයින් සහ අනෙකුත් මානව හිමිකම් ක්‍රියාකාරීන් දැනුවත් කිරීම තුළින් ශ්‍රී ලංකාවේ LGBTQ පුද්ගලයින්ගේ මානව හිමිකම් සුරක්ශිත කිරීම, ශ්‍රී ලංකාවේ වත්මන් නීතිමය රාමුව විසින් පනවන ලද අභියෝග ජය ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම, මානව හිමිකම් කඩ වූ ශ්‍රී ලංකාවේ LGBTQ පුද්ගලයින් හට යුක්තිය ලබා ගැනීමට ඔවුනට අවශ්‍ය සහය ලබාදීමද අරමුණු කරගනී.

BRIDGE to Equality ව්‍යාපෘතිය 2021 වසරේ සිට DAST, National Transgender Network සහ Young Out Here ආයතන විසින් ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිෂන් සභාව සමග ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබයි.

facebook.com/BridgetoEquality
instagram.com/bridgetoequality2021
twitter.com/B2ECampaign
bridgetoequalitycampaign@protonmail.com